# මීතොටමුල්ල ප්‍රදේශයේ  කසල කන්ද කඩා වැටීම නිසා සිදු වු හානිය සොයා බැලීමේ ජනාධිපති විමර්ශන කමිටුවේ වාර්තාව

2017.10.26

ආචාර්යය චන්ද්‍රදාස නානායක්කාර
විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු
සභාපති මීතොටමුල්ල ප්‍රදේශයේ  කසල
කන්ද කඩා වැටීම නිසා සිදු වු
හානිය සොයා බැලීමේ  ජනාධිපති විමර්ශන කමිටුව

**2017 අප්‍රේල් මස 14 වන දින මීතොටමුල්ල ප්‍රදේශයේ කසල කන්ද කඩා වැටීම නිසා සිදු වූ හානිය පිළිබඳ සොයා බැලීමට ජනාධිපති කමිටුව විසින් සිදු කරන ලද පරීක්ෂණයේ පරීක්ෂණ වාර්තාව**

2017 අප්‍රේල් මස 14 දින මීතොටමුල්ල ප්‍රදේශයේ කසල කන්ද කඩා වැටීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳ ව පරීක්ෂණයක් පවත්වා වාතර්‍ාවක් ඉදිරිපත් කිරීම පිණිස ඔබතුමන් විසින් ඔබගේ අංක සී එස් ඒ/ 01/ සී ඕ අයි/03 හා 2017/04/26 දිනැති ලිපියෙන් මාගේ සහභාගීත්වයෙන් යුත් ඒක පුද්ගල කමිටුව පත් කරන ලදි.

ඒ අනුව පත් කරන ලද කමිටුව වෙත පරීක්ෂා කර වාතර්‍ා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ.

- 2017 අප්‍රේල් මස 14 දින මීතොටමුල්ල ප්‍රදේශයේ සිදු වූ කසළ කන්ද කඩා වැටීම පිළිබඳ ආපදාව, එම ස්ථානයේ කසළ එකතු කිරීමෙන් පැන නැගිය හැකි විවිධ හානිකර තත්වයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කිසියම් අදාළ රාජ්‍ය ආයතන/නියෝජිත ආයතන/රාජ්‍ය නිලධාරීන්/ පුද්ගලයින් වෙත පුවර් දැනුම් දීමක් ලැබී තිබුනේද යන වගත්,

- එසේ ලැබී තිබිණි නම් එය කවුරුන් විසින් කවුරුන් වෙත කරනු ලැබුවේද යන වගත්, එම දැනුම් දීම සම්බන්ධයෙන් අදාල අධිකාරිය/අධිකාරීන් විසින් කවර ක්‍රියා මාගර් ගන්නා ලද්දේද යන වගත්, මේ වනවිට ඒවායේ ප්‍රගතිය කෙසේද යන වගත්,

- එසේ දැනුම් දීම් තිබේ නම්, අවශ්‍ය ක්‍රියා මාගර් ගැනීමට අසමත් වීමට හේතු වූ කරුණු මොනවාද යන වගත්,

- යම් රාජ්‍ය/නියෝජිත ආයතනයක්, රාජ්‍ය නිලධාරීන්/පුද්ගලයින් මෙවැනි හානිකර හා අවදානම් තත්වයක් පිළිබඳව දැනුවත්ව තිබියදීත්, අවශ්‍ය ක්‍රියා මාගර් ගැනීමට අප්‍රමාදව ක්‍රියා නොකිරීමෙන් සිය රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමට අසමත්ව තිබේද යන වග සහ එසේ නම් ඒ කවර රාජ්‍ය ආයතනයක/නියෝජිත ආයතනයක නිලධාරින්ද /පුද්ගලයින්ද යන වගත්,

- යම් බාහිර දැනුම්දීම් වලින් තොරව වුවද, දීඝර් කාලයක් තිස්සේ එක් ස්ථානයක කසළ ගොඩගැසීම තුළින් මෙවැනි අන්දමේ ජන ජීවිතයට හානි කර තත්වයක් පැන නැගීමේ හැකියාවක් ඇති බවට ශ්‍රී ලංකාවේ අදාල විෂය සම්බන්ධ රාජ්‍ය ආයතන හා වෙනත් වගකිව යුතු අධිකාරීන් දැනුවත් වී සිටිය යුතු බවට නිගමනයකට එළඹීම යුක්ති සහගත හා සාධාරණද යන වගත්,

- මෙම කසළ මීතොටමුල්ල ප්‍රදේශයේ ගොඩ ගැසීම හැර, මෙවැනි අපදා/හානි ඇති නොවන සේ මෙම කසළ බැහැර කිරීමේ ඵලදායි විකල්ප ක්‍රියා මාගර්යන් තිබුණේද යන්නත්, එසේ තිබිණි නම් එම ක්‍රියා මාගර් අනුගමනය කිරීමට අදාළ අධිකාරීන් උත්සුක නොවීමට හේතු කාරණා කවරේද යනවගත් ; සහ,

- මේ අනුව මෙවැනි ආපදා/හානිකර තත්වයක් ඇති නොවීමටත්, ක්‍රමවත්ව කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමටත් කුමන කෙටි කාලීන හා දිගුකාලීන පියවර ගත යුතුද යන්නයි.

## මීතොටමුල්ල කසළ බැහැර කරන ලද ස්ථානය පිළිබඳ හැඳින් වීම.

නාගරික සංවර්ධන අධිකාරිය සතු භූමියක් වන අතර කසළ බැහැර කිරීමට අවසරය කොන්දේසි සහිත ව කොළඹ මහ නගර සභාව වෙත ලබා දී 2009 වෂර්ය පටන් කසළ බැහැර කිරීම කොළඹ මහ නගර සභාව විසින් සිදු කර ඇති අතර, ආරම්භයේ අක්කර 2ක වූ බැහැර කිරීම 2017 වෂර්ය වන විට අක්කර 18ක ව්‍යාප්ත ව ගොස් ඇත. මෙම ස්ථානයේ 2009 වෂර්යේ සිට පවත්වා ගෙන යාමේ දී එහි සේවා සපයන ආයතන හා අනිකුත් කායර්යන් සඳහා දරා ඇති සේවක පඩි හැර අනිකුත් වියදම් රුපියල් 1,489,607,860.84කි. එසේ ම අදාල ස්ථානයෙහි කසළ බැහැර කිරීමෙන් ආපදාවට පත්වූ පවුල් වෙත වරින් වර ගෙවා ඇති සම්පූණර් මුදල රුපියල් 606,814,020.70 සවෙර් ජෙනරාල්ගේ අංක PPCO 85/36 දරණ මූලික පිඹුර විසින් මනා ආකාරයට මෙම ප්‍රදේශය පොතුවිල් කුඹුර නමින් හඳුන්වා ඇත.

## පරීක්ෂණ ක්‍රියාවල ආරම්භය හා එහි ක්‍රියාමක වූ ස්වභාවය.

මෙම පරීක්ෂණ කමිටුව විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ අංක 101 දරණ ශාලා ප්‍රධාන කායර්ාලයේ පවත්වා ගෙන යමින් ඊට අදාළ වන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි.

පරීක්ෂණ කටයුතු ආරම්භ කරමින් පරීක්ෂණ කමිටුවේ පරමාථර් හා කමිටුව විසින් පරීක්ෂණ කරන කරුණු සම්බන්ධයෙන් එම කරුණු වලට අදාළ ව ප්‍රකාශයන් කිරීමට උනන්දුවක් දක්වන පාශර්වයන් ඇති නම් ඉදිරිපත් වී ප්‍රකාශනයක් ලබා දීමට ඇති හැකියාව පිළිබඳ ව මහජනතාව දැනුවත් කරමින් ලංකාදීප, දිවයින, දිනමිණ, Daily News, Daily Mirror හා තිනකරන් යටතේ පුවත්පත් දැන්වීම් පළ කරන ලදි. පළ කරන ලද දැන්වීම් වලට අනුකූල ව පහත සඳහන් පාශර්වයන් විසින් කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ඉල්ලා සිටි අතර එකී සියලු පාශර්වයන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවසර දෙන ලදි.

කේ. උපුල් ධම්මික මහතා
ඩබ්. එම්. එල්. වී. ජී. ප්‍රනාන්දු මහත්මිය

එසේ ම පරීක්ෂණ කමිටුව වශයෙන් මා හා කමිටුවේ සහය සඳහා පත් කරන ලද නීති නිලධාරිගේ සහය සහිත ව මෙම පරීක්ෂණය පැවැත්වීමේ පරමාථර්ය සම්බන්ධයෙන් පරීක්ෂණය ආරම්භයේ දී ම සැලසුම් කර ගනිමින් කරුණු දැක්වීම සඳහා උන්නදුවක් ඇති පාශර්වයන්ට අතිරේක ව පරීක්ෂණ කමිටුව විසින් පරීක්ෂා කර නිශ්චිතව ම ප්‍රකාශයන් සටහන් කළ යුතු පාශර්වයන් ද හඳුනා ගන්නා ලදි.

එසේ ම පරීක්ෂණ කමිටුවේ භාරයට ගත යුතු ලේඛන පිළිබඳ අවධානය යොමු කරමින් අදාළ යැයි හඳුනා ගන්නා ලද පාශර්වයන් වෙතින් ඊට අදාළ තමන් භාරයේ ඇති ලේඛනයන්හි සහතික පිටපත් හා අදාළ වන පරිදි මුල් ලේඛන පරීක්ෂණ කමිටුවේ භාරයට ගන්නා ලදි. ඒ අනුව පරීක්ෂණ කමිටුව විසින් මූලිකව ම ප්‍රශ්න කර ප්‍රකාශනයන් ගත යුතු පාශර්වයන්

හැටියට පහත සඳහන් රාජ්‍ය සහ ව්‍යවස්ථාපිත ආයතනයන්ගේ නියෝජනයන් මෙන් ම ඊට සම්බන්ධ නිලධාරීන් එසේ ම ප්‍රකාශයන් සටහන් කිරීම.

නලීන් මාන්නප්පේරුම මහතා
එච්. එම්. කුමාර මහතා
ටී.එස්. බාලසූරිය මහත්මිය
එන්. එස්. බෝපගේ මහතා
ආර්. පී. සමරක්කොඩි මහතා
රුවිනි ධමර්සිරි මහත්මිය
යෝගරානි සිල්වෙස්ටර් මහත්මිය
ඩබ්. එම්. එල්. වී. ජී. ප්‍රනාන්දු මහත්මිය
කේ. උපුල් ධම්මික මහතා
කේ. ජී. මහින්ද කහඳගම මහතා
ඩී. පී. සම්පත් සංජීව මහතා
ජගත් වෂර්විතාන මහතා
ඩී. ජී. රවින්ද්‍ර උදයශාන්ත මහතා
කේ. ඩී. ඒ. එම්. ක්‍රිශාන්ති ප්‍රියදශර්නී මහත්මිය
සුගත් සිසිර කුමාර මහතා
කේ. ඩී. ඒ. එම්. කුමාරනායක මහතා
ජේ.ඒ.ඒ.එස්. විමලේන්ද්‍ර මහතා
ආර්.එම්. කේ. රාසයියා මහතා
පී. ඩී. සෝමරත්න විජේසේකර මහතා
කේ. එම්. කේ. ජී. ජේ. බී. රත්නායක මහතා
කේ. තරංගා ගම්ලත් මහත්මිය
ඒ. එම්. පියදාස මහතා
වී.කේ. ඒ. අනුර මහතා
එස්. එම් මරික්කාර් මහතා
ජේ. එම්. යූ. ඉන්ද්‍රරතන මහතා
එන්. ඩී. කේ. රණවීර මහතා

ඒ අනුව ලබා දෙන ලද ප්‍රකාශන වල සංෂිප්තය පහත පරිදි වේ.

**නලීන් මාන්නප්පෙරුම මහතා.**
**බස්නාහිර පළාතේ ඝණ අපද්‍රව්‍ය අධිකාරියේ අධ්‍යක්ෂක**

ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය 1999 අංක 09 සහ 2007 අංක 001 දරණ ප්‍රඥප්ති මගින් සංස්ථාපනය වී ඇති බවත් ඒ අනුව අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරමින් පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණයට තාක්ෂණිකව හා මූල්‍යමයව සහයෝගය ලබා දීම අධිකාරියේ පරමාථර්ය බවත් ප්‍රකාශ කරමින්

ඒ අනුව අධිකාරිය විවිධ ක්‍රමඋපායන් 03 ක් හඳුනා ගන්නට විය එම ක්‍රමෝපායන් 03 යටතේ අපද්‍රව්‍ය කළමනාකරණ සිදු කල බවත් ප්‍රකාශ කරන ලදි.

අපද්‍රව්‍ය කළමණාකරණයේ කළාප සැලසුම් කරණය,
අපද්‍රව්‍ය කළමණාකරණයේ සත් පියවර හඳුනාගැනීම,
අපද්‍රව්‍ය කළමණාකරණයේ රීති ක්‍රියාත්මක කිරීම,

එම ක්‍රමෝපායන් බවත් එසේම අපද්‍රව්‍ය ජනනය කරන්නා විසින් එයට යම් ගෙවීම් කල යුතු යන ප්‍රතිපත්තිය

ඊට අදාළ ව කොරියානු ක්‍රමයක් වන volume base bag කියන ක්‍රමය හඳුනා ගැනීම සිදු කළ බවත් මෙම ක්‍රමයක අනුව වෙන් නොකරන ලද කසළ බැහැර කිරීම සඳහා මුදල් අය කරගෙන බෑගයක් ලබා දීමට කටයුතු කිරීම ආරම්භ කළ බවත්, වෙන් කරන ලද කසළ සඳහා මුදල් අය කිරීම නොකරන බවට දැනුවත් කිරීම් කළ බවත් ප්‍රකාශ විය. මෙම ක්‍රමය තුළින් අපද්‍රව්‍ය වෙන් කර බැහැර කිරීමට ප්‍රතිචක්‍රිකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට ජනතාව පෙළඹ වීමට බලාපොරොත්තු වූ බවත්, බොරලැස්ගමුව නගර සභාවේ මෙම ක්‍රමය දැනට ක්‍රියාත්මක වෙන බවත් හඳුන්වා දුන් ක්‍රමෝපායන් අනුව ඒවා සංකල්ප කර පළාතට වැඩ සටහනක් හඳුන්වා දීමට ක්‍රියා කල බවත්, එම වැඩසටහන අනුව ප්‍රධාන වැඩ සටහන් 04 ක් පහත සඳහන් පරිදි පාලනය කළ ක්‍රියාත්මක ව පවතින බවත් ප්‍රකාශ කරන ලදි.

එම ක්‍රම 4 එනම්,

ප්‍රජා මට්ටමේ වැඩ සටහන්.
මධ්‍යම පරිමාණ වැඩ සටහන්.
මහා පරිමාණ ව්‍යාපෘති.
දැනුවත් කිරීම්. හඳුන්වා දුන් බව ප්‍රකාශ කර සිටිම.

බොහෝ පළාත් පාලන ආයතනවල ප්‍රජා මට්ටමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන බවත්, ඒ අනුව කසළ වෙන්කිරීමේ වැඩ සටහන් මෙන්ම කසළ කොම්පෝස්ට් කිරීම සියළුම පළාත් පාලන ආයතනවල සිදුවන බවත් දැනට බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 26 ක කොම්පෝස්ට් අංගන 26 ක්‍රියාත්මක වන බවත්, ඒ සඳහා මිලියන 750 ක මුදලක් පමණ වියදම් කර ඇති බවත්, එහි වල ධාරිතාවය මෙට්‍රික් ටොන් 252ක් බවත් ප්‍රකාශ විය. මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇත්තේ මධ්‍යම රජයේ පරිසර අධිකාරියට පමණක් බවත්, ඒ සඳහා විශාල මුදලක් අවශ්‍ය වෙන බවත්, ඒ නිසා තම අධිකාරිය කරන්නේ මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් අධිකාරිය සහ පුද්ගලික අංශය සමග සම්මුති ඇති කරගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම බවත් ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ මහා පරිමාණ ව්‍යාපෘති 03 කද ගම්පහ 02 ක්ද කළුතර 01 ද වශයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න සැලසුම් සකස් කරලා තිබෙන බවත්, ඒ අනුව කොළඹ දිස්ත්‍රික්ක තුනෙන් එක ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති නමුත් එය ක්‍රියාත්මක වී නොමැති බව ප්‍රකාශ විය . ( පිටු අංක07, 08 බලන්න.)

දෙවැනි ව්‍යාපෘතිය 2011 නොවැම්බර් වලදී පුද්ගලික සමාගමක් සමග අත්සන් කල බවත්, එමගින් කසල මෙට්‍රික් ටොන් 500 ක් කළමණාකරණය කිරීමට බලාපොරොත්තු වූ බවත් කඩුවෙල ඇතුළුව කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 13 ක කසල මේ සඳහා යොදාගැනීමට අදහස් කල බවත්, නමුත් මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාකාරී තත්ත්වයේ නැති බවත්, කොළඹ දිස්ත්‍රික්කයේ අනික් ව්‍යාපෘතිය කොළඹ මහ නගර සභාව සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක කරන්න කටයුතු කළ බවත්, මේ යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට KSCT JAK පුද්ගලික සමාගම මහා පරිමාණ ආයෝජනය ලෙස තෝරා ගත් බව ප්‍රකාශ කර සිටි.

තම අධිකාරිය විසින් මීතොටමුල්ල කසළ කන්ද පිළිබඳ ව අධ්‍යයනය කර කසළ කන්දේ ආවධානම තම අධිකාරිය හඳුනාගනිමින්, එය පාලනය කිරීම සඳහා වහා ගත යුතු උපදෙස්

පිළිබඳ කොළඹ මහ නගර සභාව ඇතුළු සියළු ම අදාළ අධිකාරියන් වලින් කැඳෙව්වා. කෙටි කාලීන ව ගත යුතු ක්‍රියාමාගර් පිළිබඳ උපදෙස් ලබා දුන් බවත්, එහි අවධානම් කාලය නිශ්චිත ව ලකුණු කරන ලද සැලසුම් ද ඉදිරිපත් කළ ද එම නිසා ලබා දුන් නිදෙර්ශ කොළඹ මහ නගර සභාව විසින් නියමානුකූල ව ක්‍රියාත්මක නොවුන බව ප්‍රකාශ කර සිටියි.

තව ද බස්නාහිර පළාත් සභාවේ කළමනාකරණ අධිකාරිය යටතේ පවත්වාගෙන යනු ලබන කරදියාන කසල කන්ද විද්‍යාත්මක පසුබිමක් මත පාලනය කරන බවත්, ඒ සඳහා යොදා ඇති ක්‍රියා මාගර් එම වාතර්ාවෙන් පෙන්වා දී ඇති බවත්, කසළ අංගනයට පළාත් පාලන ආයතන 06 කසල බැහැර කරන බව වැඩි දුරටත් ප්‍රකාශ සිටි. එසේ ම මීතොටමුල්ල කසළ කන්දට කොළඹ මහනගර සභාවෙන් සහ කඩුවෙල නගර සභාවෙන් ද කුණු බැහැර කරන බවත්, මීතොටමුල්ල කසල කන්ද කළමණාකරණයට අධිකාරිය විසින් සකස් කර ඉදිරිපත් කරන ලදි. කරදියානු කසල අංගනය පාලනය කිරීම වැනි වැඩ පිළිවෙලක් තිබුණා නම් මීතොටමුල්ලට මෙවැනි ආපදාවක් සිදු නොවන බවත් ප්‍රකාශ කර සිටියි.

බස්නාහිර පළාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය බස්නාහිර පළාතේ පලාත පාලන ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විවිධ වැඩ සටහන් උපදෙස් හා මඟ පෙන්වීම් සිදු කල ද කොළඹ මහ නගර සභාව අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අධිකාරියේ උපදේස් හා මග පෙන්වීමට අනුකූල වීමත් සිදු නොවුන බවත් ප්‍රකාශ කරන ලදි. අධිකාරිය විසින් අපද්‍රව්‍ය අධිකාරි ප්‍රතිපත්ති යටතේ රීති පනවන්නට යෙදී ඇති බවත්, මෙම රීති බස්නාහිර පළාතට අදාල ව බලපෑමක් වෙන බවත්, එම රීති වලට අනුකූල ව කොළඹ මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණය කටයුතු සිදු නොවන බවත් ප්‍රකාශ කරන ලදි.

මීතොටමුල්ල කසළ බැහැර කල ස්ථානයට කසළ බැහැර කිරීමට හේතු වූ ශ්‍රේෂ්ඨාධිකරනයේ නඩුවේ පාශර්ව කරුවන් වශයෙන් අධිකාරියට සම්බන්ධ වෙන්න බැරි වුණ බවත් එසේම මීතොටමුල්ලට කසල ගෙනවිත් දැමීම හා සම්බන්ධ තීරණ වලට ද අධිකාරිය සම්බන්ධ නොවූ බවත් ප්‍රකාශ කර සිටි.

මේ වකවානුව වෙද්දි පිලිසරු කොම්පොස්ට් ව්‍යාපෘතිය වශයෙන් මිලියන 90 ක් පමණ වියදම් මධ්‍යම පරිසර අධිකාරියෙන් කොම්පෝසිට් අංගනයක් කොලොන්නාවේ ඉදි කල බවත් නමුත් එය අක්‍රිය ව පවතින බවත්, මෙම කසල අංගනය කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය ඉල්ලා සිටියත් මධ්‍යම පරිසර අධිකාරිය එය ප්‍රතික්ෂේප කල බවත් ප්‍රකාශ කර සිටි.

2016 වෂර්යේ මීතොටමුල්ල කසළ කන්දේ කඩා වැටීමක් සිදු වුණ බවත් ඒ අවස්ථාවේදී එනම් 2016.06.09 කසල කන්ද නිරීක්ෂණය කල බවත්. එහිදී කළමනාකරණයේ පහත සඳහන් ගැටළු සහගත තත්ත්වයන් තිබෙන බව නිරීක්ෂණය වූ බවත් ප්‍රකාශ කරන ලදි. එනම්,

- දෛනික මෙහෙයුම් කටයුතු වල දුවර්ලතා.
- ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම.
- ප්‍රමාණවත් මානව සම්පත් නොමැති වීම.
- අංගනයේ අපද්‍රව්‍ය බහලුම් උපරිම වීමට ලඟා වීම.

මෙම කරුණු සම්බන්ධයෙන් සියළුම පාශර්ව කරුවන් එනම් කොළඹ මහ නගර සභාව සංවධර්න අධිකාරිය ද ඇතුළුව පාශර්වකරුවන් ගෙන්වා මහ ඇමති තුමාගේ සහ ප්‍රධාන ලේකම්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වූ බවත් ප්‍රකාශ කර සිටි.

එම සාකච්ඡාවේ දී ඉදිරිපත් කරන ලද වාතර්ා මඟින් විශේෂයෙන් ම කසල කන්ද නිසා පරිසරයට සිදුවන හානියත් ඒ අනුව කන්ද පිළිබඳ ව කළමණාකරණය කටයුතු කළයුතු ආකාරයත් එසේ ම කසල කන්ද සිට 350 m රේඛාවක් තුල දැඩි අවධානම් කලාපයක් පවතින බවත් අදාළ වාතර්ාව ද ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන ලදි. ඒ පෙන්නුම් පරිදි ඒ බව වාතර්ාවේ සිතියම් ආශ්‍රයෙන් පෙන්වා තිබුන බවත් ඒ කලාප හඳුනා ගෙන පසු විපරම් කටයුතු කළා නම් මේ විනාශය වළක්වා ගන්න තිබුණු බවත් ප්‍රකාශ කර සිටි .

එසේ ම කසල කන්ද නිරීක්ෂණය කර හඳුනාගත් කරුණු පිළබඳ වාතර්ාවක් මඟින් කොළඹ මහ නගර සභාවට ඉදිරිපත් කල බව ප්‍රකාශ කල වාතර්ාව X 3 ලෙස සටහන් කර පරීක්ෂණ සභාවට ඉදිරිපත් කරන ලදි.

එසේම කසල කන්ද සම්බන්ධයෙන් ව්‍යාපෘති යොජනාවක් අධිකාරියට ඉදිරිපත් වුණ බවත් ඒ අනුව පුද්ගලික අංශය සමග ඒකාබද්ධ කර සැකසූ යෝජනාවක් ඇමතිතුමාට ඉදිරිපත් කළ බවත් මේ සඳහා ඉඩමක් නගරික සංවධර්න අධිකාරියෙන් ඉල්ලා සිටි නමුත් ඉඩමක් නොලැබුණ බවත් ඒ නිසා ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අධිකාරියට නොහැකි වුන බවත් මේ සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡා වලට කොළඹ මහ නගර සභාව සහභාගි වුණ බවත් ප්‍රකාශ කර සිටි.

2017 අප්‍රේල් 14 දින සිදුවූ හෝ ඊට ආසන්න දිනයක මෙවැනි අවධානමක් සිදුවෙයි කියලා අධිකාරියට වාතර්ාවෙලා නොතිබුණෙ බවත් නමුත් අධිකාරිය 2016 කරනු ලැබූ නිරීක්ෂණයේදී කසල කන්ද පුපුරා යෑමේදී අවදානමක් ඇති වීමේ සම්භාවිතාවයන් හඳුනාගෙන තිබුණ බවත් එම අවධානම මග හරවා ගැනීමට සහ අවම කර ගැනීමට අදාළ උපායන් අධිකාරිය විසින් කොළඹ නගර සභාවට ලබා දුන්නත් එය ක්‍රියාත්මක නොවූයේ බවත් නිශ්චිතවම ප්‍රකාශ කර සිටි.

2009 වශර්යේ ශ්‍රේෂ්ඨාකරණයේ නඩුව පවතින විට එම නඩුවට උදව් කරන්න කමිටුවක් පත්කර තිබුණ බවත් එයට හිටපු අධ්‍යක්ෂ වරයාත් සහභාගී වුණ බවත් එහිදී අධිකාරිය ප්‍රකාශ කර සිටියේ මීතොටමුල්ලට කසල බැහැර කරනවා නම් එය අධිකාරිය සඳහා යම් කිසි පාලන අධිකාරියක් ඒ සඳහා අවශ්‍ය යැයි කියා සිටි බැව් ප්‍රකාශ කර සිටි. නමුත් කමිටුව තීරණය කලේ එම කටයුත්ත කොළඹ මහ නගර සභාවටයි මධ්‍යම පරිසර අධිකාරිටයි පැවරීමට බවත් කොළඹ මහ නගර සභාවට නිදහසේ කසළ බැහැර කිරීමට ඉඩ දීමට ගත් තීරණය මෙම ව්‍යසනයට හේතුව බවත් ප්‍රකාශ කර සිටි.

**හේරත් මුදියන්සේලාගේ කුමාර මහතා.**
**ග්‍රාම නිලධාරි (මීතොටමුල්ල 511 A දහම්පුර වසම)**

2016.03.11 වෙනි දින සිට දහම්පුර කොට්ඨාශයට අනුයුක්ත ව කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බවත් රාජකාරිය බාර ගත්තාට පසුව ලැබුණු පැමිණිලි වලට අනුව අදාළ ප්‍රදේශය නිරීක්ෂණය කළ බවත් එහිදී නිවාස කිහිපයක්ම අලාභ වී තිබෙනවා දුටු බවත් ඒ අනුව ප්‍රාදේශීය ලේකම් ගෙන්වලා අලාභ නිවාස පෙන්වූ බවත් එහිදී නිවාස 10 ක පදිංචි කරුවන්ට ඉවත්වීමේ ලිපි භාර දුන් බවත් ප්‍රකාශ කර සිටි. එම ලිපි අප්‍රේල් 07 වෙනිදා දාතමයෙන් බවත් එසේ දැනුම් දුන් ලිපි 09 ක් X4A – X4I දක්වා සළකුණු කර ඉදිරිපත් කරන බවත් ලිපි බාරදුන් ස්ථාන ගෘහ මූලික ලැයිස්තුවේ සඳහන් ස්ථාන බවත් ප්‍රකාශ කර සිටි.

අප්‍රේල් 07 ට අමතරව අප්‍රේල් 11 දා පෙ.ව.10.00 ට පමණ කසල කන්ද නිරීක්ෂණ කළ බවත් කන්ද අවට පදිංචි අයට ලියුම් ලැබෙන තෙක් නොසිට ඉවත් වන ලෙසට දැනුම් දුන් බවත් අප්‍රේල් 11 දා තත්ත්වය අප්‍රේල් 07 දා තිබුණ තත්ත්වයට ම සමාන බවත් එම අවදානම් නිවාස පිහිටා තිබුනේ කසල කන්ද දෙස බැලූ විට වම් පැත්තෙතෙන් බවත් ප්‍රකාශ කර සිටි.

**තරංගා සම්මානි බාලසූරිය මහත්මිය.**
**ග්‍රාම නිලධාරිනී 511 වැල්ලම්පිටිය වසම**

දැනට 511 වැල්ලම්පිටිය වසමේ ග්‍රාම නිලධාරී වශයෙන් සේවය කරන බවත් මීතොටමුල්ල කසල කන්ද පිහිටලා ඇත්තේ අංක 511 දහම්පුර් වසමේ බවත් වර්ථමාන සේවයට පෙර 511 දහම්පුර වසමේ සේවය කර බව ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ල කසළ කන්ද අසල පිරිසක් පදිංචි වී සිට බවත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ නම් ගෘහමූලික ලැයිස්තුවට ඇතුලත් වී තිබු නමුත් කුලියට පදිංචි වී සිටි සමහරක්ගේ නම් මේ ලැයිස්තුවට ඇතුලත් වී නොතිබුණි බවත් ප්‍රකාශ කර සිටි.

අංක 511 ඒ දහම් පුර වසමේ රාජකාරි කල කාලයේදී එනම් 2015 වසාරේ අග භාගයේ සිට 2016 අග භාගය දක්වා කාලය තුළ එක් වතාවක් කන්ද නිරීක්ෂණ රාජකාරියක් කල බව මතක බවත් ඒ අවස්ථාවේදී එතන රාජකාරි කළ පොලිස් නිලධාරීන් සහ කොළඹ ම.න.ස නිලධාරියෙක් කන්ද තුලට පිවිසීමට අවසර නොදුන් බවත් එම නිසා ගේට්ටුව ළඟ සිට අවශ්‍ය තොරතුරු එනම් දිනකට පැමිණ ලොරි ප්‍රමාණය කසල ප්‍රමාණය දැනගත් බවත් මෙම තොරතුරු ලබා ගැනීමට සිදුවූයේ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියගේ ලිපියකට පිළිතුරු සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ දැනුම් දීම අනුව බවත් ප්‍රකාශ කර සිටි. අදාල වාර්ථාව ලිපි ගොනු විනාශ වීම නිසා ඉදිරිපත් කළ නොහැකි බව ප්‍රකාශ කර සිටි.

පැමිණිලි වශයෙන් නිවාස වල පිපිරීම් පිළිබඳ පැමිණිලි ලැබුන බවත් ඒවා ප්‍රාදේශීය ලේකම්ට හා ආපදා නිළධාරීන්ට වාර්ථා කළ බවත් පවසයි.

තමාගේ රාජකාරි කාලය තුලදී යම් යම් හානි සම්බන්ධයෙන් වන්දි ගෙවීම් සිදු කර ඉවත් කිරීම් සිදු කළ බවත් ඒ අනුව ඡන්ද හිමි නාම ලේඛනයෙන්ද නම් ඉවත් කළ බවත් පවසයි. ඉවත් කරන ලද සංඛ්‍යාව නිවාස 100 ක් පමණ බව ප්‍රකාශ කර සිටි.

රාජකාරි කාල පරිච්ඡේදය තුල මෙම ස්ථානයේ කඩා වැටීම් කිහිපයක් සිදු වුණත් ජීවිත හානි සිදු නොවු බවත් කසල කන්ද කඩා වැටුණ අවස්ථාවේ මුලින්ම ප්‍රාදේශීය ලේකම්ට ඒ බව දැනුම් දුන්නේ තමා බවත් ප්‍රකාශ කර සිටි.

**කසල කන්දට එරෙහි ජනතා ව්‍යාපාරය වෙනුවෙන්,**

**ප්‍රධාන සංවිධායක : නීතීඥ නුවන් බෝපගේ මහතා.**

කුණු කසල බැහැර ලීම සිදු කල ප්‍රදේශය පොතුවිල් කුඹුර වශයෙන් හඳුන්වන අතර එය 1989 පෙර ඉතාම පිරිසිදු ජලය සහිත කුඹුරු යායක් වශයෙන් පැවැති බව හා 5000 ක් පමණ ජන සංඛ්‍යාව ජීවත් වූ ප්‍රදේශයක් බවත් කුණු කන්ද කඩා වැටීමේ මෙම සිද්ධියෙන් අපදාවට ලක් වූ ප්‍රදේශය ගම් උදාව යටතේ ජනතාවට බෙදා දුන් ප්‍රදේශය බවත් ඊට ආසන්නව ම මීතොටමුල්ල රාහුල විද්‍යාලය, ටෙරන්ස් විද්‍යාලය, කොලොන්නාව බාලිකා විද්‍යාලය ඊට

අමතරව බෞද්ධ විහාර ස්ථාන 05 ක්ද මුස්ලිම් දේවස්ථාන දෙකක් ද කතෝලික දේවස්ථානයක්ද, පොදු ළිං 100 ක් ද පමණ පිහිටා තිබූ බවත් ප්‍රකාශ කර සිටි. ප්‍රකාශිත කරුණු සනාථ කිරීම සඳහා අදාළ පිඹුරු ඉදිරිපත් කරන ලදි.

පොතුවිල් කියන ඉඩමේ අක්කර 02 ක ප්‍රමාණයක කුණු දැමීමට අධිකරණ නියෝගයක් මගින් අවසර ලබා දුන් බවත් ඒ අනුව 2009 සිට මහ පරිමාණයෙන් කොළඹ මහ නගර සභාවේ කසළ දැමීම ආරම්භ කළ බවත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයේ අක්කර 02 ක් වුවත් 2012 වන විට අක්කර 18 දක්වා ව්‍යාප්ත කිරීමට මහ නගර සභාව ක්‍රියා කල බවත් 2012 වන විට අඩි 200 ක් උසට කුණු පැවති බවත් එහි ප්‍රතිඵලයක් ලෙස දැඩි පාරිසරික හා සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දීමට ජනයාට සිදුවූ බවත් මේ නිසාම ඩෙංගු, මී උණ, වැනි රෝග පැතිරුණ බවත් ප්‍රකාශ කර සිටි.

2013 වෂර්ය වන විට කුණු කන්දේ බලපෑම නිසා වසර 75 ක් පැරණි ඒ වන විටත් ශිෂ්‍යයන් 600 ක් පමණ ඉගෙනුම ලැබූ මීතොටමුල්ල රාහුල විද්‍යාලය කුණු දුගඳ නිසා වසා දැමීමට සිදු වූ බවත් මේ නිසා 2012 ඔක්තෝබර් මාසය වන විට ඉහත හේතු නිසා කුණු කන්දට එරෙහිව උද්ඝෝෂණ ආරම්භ වූ බවත් එය මූලික කරගෙන විරෝධතා ව්‍යාපාර කිහිපයක්ම පැවැත්වූ බවත් පොලිසිය විසින් එම උද්ඝෝෂණ අමානුෂික ලෙස මර්දනය කළ බවත් ප්‍රකාශ කර සිටි.

2014 වෂර්යේ ද උද්ඝෝෂණ පවත්වා ඇති අතර ඒ අනුව එක් අවස්ථාවකදී ගෝඨාභය රාජපක්ෂ මහතා තම සංවිධානයට සාකච්ඡාවක් ලබා දී එහිදී පුත්තලම දිස්ත්‍රික්කයේ ආරුක්කාලි නැමැති ප්‍රදේශයේ හුණු ගල් කැනීම් සිදු කළ වලවල් වලට කුණු දුම්රිය මගින් ගෙන ගොස් දැමීමේ ව්‍යපෘතියක් අවුරුදු 02 කින් ආරම්භ කරන බවත් එය ආරම්භ කරන තෙක් බ්ලූමැන්ඩල් ප්‍රදේශයට මෙම කුණු දැමීම ආරම්භ කරන බවත් එම සාකච්ඡා වලදී කියා ඇති නමුත් ඒ අනුව කටයුතු සිදු නොවුන බවත් උද්ඝෝෂණ දිගටම සිදු කළ බවත් නමුත් සිදු වුනේ මහජන පීඩාවක් සිදු කළාය යන චෝදනාව මත මහේස්ත්‍රාත් උසාවියේ නුවන් බෝපගේ සහ කීතතීරත්න පෙරේරා යන අය වරුන්ට විරුද්ධ ව නඩු දැමූ බවත් ප්‍රකාශ කර සිටි.

කොළඹ 1 සිට 15 දක්වා වූ කලාප වල කසල බැහැර කිරීමේ ටෙන්ඩරය කාලයක් තිස්සේ නගර සභාව ලබා දුන්නේ Care Cleans සහ Abans ආයතන වලට බවත් එසේ ලබා දීමේ දී ඇස්තමේන්තු ගත මුදලට වඩා වැඩි මුදලකට එනම් මිලියන 800 කට පමණ මුදලකට බවත් කොමිස් මුදල් වශයෙන් 2010 සිට 2017 දක්වා නගර සභාවේ සේවය කළ නගරාධිපති වරු කොමසාරිස්වරු ලබා ගත් බවත් එයට සාක්ෂි වශයෙන් SCFR 159 / 15 දරන මෙම ටෙන්ඩරය අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කළ නඩුව පෙන්වා දිය හැකි බවත් මෙම නඩුව ඉදිරිපත් කළ නාගරික මන්ත්‍රී එච්.එස්. චන්ද්‍රදාස මහතාගේ චෝදනාව වූයේ දිස්ත්‍රික්ක 02 A කොටුව ටෙන්ඩරයේ ඇස්තමේන්තු වටිනාකම මිලියන 663.6 වුවද එම ටෙන්ඩරය Abans වෙත ලබා දී ඇත්තේ මිලියන 880 කට පමණ බව ප්‍රකාශ කර සිටි.

මේ ආකාරයට ජනතා උද්ඝෝෂණ තිබුණත් ගැටළුවට විසඳුමක් නොලැබුණ අතර උද්ඝෝෂණයේ ප්‍රතිඵල ලෙස අගමැති තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කල බව කියයි. එම කමිටුවට සමාගම් 60 ක් පමණ ව්‍යාපෘති වාර්ථා ඉදිරිපත් කර ඇති බව වැඩි දුරටත්

මේ අතරතුර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් කරන ලද සමීක්ෂණයන් වලින් හෙලිවී ඇත්තේ ප්‍රදේශයේ දරුවන්ගෙන් 65 %කටම ආසන්න ප්‍රමාණයකට චමර් රෝග හා මානසික රෝග වැලදී ඇති බවත් 2015 වෂර්යේ වන විටත් මිනිසුන් 30 කට පමණ ඩෙංගු, මී උණ ආදී රෝග වලින් මිය ගිය බවත් කුණු කන්ද කඩා වැටීමේ අවධානම සහ කුණු කන්ද නිසා දහනය වන මීතේන් වායුව හේතුවෙන් නැවත පිළිසකර කල නොහැකි පරිසර හානියන්

සිදු වී ඇති බව පරිසර නීතීඥයන්ගේ සංගමය ද පෙන්වා දී ඇති අතර එම වාතර්ාව X 36 වශයෙන් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටි.

2015 සිට කුණු කන්දට විසඳුමක් නොමැති නිසාත් එනම් දෙසැම්බර් 27 දින හෝ ආසන්න දිනයකදී උද්ඝෝෂණය ක්‍රියාමාගර්යකට යැමට තම ව්‍යාපාරය තීරණය කර කුණු කන්දට ඇතුළු වන දොරටුව ළඟ අට්ටාලයයක් ගසා අවහිර කොට විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළ නමුත් එදින රාත්‍රී 10.00 ට පමණ කොලොන්නාව නගර සභාවේ සභාපතිවරයා බස් රථයකින් මැරයන් 20 දෙනෙකු සමග පැමිණ ප්‍රහාරයක් එල්ලකර එම ප්‍රහාරයෙන් පසුව පොලිසියට කරන ලද පැමිණිල්ලක් අනුව පොලිසිය සභාපති ඇතුළු 04 දෙනෙකු රිමාන්ඩ් භාරයට පත් කර ඇති බව ප්‍රකාශ කර සිටි.

මෙම උද්ඝෝෂණ නිසා 2013 සිට 2016 දක්වා කුණු කන්ද ආසන්නයේ පැවැති නිවාස 350 කට ආසන්න ප්‍රමාණයක් බලධාරීන් විසින් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ ආකාරයෙන්ම 2016 වන විට තවත් නිවාස 300 කට ආසන්න ප්‍රමාණයක් ඉවත් කළ බවත් මෙම නිවාස ඉවත් කිරීම සිදු වුනේ පෙර නියෝජ්‍ය ඇමතිවරයා සමග පැවැත්වූ සාකච්ඡාවකින් පසුව බවත් ස්ථිර විසඳුමක් ලබා දෙන තෙක් කුණු කන්ද තවත් ව්‍යාප්ත කිරීමට රජය ගත් තවත් තීරණයක් නිසා බවත් ප්‍රකාශ කර සිටි.

මේ සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දෙකක් පැවති බවත් ඉන් එක් නඩුවක් වුයේ අංක SCFR 311/2015 හා SCFR 381/2015 යන්න බවත් කීතරී රත්න පෙරේරා සහ නීතීඥ නුවන් බෝපගේ ඇතුළු 08 දෙනෙකු පෙත්සම්කරුවන් වූ අතර ම වග උත්තරකරුවන් වශයෙන් නාගරික කොමසාරිස්, නගරාධිපති, ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ ඒකකය සහ නාගරික සංවධර්න අධිකාරිය නම් කර තිබුණ බවත් කසළ දැමීම නිසා මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව හා කුණු දැමීම තාවකාලිකව නවත්වන ලෙස නඩු මගින් ඉල්ලා ඇති බව ප්‍රකාශ කර ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම X 37 වශයෙන් නම් කර ඉදිරිපත් කර සිටි.

කොලොන්නාව නගර සභාවේ නගරාධිපති වරයා උප සභාපතිවරයා නාගරික මන්ත්‍රී ජානක නාගුල යන අය වලුන් තමන්ගේ පුද්ගලික ලොරි යොදා විවිධ පිට සමාගම් වලට සහ කමර්ාන්තශාලා වලින් කුණු මෙම අංගනයට ගෙන එන බවත් එය කර ඇත්තේ කොලොන්නාවේ private limited නැමැති බෝඩ් තහඩුව යොදාගෙන ලොරි 14 ක් මාගර්යෙන් බවත් මෙම ලොරි වල අංක වැල්ලම්පිටිය පොලිසියට ලබා දුන් බවත් දෙරණ නාලිකාවේ පැවති වැඩ සටහනකදී ද කොමසාරිස් අනුර මහතාට දුන් බවත් නමුත් මෙයට කිසිදු පියවරක් පොලිසිය නොගත් බව ඉහත සඳහන් ලොරි සඳහා කොළොන්නාවේ නගර සභාවේ සුදු පැහැති රිසිට් නිකුත් කර ඇති අතර එම ලොරි වලින් එක්වර රු 4000 ක් කප්පමක් අදාළ බලධාරීන් ලබාගෙන ඇති බව ප්‍රකාශ කර සිටි.

2017 මුල් වකවානුව වන විට කුණු ලොරි කන්ද මුදුනට යැමට නොහැකි වුන බවත් මේ නිසා කුණු එක තැන ගොඩ ගැසීම හේතු කොට ගෙන බෑවුමක් සහිත කුණු කන්දක් වූ බවත් කුණු දැමීම නතර කිරීම වෙනුවට නගර සභාව කලේ බැකෝ යන්ත්‍ර 7 ක් යොදාගෙන නැවතත් කුණු කන්ද මුදුනට කුණු තල්ලු කිරීමක් කළ බවත්. මේ සඳහා ද විශාල වියදමක් දැරූ බව කුණු කන්ද 2017 අප්‍රේල් 14 දින ප.ව 3.15 ට පමණ කඩා වැටීම නිසා ප්‍රදේශයේ ගෙවල් 98 ක් සම්පූණර්යෙන්ම විනාශ වූ බවත් පුද්ගලයන් 30 දෙනෙකු මිය ගිය බවත් මිය ගිය පුද්ගලයන්ගේ ලේඛනය X 38 ලෙස නම් කර ඉදිරිපත් කරන බවත් මිය ගිය පුද්ගලයින් අතරින් අවුරුදු 10 ට අඩු පුද්ගලයින් සංඛ්‍යාව 09 දෙනෙකු බවත් ප්‍රකාශ කර සිටි.

මෙම ස්ථානයට කුණු දැමීම සිදු කලේ 2009 වෂර්යේ සිට බවත් එදින සිට 2017 අප්‍රේල් 14 තෙක් කන්ද කඩා වැටීම සිදුවුණ දිනය තෙක් කොළඹ මහ නගර සභාවේ සේවය කල

නාගරික කොමසාරිස්වරුද, නාගරාධිපතිවරුද, නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් පාලන අමාත්‍යාංශය වගකිව යුතු බවත් ප්‍රකාශ කර සිටි.

**රෝහණ ප්‍රියන්ත සමරක්කොඩි මහතා. ( ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ අතිරේක අධ්‍යක්ෂක ජනරාල්, ඊට ප්‍රථම බස්නාහිර පළාතේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ ප්‍රථම අධ්‍යක්ෂ)**

රසායන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙක් බවත් ජාතික ගොඩනැගිලි පයේෂණ ආයතනයේ විද්‍යාඥයෙක් හැටියට අවුරුදු 10 ක් සේවය කර ඇති කර බවත් අනතුරුව ඝණ අපද්‍රව්‍ය බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ ප්‍රථම අධ්‍යක්ෂක ලෙස සේවය කර ඇති බවත් දැනට ආපදා කළමනාකරණය මධස්ථානයේ අතිරේක අධ්‍යක්ෂක ලෙසත් සේවය කරන බව ප්‍රකාශ කර සිටි.

බස්නාහිර පළාතේ ඝණ අපද්‍රව්‍ය අධිකාරිය 2004 වෂර්යේ ආරම්භ කළ බවත් එම කාලයේ 1999 අංක 09 දරණ ප්‍රඥප්තිය යටතේ එය ක්‍රියාත්මක කර වු බවත් මෙම ප්‍රඥප්තිය තුල ඉඳගන අපද්‍රව්‍ය කළමණාකරණය සාථර්කව කරන්න බැරි වුන බව හැඳිනගෙන 2007 අංක 01 දරණ ප්‍රඥප්තිය හඳුන්වා දීම සිදු කර ඇති බව ප්‍රකාශ කර සිටි.

ඊට පසුව තමාගේ කාලයේ අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේ සිට අවසන් බැහැර කිරීම දක්වා වූ සමස්ථ ක්‍රියාවලිය පියවර 07 කට වෙන්කර ඒ පියවර 07 ක්‍රියාත්මක කරන්න රීති 70 ක් පිළියෙළ කල බවත් එම රීති 2008 අංක 01 අපද්‍රව්‍ය ඝණ කළමනාකරණ රීති වශයෙන් හැඳින්වූ බවත් එසේ ම මෙම පියවර 07 යටතේ සිදුවන කසල කළමණාකරණයේදී අවසන් බැහැරලීම පිළිබඳ වගකීම පැවරුනේ මධ්‍යම රජයට සහ පළාත් සභාවට බව ප්‍රකාශ කර සිටි.

2007 වෂර්යේදී බනර්ස් ආයතනයේ තීරණයක් අනුව බ්ලූමැන්ඩල් වලට කුණු දැමීම නතර කළ බවත් ඒ නැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබුණ බවත් එම නඩුවේ පාශර්ව කරුවන් වූයේ බනර්ස් ආයතනයත්, පළාත් සභව සහ කොළඹ නගර සභාව බවත් නඩුවේ පැමිණිලිකරු වනුයේ පරිසර ආරක්ෂක සංවිධානයක් බවත් මෙම නඩුවේදී කොළඹ නගරයේ කසල බැහැර කරලීම සඳහා හඳුනා ගත යුතු ක්‍රම උපාය මොනවාද යන්න සොයා බැලීමට විද්වත් කමිටුවක් පත් කිරීමට තීරණය කල බවත් එම කමිටුවට මධ්‍යම පරිසර අධිකාරියත්, ඝණ අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව අයත් වූ අතර පසුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය එහි සංයුතියෙන් ඉවත් වූ බවත් තමන් එහි නිත්‍ය සාමාජිකයෙකු නොවුන බවත් අධිකාරිය කමිටුවෙන් ඉවත් විමට හේතුව වූයේ කමිටුවට ඉදිරිපත් කල යොජනාව පිළිනොගැනීම නිසා බවත් එම යෝජනාව වූයේ අපද්‍රව්‍ය කළමණාකරණය මෙහෙයවීම අධිකාරිය සතු කරන ලෙසට වගකීමෙන් ඉල්ලා සිටිය නමුත් මධ්‍යම පරිසර අධිකාරිය ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියට වඩා ශක්තිමත් නිසා එයට ඉඩ නොදීමට කරන ලද තීරණය නිසා බව ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ල කසල බැහැර කරන ස්ථානය වශයෙන් වථර්මානයේ හඳුන්වන බිම් ප්‍රමාණය 2005 වෂර්යේදී ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය කසල බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට උචිත ස්ථානයක් වශයෙන් තෝරාගෙන තිබුණ බවත් එම ව්‍යාපෘතිය

මගින් කසල දහනය තුළින් විදුලිය නිපදවීමට යෝජනා කර තිබුණ නමුත් පසුව මෙම ස්ථානය කසල දැමීමට UDA එක අවසර දුන් බව වැඩි දුරටත් ප්‍රකාශ කර සිටි.

2005 වෂර්ය වන විට කොලොන්නාව නගර සභාව කසළ මෙම ස්ථානයට දැමීම සිදු කළ බවත් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව අනුව කොළඹ මහ නගර සභාවේ කුණු දැමීම ආරම්භ වු බවත් කුණු දැමීමට කිසිවෙකුට විරුද්ධ විය නොහැකි බවට නියෝගය නඩු තීන්දුවෙන් ලැබුණ බවත් බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය අධිකාරිය මීතොටමුල්ල කසළ බැහැර කිරීමේ ස්ථානය සම්බන්ධයෙන් කිසිදු දෙයක්වත් කරේ නැති බවත් කොළඹ නගර සභාව මධ්‍යම පරිසර අධිකාරියයි එහි පරිපාලනය ගෙන ගිය බවත් ප්‍රකාශ කර සිටි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ බ්ලූමැන්ඩල් කසල බැහැර කරන ස්ථානය හා සම්බන්ධයෙන් වූ නඩුවකට අදාල කමිටුවක නිදෙර්ශය පරිදි කොළඹ මහ නගර සභාවේ කසල මීතොටමුල්ලට ගෙන යෑමට සිදු වූ බවත් ඒ අවස්ථාවේදී කමිටුව වෙත අදහස් දැක්වීමට ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ ප්‍රධානියා හැටියට තමන් මැදිහත් වෙන්න උත්සහා ගත්තත් එම කමිටුව එම මැදිහත් වීම භාර ගැනීමට කටයුතු නොකළ බවත් තවදුරටත් ප්‍රකාශ කර සිටි.

තමන්ගේ සේවා කාලය තුල කසල දැමීමේ ක්‍රමවේදය නිරීක්ෂණය කිරීමට එම ස්ථානයට ගොස් ඇති බවත් ඒ අවස්ථාවේ දී අධිකාරිය නිවැරදි ක්‍රමවේදය පෙන්වා දුන් බවත් 2010 දෙසැම්බර් 31 දින ලේකම් සමග පැවැති සාකච්ඡාවකදී ද පස් දමන ක්‍රමවේදයට විරුද්ධ වූ බවත් විරුද්ධ වීමට හේතු වශයෙන් පස් දැමීම නිසා කුණු වේලෙන්න ප්‍රමාද වන බවත් පස් දැමීමෙන් සිදු වන්නේ කුණු වල තියන දියර පස්වලට උරා ගැනීම බවත් පස් නොදැම්මෙන් දියර ඉක්මනින් වේලෙන බවත් අක්කර 28 ක තියෙන කුණු වලට පස් දැම්මීමෙන් පස්සේ වතුර එකතු වෙන බවත් කුණු උඩින් පස් දමද්දි පස ලිස්සන සුළු වන නිසා පස කඩා වැටෙන්න තියන සම්භාවිතාව වැඩි බවට කරුණු පෙන්වා දුන් බව ප්‍රකාශ කර සිටි.

තමන්ගේ සේවා කාල සීමාව තුල අපද්‍රව්‍ය කලමණාකරණ අධිකාරිය වශයෙන් මීතොටමුල්ල ස්ථානයට අදාලව පරීක්ෂණ සිදු කර ඇති බවත් නමුත් වාතර්‍ා ඉදිරිපත් කිරීමට බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ අවශ්‍යතාවයක් නොතිබුණ බවත් නමුත් වාතර්‍ා ඉදිරිපත් කිරීමට නෛතිකව බැඳී සිටියේ මධ්‍යම පරිසර අධිකාරිය බවත් නමුත් මෙම කාලය තුලදී සමාගාමීව ව්‍යාපෘති දෙකක් ආරම්භ කිරීමට කටයුතු කළ බවත් ඉන් එකක් කරදියාන බවත් අනෙක කඩුවෙල ආරම්භ කිරීමට සැලසුම් කල බවත් 2017/04/14 දින සිද්ධියේදී ජීවිත 30 ක් පමණ නැතිවුණ බවත් ගෙවල් 100 ක් පමණ විනාශ වූ බවත් අතුරුදන් වීම්ද සිදු වුන බවත් මේවාට මධ්‍යම පරිසර අධිකාරිය,ආපදා කළමණාකරණ අධිකාරිය පරිසර අමාත්‍යාංශය පළාත් සභාව සෘජුව වගකිව යුතු බවත් මෙම සිද්ධියට බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය වග නොකිවයුතු බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටි.

සාක්ෂිකරු තමන් වර්තමානයේ සේවය කරන ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ නෛතික වගකීම පැහැදිලි කරමින් එය 2005 අංක 13 දරණ ආපදා කළමණාකරණ පනතින් සංස්ථාපිත එකක් බවත් මෙම පනත යටතේ මෙහි බලය ඇත්තේ ව්‍යවස්ථාපිත කළමණාකරණ සභාවට බවත් එම සභාව ජනාධිපති තුමාගේ සහ අගමැතිතුමාගේ සහභාගීත්වයෙන් පවත් වන බවත් ඊට අමතරව අදාළ අමාත්‍යාංශවල ඇමැතිවරු සහ විපක්ෂයේ මන්ත්‍රීවරු 05 දෙනෙකු ඇතුලත් වන බවත් ප්‍රකාශ කර සිටි.

**රුවිනි නදීශා ධර්මසිරි මහත්මිය .**
**අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ සභාපතිනී.**

තමන් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ සභාපති වශයෙන් 2015 ඔක්තෝබර් 07 දා සිට අද දක්වා ම සේවය කර ඇති බවත් ඊට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරියේ ව්‍යාපෘතිය භාර අධ්‍යක්ෂක වරියක් වශයෙන් කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර සිටි.

කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 07 කසළ කරදියාන අංගනයට බැහැර කරන බවත් එය අධිකාරියේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන බවත් කොළඹ මහ නගර සභාවේ අපද්‍රව්‍ය කරදියාන අංගනයට බැහැර නොකරන බවත් මීතොටමුල්ල කසළ කන්ද අධිකාරියේ අධීක්ෂණය යටතේ නොපැවැතින බවත් ඒ නිසා මීතොටමුල්ල සම්බන්ධයෙන් අධිකාරියට බලය තිබෙන්නේ ව්‍යාපෘතිය යෝජනා පමණක් ඉදිරිපත් කිරීම බවත් ඒ අනුව කෙටි කාලීන වැඩ සටහන් ඇතුලත් ව්‍යාපෘති යෝජනා කීපයක් නාගරික කොමසාරිස් වෙත 2016.01.27 දිනැති ව දරන වාතර්‍ා මඟින් ඉදිරිපත් කර ඇති බවත් (X 39 A සහ X39 C ) නැවත යෝජනාවක් 2016/04/25 දින ඉදිරිපත් කර ඇති බවත් (X 39 B) X 39 B වාතර්‍ාව තුල ඉතා පැහැදිලිව මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ව කොළඹ මහ නගර සභාව ක්‍රියා කල යුතු ආකාරය සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ලට කසල දැමීම අයෝග්‍ය බවට තමා තීරණය කළ බවත් එයට තමන් විකල්පයක් වශයෙන් ප්‍රථමයෙන් යොජනාවක් වශයෙන් ගෙවල් වලින් එන කුණු දැමීම අවම කර ගැනීම සහ ඒසේම පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් වීම සිදු කළ යුතු යන ස්ථාවරත්වයේ සිටි බවත් ඒ අනුව ආයෝජන ව්‍යාපෘතියක් වශයෙන් අක්කර 03 ක ඉඩමක් ඉල්ලා සිටි බවත් ආයෝජකයා වශයෙන් ජේ.එස්.පී. කියන විදේශීය ආයෝජකයාව හඳුනා ගත් බවත් මෙම ආයෝජනය හඳුන්වා දුන්නට සාථර්ක කර ගන්නට බැරි වුන බවත් මෙය හඳුනාගැනීම සිදු වූයේ 2016 මැයි මාසයේ පමණ බවත් ප්‍රකාශ කර සිටි.

2017 අප්‍රේලි 14 කන්ද කඩා වැටීමට ආසන්න කාලයේ එනම් 2017 ජනවාරි මාසයේ කන්ද නිරීක්ෂණය කිරීමට ගිය බවත් කන්ද අවදානම් තත්වයක තිබෙනවා දක්නට ලැබුණු බවත් මධ්‍යම පරිසර අධිකාරියෙන් පිළියෙල කර තිබුණ කොම්පෝස්ට් අංගනය නොපෙන්නේ තරමට ම කසල වලින් වැසී තිබුණු බව මෙම තත්වය අදාළ ආයතන වෙත දැනුම් දීමක් සිදු කළ බව ප්‍රකාශ කර සිටි.

බස්නාහිර පළාතේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය නීති ගත ආයතනය වුනත් වෙනත් පළාත් පාලන ආයතන සමග සසඳන විට කොළඹ මහ නගර සභාවේ කසළ කළමණාකරණය වෙනත් ආකාරයකට සිදු වු බවත් කසළ කළමනාකරණය සාථර්කව කායර්ක්ෂමව ඉටු කරන්න නම් කසල කමනාකරණය සඳහා එකම අධිකාරියක් තිබිය යුතු බවත් ප්‍රකාශ කර සිටි. ( පිටු අංක 113, 114 )

**යෝගරානී සිල්වෙස්ටර් මහත්මිය.**

## කොළඹ මහ නගර සභාවේ අධ්‍යක්ෂක ඉංජිනේරු (ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ)

කොළඹ මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අංශයේ අධ්‍යක්ෂ ලෙස 2015 නොවැම්බර් මස 16 දා සිට අද දක්වා සේවය කරන බවත් ඊට ප්‍රථම ඉඩම් හා පරිසරය පිළිබඳ විෂය භාර ඉංජිනේරු වශයෙන්ද ව්‍යාපෘති අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරය දැරූ බවත් කොළඹ නගරය තුල කසල කළමණාකරණය සඳහා කළාප 06 කට බෙදා ඇති බවත් එම කලාප 06 න් තුනක කසල ටෙන්ඩර් කැඳවා පුද්ගලික අංශයට දී ඇති බවත් එම කලාප 03 ට දිස්ත්‍රික් 01 , දිස්ත්‍රික් 2A දිස්ත්‍රික්ක 05 අයත් වන බවත් අනෙක් කලාප තුනේ කසල කළමණාකරණය මහ නගර සභාව විසින් ම සිදු කරන බවත් එසේ කරන ලද දිස්ත්‍රික්ක වනුයේ දිස්ත්‍රික්ක 2,3,4 එම කලාප බවත් මෙම කලාප තුනේ ම කසල එකතු කර ප්‍රවාහනය කරන නමුත් කාණු සහ වීදි ශුද්ධ කිරීම බාහිර ආයතන සිදු කරන බවත් කියා සිටි. විධිමත් විධිමත් සේවාවක් ලබා දීම මෙම ක්‍රම දෙකක් අනුගමනය කිරීමට හේතුව බව ද ප්‍රකාශ කර සිටී.

කසළ ප්‍රවාහනය මෙන්ම බැහැර කිරීමට ද ටෙන්ඩර් කැඳවා අවුරුදු 04 ක කාලයකට 2015 වසරේදී පුද්ගලික ආයතන වලට ලබා දුන් බවත් අවසන් තීරණය ගත්තේ මහා නගර සභාව විසින් බවත් ප්‍රකාශ සිටි. 2009 වශර්යේදී මීතොටමුල්ල අක්කර 02 ක ප්‍රමාණයක කසල බැහැර කිරීමට අවසරය ලැබුණ බවත් මෙම ස්ථානයට කොළඹ මහ නගර සභාව කොලොන්නාව නගර සභාව විසින් අවසර දෙනු ලබන සමාගම්, ත්‍රිවිධ හමුදාව කසල බැහැර කිරීම සිදු කළ බවත් මෙම බැහැර කිරීම පාලනය කිරීමට හැකියාවක් නගර සභාවට නොතිබුණ බවත් පාලනයකින් තොරව පිටස්තර ආයතන ද මෙම ස්ථානයට කසල දැමීම සිදු කල බවත් මේ පිළිබඳව වැල්ලම්පිටිය පොලිසියට පැමිණිලි කල බවත් වෙනත් වෙනත් අය මෙම ස්ථායට කසල දැමීම පාලනය කිරීමට දේශපාලඥයන්ගේ මැදිහත් වීම සහ නිතර පැවැති උද්ඝෝෂණ නිසා නොහැකි වූ බවත් ප්‍රධාන ප්‍රවේශ මාගර්ය මඟහරිමින් වෙනත් පාරවල් වලින් පැමිණ කසල දැමීම සිදු කළ බවත් දිවා කාලයට එක්කෙනයි රාත්‍රී කාලයට එක්කෙනයි වශයෙන් සුපවයිසවර්රු දෙදෙනෙකු යොදවා ඇති බවත් ප්‍රකාශ සිටි.

වතර්මානයේ දිස්ත්‍රික්ක 1 දරන කලාපයේ කසල ඒකරාශි කිරීම සම්බන්ධයෙන් අබාන්ස් ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුම X 65 වශයෙන් ඉදිරිපත් කර ප්‍රකාශකරු එම ගිවිසුම සඳහා වන ප්‍රතිග්‍රහ ලිපිය X 66 වශයෙන් ඉදිරිපත් කරන ලදි. ඊට අමතරව කොළඹ නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය කළමණාකරණ දිස්ත්‍රික්ක 2 A කලාපයට අදාළ ව ගිවිසුම් 03 ක් ඇති බවත් ඉන් 2 A කලාපයට අදාල කොටුව පිටකොටුව කසල කළමණාකරනය සම්බන්ධයෙන් Care clean ආයතනය සමග ඇති කර ගිවිසුම බවය. X 69 වශයෙන් ඉදිරිපත් වූ බවත් එයට අදාල ප්‍රතිග්‍රාහක ලිපිය X 70 වශයෙන් ඉදිරිපත කරන බවත් ප්‍රකාශ සිටි. මෙම ගිවිසුමට අමතරව 2 A ප්‍රදේශයට අයත් කොටුව පිටකොටුවට තවත් ගිවිසුමක් අබාන්ස් ආයතනය සමග 2015සැප්තැම්බර් 01 සිට 2019 අගෝස්තු 31 දක්වා කාල සීමාවකට ඇති කර ගත් බවත් එම ගිවිසුම X 71 වශයෙන් ඉදිරිපත් කරන බවත් ප්‍රතිග්‍රාහක ලිපිය X 72 වශයෙන් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටි. තුන් වන ගිවිසුම වනුයේ Care clean ආයතනය සමග 2015 ජුනි 01 සිට 2019 ජුනි 30 දක්වා ඇති කර ගෙන තිබුණ බවත් එම ගිවිසුම X 73 වශයෙනුත් ප්‍රතිග්‍රාහක ලිපිය X 74 වශයෙනුත් සලකුණු කර ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරයි.

මීට අමතරව දිසා අංක 05 බල ප්‍රදේශයට අබාන්ස් ආයතනය සමග 2015 ජනවාරි 1 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ගිවිසුමක් ඇති කර ගත් බවත් එම ගිවිසුම X 76 වශයෙනුත් ප්‍රතිග්‍රහක ලිපිය X 77 වශයෙනුත් සලකුණු කර ඉදිරිපත් කරන බවත් X 76 ගිවිසුම ක්‍රියාත්මක වීමට ප්‍රථම එම බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ගිවිසුම X 78 වශයෙන්

ඉදිරිපත් කරන බවත් ප්‍රතිග්‍රාහක ලිපිය X 79 වශයෙන් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරයි.ඉහත සඳහන් කුණු එකතු කිරීම සඳහා වූ ගිවිසුම් වලට අමතරව කාණු ශුද්ධ කිරීම අතුගෑම බ්‍රෂ් කිරිම ආදියට වෙනම ගිවිසුම් ද ඇති බවත් ප්‍රකාශ කර සිටී.

කසළ බැහැර කිරිම සඳහා ටෙන්ඩර් කැඳවීමේදී කසල බැහැර කිරීම් ස්ථාන සහිත හා ස්ථාන රහිත වශයෙන් ක්‍රම දෙකටම මිල ගණන් ඉදිරිපත් කරමින් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අවසර දුන් බවත් මිල ගණන් ඉදිරිපත් වුණ බවත් ඒ අනුව ඉදිරිපත් වුන ආයතන සම්බන්ධයෙන් පත් කළ ඇගයීම් මණ්ඩල වල සාමාජිකයෙක් වශයෙන් ද සාක්ෂිකරු සහභාගි වුණ බවත් සියළුම ඇගයීම් කමිටු වල ක්‍රියාකාරීවය එක සමාන බවත් වෙනස්වීමක් සිදු වන්නේ කම්කරු සංඛ්‍යාවයි වාහන ප්‍රමාණය ආදිය පමණක් බවත් සාමාන්‍ය කොන්දේසි සියල්ල එක සමාන බවත් මේ අනුව ස්ථානයක් සහිත හා ස්ථානයක් රහිත ලෙස ඉදිරිපත් කළ ගණන් වල වෙනස මිලියන 05 ක් පමණ වන බවද තාක්ෂික ඇගයිම් මණ්ඩලය මිල ගනන් අධ්‍යනය කරලා දෙන නිදෙර්ශය කුමක් වුවත් ගන්නා මහ සභාවේ තීරණය වූයේ මීතොටමුල්ලට කසළ බැහැර කිරීම කළ යුතු බව ප්‍රකාශ කර සිටී.

මීතොටුල්ල කසල අංගනය අධීක්ෂණය කිරීම වෙනම ඉන්ජිනේරු වරයෙකු පත්කර සිටී බවත් ඔහු ඉංජිනේරු කුමාරනායක බවත් ඔහුගේ රාජකාරිය වූයේ අංගනයට අදාල රාජකාරී බවත් ඉංජිනේරුවරයාට රාජකාරි නිසියාකාරයෙන් කරගෙන යෑමට නොහැකි තත්වයක් තිබුණ බවත් පස් ඩෝසර් කිරීමට ඉඩමදි විම කන්ද අවට නිවාස තිබීම සහ ජනතා උද්ඝෝෂණ තිබීම ආදී කරුණු විෂය හේතුවූ බවත් ප්‍රකාශ සිටි.

මෙම ගැටළු ඉදිරිපත් වූ විට තමන් ඒ සම්බන්ධව කෙටිකාලින හා මධ්‍ය කාලීන විසඳුම් දුන් බවත් මධ්‍යකාලීන වසඳුමක් වශයෙන් ජා ඇල ඒකල බිම් පිරවුම් වැඩ සටහන ක්‍රියාත්මක කරගෙන යෑමට ක්‍රියා කල බවත් කෙටි කාලීන විසඳුමක් වශයෙන් කොම්පෝස්ට් පොහොර ව්‍යපෘතියක් සඳහා BIO SAFTY (PVT)LTD සමග ගිවිසුමකට එළඹුන නමුත් එය ක්‍රියාත්මක නොවුණ බව ද ප්‍රකාශ කර සිටි. මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු ඇතුළත් වාතර්ාවක් X84 ලෙස සටහන් කර ඉදිරිපත් කර ලදි.

කොළඹ මහ නගර සභාව විසින් කසළ කළමනාකරණයට බාහිර ආයතන හඳුනා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයක් ලබා ගත් බවත් ඒ අනුව ටෙන්ඩර් කැඳවූ බවත් ටෙන්ඩරයට ආයතන 15 කින් ටෙන්ඩර් ඉදිරිපත් කළ බවත් ටෙන්ඩර් ඇගයීම් වාර්තාව X41 වශයෙන් සටහන් කර ඇති බවත් ඒ අතරින් වඩාත් සුදුසුකම් ලත් ආයතන 02 ක ලෙස Energy System හා Aroma Agro ආයතන දෙක හඳුනාගත් බවත් ඒ අනුව එම ආයතයන දෙකට ටෙන්ඩර් ලබා දුන් බවත් ටෙන්ඩරයට අනුකූලව කටයුතු නොකල නිසා එම ටෙන්ඩරය අවලංගු බවත් ප්‍රකාශකර සිටී. එම නිසා ටෙන්ඩර් කැඳවා නැවත ආයතන දෙකකට එනම් Solid Waste Management Ltd , Western Power (pvt) Ltd හට ටෙන්ඩර ලබා දුන් බවත් Western Power (pvt) Ltd ආයතනය ටෙන්ඩරය අනුව කටයුතු නොකළ බවත් Western Power ආයතනය ටෙන්ඩරය බාරගෙන නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමක් අතුසන් කල බවත් මධ්‍යම පරිසර අධිකාරියෙන් අවශ්‍ය පරිසර බලපත්‍රය ලබා ගත් බවත් මහජන විරෝධතා නිසා මෙම ව්‍යාපෘතිය ද ආරම්භ කිරීමට නොහැකිවූ බව වැඩි දුරටත් ප්‍රකාශ කර සිටි.

මෙම ටෙන්ඩර් කැඳවීමේදී ක්‍රම දෙක ඔස්සේ ටෙන්ඩර් කැඳ වූ බවත් එනම් කසල බැහැර කිරීමට ඉඩමක් සහිත සහ කොළඹ මහ නගර සභාව සතු ඉඩමකට කසල බැහැර කිරීම යන ක්‍රම දෙක ඔස්සේ බවත් ප්‍රකාශ කර සිටී.

මීතොටමුල්ල කසල අංගනය භාරව කටයුතු කිරීම සඳහා සිවිල් සහ යාන්ත්‍රික වශයෙන් ඉංජිනේරු කුමාරනායක සහ යාන්ත්‍රික ඉංජිනේරු සම්පත් අබේසිංහ යන අය බවත් ඔවුන්ට නිකුත්කර ඇති රාජකාරී ලැයිස්තු X 100 A, X100 B, වශයෙන් සලකුණු කර ඉදිරිපත් බවත් මෙම ඉංජිනේරුවරුන් විසින් තමන්ව ඉදිරිපත් කරන වාර්තා තුලින් මෙම ස්ථානයට කොළඹ මහ නගර සභාවෙන් සහ කොලොන්නාව නගර සභාවෙන් බැහැර කරන අපද්‍රව්‍ය වලට බාහිර ව වෙනත් ආයතන වලින් ද අපද්‍රව්‍ය බැහැර කරන බවට වාර්තා ඉදිරිපත්කර තිබුණ බවත් ඒවා ලිඛිතව නොතිබුණ බවත් එසේ කරන බව දැනගෙන සිටි බවත් ප්‍රකාශ කර මේ සම්බන්ධයෙන් Abans සහ Care Cleans ආයතනවල වාහන හා කොලොන්නාවේ නගර සභාවේ වාහන ලැයිස්තුව වැල්ලම්පිටිය පොලීසිය වෙත බාරදුන් බවත් මෙම අංගනය පවත්වාගෙන යාම පිළිබඳ බලය කොළඹ මහ නගර සභාව සතුව තිබුණ බවත් කොලොන්නාව නගර සභාවේ වාහන වලට හැර වෙනත් කිසිම වාහනයකට කුණු බැහැර කිරීමට අවසර නොදුන් බවත් ආරක්ෂාව පිළිබඳ බලය තිබුනේ වැල්ලම්පිටිය පොලිසියට බවත් අවසර ලත් වාහන පරික්ෂා කර ඇතුලට යැවීම ඔවුන්ගේ රාජකාරිය බවත් කොලොන්නාව නගර සභාවේ වාහන වලට අමතරව පුද්ගලික සමාගම් වලටද කොලොන්නාව නගර සභාව අවසර දී ඇති බවත් එසේම කොලොන්නාව නගර විසින් සභාව අවසර දී ඇති එම වාහන වල අංක කොළඹ මහ නගර සභාව කොලොන්නාව නගර සභාවෙන් ඉල්ලා යැවූ බවද ප්‍රකාශ කර සිටී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 218/09 දරණ නඩු තීන්දුව අනුව ස්ථානයට කසල දැමීම ආරම්භ වුවත් ඊට පෙර කොලොන්නාව නගර සභාව මෙම ස්තානයට කසල දැමූ බවත් කොළඹ මහ නගර සභාව එම නඩුවේ පාශර්ව කරුවන් නොවූ බවත් ප්‍රකාශ කර සිටී.

තමන් 2015 නොවැම්බර් මාසයේ ඝන අපද්‍රව්‍ය අංශයේ ප්‍රධානියා හැටියට වැඩ බාරගත් බවත් මතක හැටියට 2016 අප්‍රේල් මාසයේ අවදානම් තත්වයක් තිබෙන බව සභාවට වාතර්‍ා කළ බවත් එසේම මේ වන විට කුණු දැමීමට තැනක් නොමැති නිසා කුණු කන්දේ පරණ කුණු ඉවත් කර ඉඩ ලබා ගැනීමට කටයුතු කල බවත් ඒ සඳහා 2016 නොවැම්බර් මාසයේ ටෙන්ඩර් කැඳවීමක් කළ බවත් 2017 ජනවාරි මාසයේ සභාවට එය ඉදිරිපත් වී අනුමත වීමට සූදානම් වන විට 2017 අප්‍රේල් 14 දා වෙද්දි කුණු කන්ද කඩා වැටුණු බවත් ප්‍රකාශ කර සිටී.

මීට තවත් කෙටි කාලීන සහ වෙනත් යෝජනාවක් හැටියට කසල බැහැර කිරීමට කුලියට ඉඩමක් ලබා ගැනීමට සම්බන්ධයෙන් යෝජනාවක් ද ඉදිරිපත් කළ බවත් එසේම මේ සම්බන්ධයෙන් යෝජනා කීපයක් ඉදිරිපත් කළ බවත් තමුන් ඉදිරිපත් කළ යෝජනා සියල්ල ම සභාව තීරණයක් නොගෙන කල් දැමූ බව ප්‍රකාශ කර සිටි. මෙම ස්ථානයේ කසල බැහැර කිරීමේ කටයුතු තවදුරටත් එලෙසම පවත්වාගෙන යැමෙන් බලපෑම් වලට ලක් වන පාශර්වයන්ට වෙනත් ස්ථාන ලබා දීමේ යෝජනාවක් ද ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර සිටී.

කෙසේ නමුත් 2015 කාලය වන විට කුණු බැහැර කරන්න තැනක් නොතිබුණ බවත් ඒ අනුව නගර සභාවෙන් මුදල් දී පදිංචිකරුවන් ඉවත් කරලා අංගනය විවෘත කල බවත් කොළඹ කුණු දමන්න තැනක් නොමැතිවීම නිසා එය කළ බවත් ප්‍රකාශ කර සිටී.

**ලවනි වනිතා ගයංගනී ප්‍රනාන්දු මහත්මිය. (සිවිල් ඉංජිනේරු)**

කම්ටුවේ අංක 05 හා 07 යටතේ සඳහන් කරුණු පිළිබඳව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාව පිළිබඳ (1836/6 2013.11.11 ගැසට් පත්‍රය) ව්‍යවස්ථාවේ 31 A ව්‍යවස්ථාව අනුව කොළඹ මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අංශයත් නගර සැලසුම් අංශයත් යන දෙකම අයත්විය යුත්තේ සමාජ සේවා සහ සංවර්ධන දෙපාර්තමේන්තුවට බවත් නමුත් එය දැනට ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යන බවත් එය බලය අයුතු ලෙස යොදවා ගැනීමක් බවත් ප්‍රකාශ කර සිටී. (පිටු අංක 121) එසේම මුදල් අමාත්‍යාංශය ද අනුමත කර ඇති 2013.01.01 දිනෙන් යුතු කොළඹ මහ නගර සැලසුම් අංශයත් සමාජ සේවා සහ සංවර්ධන අංශයට ඇතුලත් විය යුතු බව ප්‍රකාශ කරමින් ගැසට් නිවේදනයේ අදාල පිටුව X43 වශයෙන් ද කායර් මණ්ඩල වාර්තාව X44 වශයෙනුත් සටහන් කර ඉදිරිපත් කර සිටී. එසේම අදාල ගැසට් නිවේදනය 2 A පිටුවේ සඳහන් ඉංජිනේරුවරයෙකුගේ කායර්ය භාරයට ඝණ අපද්‍රව්‍යයත් නගර සැලසුමත් අයත් නැති බව ප්‍රකාශ කර සිටී. එසේම දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට ඉංජිනේරුවන් ඇත්තේ හත් දෙනෙකු බවත් ලංකාවේ අගනුවර වන ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවට ඇත්තේ ඉංජිනේරුවරුන් තුන් දෙනෙකු බවත් කොළඹ මහ නගර සභාවට ඉංජිනේරුවන් 75 පමණ සිටින බවත් ප්‍රකාශ කර සිටී.

එසේම 2013.08.22 දින ලංකාදීප පත්‍රයේ පල වී ඇති ප්‍රවෘත්තියක් X45 වශයෙන් සටහන් කරමින් කොළඹ මහ නගර සභාවේ කම්කරුවන් 2000 ක් පමණ වැඩ නොකර පිං පඩි ලබා ගන්නා බවත් ඔවුනගේ සේවය නිසියාකාරයෙන් ලබා ගත්තා නම් කොළඹ කැලි කසල ප්‍රශ්ණය සම්පූණර්යෙන්ම විසඳා ගැනීමට හැකියාව ලැබෙන බවත් ප්‍රකාශ කරමින් ඉඩම් සහ පරිසර සංවර්ධන අංශයත් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අංශයත් නගර සැලසුම් අංශයත් ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවට සහ කායර් මණ්ඩල වාර්තාවට අනුව සමාජ සේවා හා සංවර්ධන දෙපාතර්මේන්තුවට හැකි ඉක්මණින් අනුබද්ධ කල යුතු යැයි යෝජනා කරමින් ලංකාවේ අනෙකුත් දීප ව්‍යාප්ත සේවාවක් අනුව නගර සභාවේ ද අවුරුදු 10 කට වැඩි සේවාවක් කර ඇති සියළුම ඉංජිනේරුවරුන් ස්ථාන මාරු කරන ලෙස ද ඉල්ලා සිටී.

එසේම 2017.06.20 දිනැති ලංකාදීප පත්තරයේ පල වී ඇති කොළඹ කසළ සම්බන්ධ ලිපිය X46 වශයෙන් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ එම ලිපිය අනුව කොළඹ මහ නගර සභාව වසරකට කසළ බැහැර කිරීම සඳහා රුපියල් කෝටි 140 ක් වියදම් කරන බවත් කසළ ටෙන්ඩරය එක්වරම අවුරුදු 04 කට ප්‍රධානය කර ගිවිසුමකට එළඹෙන බවත් ආයතන ප්‍රධානීන් හැටියට නාගරික කොමසාරිස් හා පළාත් පාළන කොමසාරිස් (බස්නාහිර පළාත) මෙම ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු වෙනවාද යන්න නිරන්තරයෙන් පරීක්ෂාකල යුතු බවත් පළාත් පාලන කොමසාරිස් යටතේ විමශර්න නිලධාරීන් 70 ක් පමණ සෙවයේ යෙදෙන බවත් ඔවුන්ගෙන් කිහිපදෙනෙකු යොදවා කසලට වියදම් වියදම් කරන ආකාරය විමශර්නය කිරීමක් කළ යුතුව තිබුණු බවත් එසේ නොකිරීමෙන් කොමසාරිස්වරිය කොළඹ මහ නගර සභාවේ මුදල් පරිහරණය නිසි පරිදි සිදුවෙනවා දැයි පරික්ෂා කර නොමැති බවත් ප්‍රකාශ කර සිටී.

එසේම Daily Mirror ඉංග්‍රීසි පුවත්පතේ පල වූ ලිපියක කොටසක් X47 ලෙසද ආයතන සංග්‍රහයේ 11 නි කාණ්ඩයේ 48 වෙන් පරිච්ඡේදයේ වගකීම් කිහිපයක් එනම් 4.1 සහ පළමුවන උප ලේඛනයේ 8.1 ,8.2 වගන්තිවල 1,2,7,8,9,10,15,16 වරද වලටද අවධානය යොමු කරමින් ඉල්ලා සිටින්නේ කසළ බැහැර ලීමට සම්බන්ධයෙන් අපරික්ෂාකාරිව මුදල් පරිහරණය කිරීම පිළිබඳව පරික්ෂා කර බලා අදාල අයට විනයානුකූලව කටයුතු කරන ලෙසට ඉල්ලා සිටී.එසේම 13 නි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 නි වගන්තියද කමිටුවේ අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටිමින් මහ නගර සභා ආඥාපනතේ 129,130 යන වගන්තිවල මහජන සෞඛ්‍ය පිළබඳව සඳහන් වන බවත් එම වගන්තිවල කසළ කළමණාකරණය පිළිබඳව සඳහන් වන බවත් ඒ අනුව කොළඹ කසළ කළමණාකරණය නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරියට කළ යුතුද යන්න පිළිබඳව කම්ටුවේ

අවධානය යොමුකළ යුතු බවත් ප්‍රකාශ කර සිටී.එසේම මහ නගර ආඥා පනතේ 129 හා 130 වගන්ති පිළිවෙලින් X 51 සහ X 52 යනුවෙන් සලකුණු කරමින් ප්‍රකාශ කර සිටියේ කසළ මහ නගර සභාව සතු දේපළක් නම් පුද්ගලික ආයතනයන්ට කසළ කළමණාකරණය භාර නොදිය යුතු බවයි.එසේම බස්නාහිර පළාත තුල කසළ කළමණාකරණය උදෙසා අධිකාරියක් ස්ථාපිත කර ඇති බවත් කසල නගර සභාව සතු දේපළක් නම් කළමණාකරණය පළාත් සභාව සතු කර ගැනීමට නීත්‍යානුකූල නොවන බව තමාගේ අදහස බවයි.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 නි සංශෝධනයේ 09 වැනි උප ලේඛනයේ 1 වෙනි ලැයිස්තුවේ 4 වෙනි ඡේදයේ පළාත් සභාවක් කිසි විටකත් පළාත් පාලන ආයතන සතු බලතලයක් පවරා ගැනීමට නොහැකි බවට සඳහන් වන බවත් ඒ අනුව මහ නගර සභාවක කසළ සම්බන්ධව කටයුතු කිරීමට පළාත් සභාවකට බලය තිබෙද යන්න පිළිබඳ කමිටුව සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කර සිටී.

**සාම විනිසුරු උපුල් ධම්මික මහතා.**

තමා කොළඹ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටි හෙක්ටර් පෙරේරා මහතාගේ පෞද්ගලික ලේකම් වශයෙන් ද බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයෙකුගේ ෙසම්බන්ධීකරණ ලේකම් වශයෙන්ද කටයුතු කළ බවත් මේ නිසාම තමාට කොළඹ මහ නගර සභාව සම්බන්ධයෙන් මනා දැනීමක් තිබෙන බවත් ප්‍රකාශ කර සිටී.

තමාගේ දැනීමේ හැටියට ලංකාවේ වැඩිම කසළ නිෂ්පාදනය කරන ආයතන කොළඹ මහ නගර සභාවේ බවත් එය ලංකාවේ සියළුම පළාත් පාලන ආයතන විසින් එකතු කරනු ලබන කසළ ප්‍රමාණයට වඩා වැඩි කසල ප්‍රමාණයක් කොළඹ නගර සභාව එකතු කරන බවත් 1978 වෂර්යට පෙර කසළ එකතු කිරීම ජන සෞඛ්‍ය දෙපාතර්මේන්තුව යටතේ සිදු වූ බවත් ඒ අවධියේ එම කායර් මහ නගර සභාව සාථර්කව ඉටු කළ බවත් 1977 මහ මැතිවරණයෙන් පස්සේ 1979 වෂර්යේදී අළුතින් නගර සභාවක් තේරී පත් වුණ බවත් එම නගර සභාවට විශාල වශයෙන් කම්කරුවන් බඳවා ගත් බවත් බඳවා ගත් කම්කරුවන්ට ප්‍රමාණවත් වැඩ කොටසක් නොතිබුණ බවත් ඒ නිසාම චෙක් රෝල් ලකුණු කිරීමෙන් පස්සේ ගෙදර යැමට පුරුදු වුණ බවත් පසුව මෙය නගර සභාවට බරපතල ගැටළුවක් බවට පත්වුණ බව ප්‍රකාශ කර සිටී.

1990 වෂර් වල නගරාධිපති ධූරයට පත්වූ කරු ජයසූරිය මහතාට මෙය පාලනය කර ගැනීමට නොහැකි වුණ නිසා කසළ කළමණාකරණය පෞද්ගලික අංශයට බාරදීමට කටයුතු කළ බවත් පළමු ව මෙම කායර්ය කොටුව පිටකොටුව ප්‍රදේශවල සීමා වූ බවත් අනතුරුව පුද්ගලික අංශය මැදිහත්වීමෙන් සිදු කරන කසල කළමණාකරණය විධිමත් බව පෙන්වමින් නිලධාරීන් පුද්ගලික ආයතන වලට කසළ කළමණාකරණය බාර දීමට ක්‍රියා කළ බවත් මෙය ලාභදායක කටයුත්තක් බැවින් පුද්ගලික ආයතන ද කසළ ටෙන්ඩරය ලබා ගැනීමට දේශපාලඥයන්ට සහ නිලධාරීන්ට අල්ලස් ලබා දීමට ක්‍රියා කළ බවත් ප්‍රකාශ කර සිටී.

ඉතා ඉහළ මට්ටමේ ඉංජිනේරුවන් වෛද්‍යවරුන් වැනි විශේෂඥ නිලධාරීන් සිටින කොළඹ මහ නගර සභාවට කසළ කළමණාකරණය කිරීමට විධිමත් වැඩ පිළිවලක් සකස් කිරීමට අසමත් වූ නිසා පුද්ගලික අංශය මෙම කායර්ය සිදුකර විශාල ලාභයක් ලබා ගත් බවත් කසළ කළමණාකරණයේ දී පුද්ගලික අංශය ද කසළ බැහැර ලීමට පළාත් පාලන ආයතන වලද අනුමැතිය ලත් ඉඩමක් තමා සතුව තිබෙන බවට සාධක ඉදිරිපත් කළ යුතු වුවත් කිසිම ආයතනයක් එවැනි ඉඩමක් තම ආයතනය සතුව තිබෙන බවට සාධක ඉදිරිපත් නොකර

ටෙන්ඩර් ලබා ගත් බවත් සියළුම කසළ බ්ලූමැණ්ඩල් අංගනයට බැහැර කළ බවත් පසුව එම කසළ මීතොටමුල්ලට බැහැර කළ බවත් ප්‍රකාශ කර සිටී.

කුණු කන්ද විශාල වශයෙන් වැඩි වූ නිසා දිරාපත් වුණ කොටස් වැඩි වූ බවත් ඒවා අයින් කිරීමට නගර සභාව තීරණය කර ඒ අනුව ටෙන්ඩර් කැඳ වූ නමුත් අඩුම ටෙන්ඩරයට එය ලබා නොදුන් බවත් ඒ අනුව අඩුම ටෙන්ඩරයට පිරිනැමුවා නම් කසල කන්දේ විශාල ප්‍රමාණයක් බැහැරට ගෙන යෑමේ අවස්ථාව උදා වෙන බවත් මේ අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරන අධ්‍යක්ෂක වරිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කළ බවත් ප්‍රකාශ කර සිටි.

නැගෙනහිර කොළඹ කසළ කළමණාකරණයට ටෙන්ඩර් 03 ක් ඉදිරිපත් ඇති බවත් අබාන්ස් ආයතන වසරකට මිලියන 10 ක්ද බනර්ජ් ආයතනය වසරකට මිලියන 08 ක්ද සුපර් කොම්පෝස්ට් හෝමාගම ආයතනය මිලියන 7 කටද ටෙන්ඩර් ඉදිරිපත් වී ඇතත් වැඩිම මිල ගණන් ඉදිරිපත් වී ඇති අබාන්ස් ආයතනයට ටෙන්ඩරය ලබා දී ඇති බවත් ප්‍රකාශ කර සිටී.

කසළ කලමණාකරණයේ මූලික පරමාථර්ය විය යුත්තේ කසළ එක්රැස් කිරීම අවම කර ගැනීම බවත් නමුත් පුද්ගලික අංශයේ පරමාථර්ය වූයේ එකතුවන කසළ ප්‍රමාණය වැඩි කර ගැනීම බවත් කසළ වැඩිවන විට පුද්ගලික අංශයේ ලාභයත් නිලධාරීන්ට ලැබෙන් වරප්‍රසාද වැඩි වූ බවත් වෙනත් පළාත් පාලන ආයතන කසළ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවන් තුළින් කසල ප්‍රශ්ණයට විසඳුමක් දීමට උත්සහා කරද්දී විශේෂඥ දැනුමෙන් සහ මානව සම්පත් වලින් පෝසත් කොළඹ මහ නගර සභාව කසළ ප්‍රශ්ණයට විසඳුමක් ලබා දීමට ක්‍රියා නොකලේ මන්දැයි කමිටුව විසින් සොයා බැලිය යුතු බව ප්‍රකාශ කර සිටී.

## මහින්ද කහඳගම මහතා.

දිනකට කොළඹ මහ නගර සභාවට කසල ටොන් 700 ක් 800 ක් අතර ප්‍රමාණයක් එකතුවන බවත් දිසා කායර්ාල 4 ක එක්රැස්වන කුණු කසල එකතු කිරීම බැහැර කිරීම ටෙන්ඩර් කැඳවා අබාන්ස් සහ කෙයාර් ක්ලීන් ආයතන වෙත බාර දී ඇති බවත් 2009 වසර තෙක් බ්ලූමැන්ඩල් අංගනයට කසල දැමීම සිදුවූ බවත් 2009 පසු ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයකට පටහැනිව මීතොටමුල්ල කඩා වැටෙන තෙක්ම මීතොටමුල්ලට කසළ දැමූ බවත් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් අනුව අක්කර 02 ක භූමි ප්‍රමාණයක කුණු දැමීම සිදු කල යුතු වුවත් අක්කර 22 ක පමණ වපසරියක් ඒ සඳහා භාවිතා කළ බව ප්‍රකාශ කර සිටී.

2009 වශර්යේ මීතොටමුල්ලට කුණු දැමීම ආරම්භ කළ පසු කුණු කන්ද රේට්ස් ක්‍රමයට සමතලා කිරීම සඳහා ජයලත් නැමැති සමාගමෙන් වාහන කුලියට ගත් බවත් ඒ සඳහා 2010 වසර සඳහා මිලයන 34 ක් වැය වූ බවත් 2014 දී එය මිලියන 64 ක් වූ බවද 2015 වසරේ වී.කේ. අනුර මහතා නාගරික කොමසාරිස් තනතුරට පත් වූවායින් පසුව එය මිලියන 182 ක් වූ බවද මෙය 2014 වසර සමග සසඳන විට 4 ගුණයක වැඩි වීමක් බවත් 2016 වසර වන විට මෙය මිලියන 232 ක් බවට පත්වූ බවත් නාගරික කොමසාරිස්ගේ මෙම ක්‍රියාව දැනගත් හිටපු නගරාධිපති වරයා මෙම කායර්ය සඳහා වාහන කුලියට ගැනීම වෙනුවට සභාවට වාහන මිලදී ගැනීම සුදුසු බව සාකච්ඡා කර සභාවට වාහන මිලදී ගැනීමට යෝජනා සම්මත කල බවත් ප්‍රකාශ කර සිටී. මෙතරම් විශාල මුදලක් වියදම් කර කසල කන්ද සමතලා කරා නම් කසල කන්ද කඩා වැටුනේ ඇයි දැයි සොයා බැලිය යුතු බවත් මෙහි විශාල මුදල් වංචාවක් තිබෙන බවත් කසල කන්දේ වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන අංශයෙන් විමසීම් නොකර ගෙවීම් කරන ලෙසට නියෝගයක් නාගරික කොමසාරිස් වී.කේ . අනුර මහතා දී ඇති බවත්, එම

නියෝගය ඇතුලත් චක්‍රලේකය X 52 වශයෙන් සටහන් කර ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටී.

මෙම කසල බහාලන ස්ථානය නඩත්තු කිරීමේදී එක්ස් වේටර් යන්ත්‍ර යොදා මෙම කසල සමතලා කල යුතු බවත් එයට උඩින් ප්‍රමිතියකින් යුතු පස් දැමීමත් සිදු කල යුතු බවත් එසේම මෙම අංගනයට කසල ලබා ගත යුත්තේ බර කිරන යන්ත්‍රයක් මගින් කසල මිනුම් කිරීමෙන් පසුව බවත් මෙම යන්ත්‍රය අවුරුදු 03 ක් තිස්සේ පාවිච්චි කිරීමට නොහැකි ලෙස අක්‍රීය වෙලා තිබුණත් නාගරික කොමසාරිස් වරයා ඒ පිළිබඳව කිසිම පියවරක් නොගත් බවත් ඒ නිසා බර කිරීමකින් තොරව කසල ටොන් ගණන් අංගනය ඇතුලට ගිය බවත් මේ සම්බන්ධයෙන් මහ සභාවේදී ද මුදල් කාරක සභාවේදී ද ප්‍රශ්න ඉදිරිපත් වූ බවත් පසුව නාගරික කොමසාරිස්වරයා තනතුරෙන් ඉවත් කරන්න කියා ආණ්ඩුකාර තුමාට පෙත්සමක් ඉදිරිපත් කළ බවත් ප්‍රකෘශ කර සිටී.

මෙම අවස්ථාවේදී දිසා අංක 1 ඝණ අපද්‍රව්‍ය කළමකරණ සේවා සැපයීම අවලංගු කිරීම පිළිබඳව එම කොන්ත්‍රත්තුව ලබා ගත් Care Cleans පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක ජෙහාන් ප්‍රනාන්දු මහතා වෙත 2015.11.06 දිනෙන් යවන ලද ලිපියක් X 54 යටතේ ඉදිරිපත් කරමින් සේවා සැපයීම ඉතා දුවර්ල තත්වයක පවතින බව සඳහන් කරමින් 2015.11.06 දින මධ්‍යම රාත්‍රියේ සිට කොන්ත්‍රාත්තුව අවලංගු කරන බවත් දන්වා ඇති බව ප්‍රකාශ කර සිටිමින් අබාන්ස එන්වයරමන්ට් සවරීස් ආයතනය සමග දිසා අංක 01 ප්‍රදේශයේ කසල කළමණාකරණ සේවාව සම්බන්ධයෙන් ඇති කර ගත් ගිවිසුමක් ඇති කර ගත් බව ප්‍රකාශ කර සිටි. 2014 වෂර්යේ කසළ ටොන් 01 කට රු.1834 ක් ගෙවූ බවත්, 2015 සහ 2016 වසර වල කුණු ටොන් 1 කට රු.4900 ගෙවී බවත් 2015 වෙද්දී 2014 මෙන් පස් ගුණයක් ගෙවන්න සිදුවූ බවත්, සභාව පවතින කාලයේ අවුරුදු 04 කට ටෙන්ඩරය එක්වර දුන් බවත් ප්‍රකාශ කර සිටිමින් තමා කියන දේ තවදුරටත් පැහැදිලි කිරීම සඳහා X 56 සිට X 58 දක්වා ලේඛන ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදි.

දිසා අංක 05 සහ 2 බී ප්‍රදේශයන් වල කසළ කළමණාකරණයට ඉදිරිපත් වූ ටෙන්ඩර ඉතා ඉහළ මට්ටම්වල පැවැති නිසා සභාව විසින් ටෙන්ඩර පිරිනැමුවද සභාව විසිරුවා හැරීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටුවල තීරණය නොසලකා තනි මතයට ටෙන්ඩරය පිරිනමා ඇති බවත්, මේ හේතුව නිසා 2012 වසරේ රු.මිලියන 59 ක් පැවැති වියදම 2016 වන විට වසරකට රු.මිලියන 1400 බවට පත් වූ බවත් එමෙන්ම 2010 වසරේ රු.මිලියන 34 ක්ව පැවැති මීතොටමුල්ල වාහන කුලියට සැපයීමේ වියදම 2016 වන විට රු. මිලියන 232 ක් බවට පත් වී ඇති බව ප්‍රකාශ කර සිටී.

ඒ වගේම 2010 වසරේ දී කසල කන්ද සමතලා කිරීමට රු.මිලියන 34 ක් වැය වී ඇති අතර 2016 වෙද්දී එය මිලියන 232 දක්වා මිලියන 198 කින් වැඩිවී ඇති බවත්, සමතලා කිරීමට මෙතරම් මුදල් වියදම් කලා නම් කන්ද කඩා නොවැටෙන බව ප්‍රකාශ කර සිටී.(පිටු අංක 136 ) කුණු කන්දේ දුගර්න්ධය නැති කිරීම පිණිස රසායනික (RYDALL) ද්‍රව්‍යක් මිල ගණන් කැඳවීමකින් තොරව නුගේගොඩ ග්ලාස් කම්පැනිය නැමැති ආයතනයකින් ලබා ගැනීමට ඝණ අපද්‍රව්‍ය අධ්‍යක්ෂවරියගේ නිදෙර්ශයක් මත යොජනාවක් ඉදිරිපත් වූ බවත්, නමුත් එය නතර වූ බවත්, පසුව වෙනත් ආකාරයකින් මිලදී ගෙන පෙර මාසයේ කන්දට දැමූ බවත් ප්‍රකාශ කර සිටිමින් තමන් ප්‍රකාශ කරන කරුණු සනාථ කිරීමට නගර සභාවේ මුදල් කමිටුවේ අංක ME/MESW/21/2017 ඇතුලත් වාතර්ාව ද කා/සභා/පාලන/REU 2017 හා 2017 ජුලි 05 දින ඝණ අපද්‍රව්‍ය බහාලන ස්ථානයේ දුගඳ නැති කිරීමට RYDALL මිලදී ගැනීමට ගෙවීම් කළ

වාතර්ාවල සහ යුනයිටඩ් ග්ලාස් ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය විසින් 2017 මාතර්ු 17 ලිපිය පරීක්ෂණ සභාවට ඉදිරිපත් කරන ලදි.

**දීගල ගොඩ ගමගේ සම්පත් සංජීව මහතා.**

වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ 2016/12/04 වන දිනයේ සිට අද දක්වා ස්ථානාධිපති වශයෙන් සේවය කරන බවත්, මීතොටමුල්ල පොතුවිල් කුඹුර නැමැති ස්ථානයේ කොළඹ මහ නගර සභාව විසින් කසළ බැහැර කිරීමේ අංගනයක් පවත්වා ගෙන ගිය බවත්, එම ස්ථානයේ පොලිස් මුර පොලක් වැල්ලම්පිටිය පොලිසියට අනියුක්ත ව පවත්වාගෙන ගිය බවත්, එහි සේවයට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු දිවා රාත්‍රී යොදවා තිබූ බවත්, අනවසර වාහන සහ අනවසර කසළ බැහැර කිරීම නැවැත් වීමටත් සාමය පවත්වා ගෙන යාමේ කටයුතු කිරීමටත් පොලිසිය යොදවා තිබූ බව ප්‍රකාශ කර සිටි.

මෙම ස්ථානයට වැල්ලම්පිටිය පොලිසියේ අධීක්ෂණය යටතේ පැවති බවත්, දූරකථන ලේඛනය සහ තොරතුරු ලේඛන නමින් ලේඛන දෙකක් පවත්වා ගෙන ගිය බවත්, අනවසර වාහන පරීක්ෂා කිරීමට බලයක් තිබුණු බවත් කොළඹ මහ නගර සභාවේ අනුදැනීමකින් තොර ව කිසියම් පාශර්වයකට මෙම ස්ථානයට කුණු දැමීමට අවසරයක් තමා දන්නා පමණික් නොතිබුණ බවත්, ප්‍රකාශ කර සිටි.

වැඩ භාර ගත් 2016/12/04 දිනයේ සිට සිද්ධිය සිදු වුන 2017 අප්‍රේල් මස 14 වන දින දක්වා කාල පරාසය තුළ එනම් 2017/04/02 දින වසන්ත රාළහාමි නම් අයෙකු දූරකථනයෙන් කරන ලද පැමිණිල්ලක් අනුව මෙම ස්ථානයට ගොස් පරීක්ෂා කල බවත්, එයට ග්‍රාම සේවක නිලධාරි මහතාවත් සහභාගි කරවා ගත් බවත්, එහිදී ගෙවල් වල බිත්ති පුපුරා පොළව ඉරිතලා තිබුණ දුටු බවත්, ඒ අවස්ථාවේ දී එතන ම දූරකථනයෙන් කතා කරා ප්‍රාදේශීය ලේකම්වත් දැනුවත් කල බවත්, ඒ අනුව ප්‍රාදේශීය ලේකම් ගෙන්වා ගත බවත්, මේ පිළිබඳ ව පසුව ප්‍රාදේශීය ලේකම්ව ලිඛිත ව ලිපියකින් දැනුවත් කල බවත්, එම ලිපිය X63 වශයෙන් සටහන් කර ඉදිරිපත් කරන බවත් පසුව ප්‍රාදේශීය ලේකම් ස්ථානයට පැමිණ ස්ථාන පරීක්ෂාවක් කර පවුල් 10කට එතනින් ඉවත් වෙන්න දැනුම් දීලා තිබෙන බවත්, ඉවත් වූ පවුල් වලට මාසයකට රු.15000 බැගින් මාස 6 කට ගෙවල් කුලී කොළඹ මහ නගර සභාව ලබා දී ඇති බවත්, දැන් ගන්නට ලැබුණු බව ප්‍රකාශ කර සිටි.

2016 අප්‍රේල් 02 දිනෙන් පසුව මෙම ස්ථානයට තමා සම්බන්ධ වන්නේ 2017 අප්‍රේල් 14 වන දින ව්‍යසන තත්ත්වය ඇති වුණ දිනයේ බවත්, තමන්ට ඒ බව දැනුම් දුන්නන් සවස 119 දූරකථනයෙන් බවත්, ඒ අනුව එම ස්ථානයට මුලින් ම ගියේ පොලිසිය බවත්, තුවාලකරුවන් ගිලන් රථ ගෙන්වා රෝහල් වලට යැවූ බවත් යට වී සිටි මිනිසුන් බැකෝ යන්ත්‍ර යොදවා බේරා ගත් බවත් ත්‍රිවිධ හමුදාවත් මුදවා ගැනීමේ කටයුතු කල බවත්, මල සිරුරු 31 හමුවූ බවත්, අතුරුදහන් වීම් එකක් වාතර්ා වූ බවත්, මෙම ස්ථානය අවධානම් කලාපයක් හැටියට මෙම සිද්ධිය ඇති වන තෙක් ම හඳුනා ගෙන නොතිබූ බවත් ප්‍රකාශ කර සිටි.

**වෛද්‍ය ජගත් වරුෂ විතාන මහතා.**

දැනට ද සොයිසා කාන්තා රෝහලේ සේවය කරන බවත්, ඊට පෙර කොළඹ ජාතික රෝහලේ ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය නිලධාරියෙකු හැටියට ද සේවය කර ඇති බවත්, කසල කළමනාකරණය කළ යුතු ආකාරය ගැන 2014 දී ස්වීඩනයේ අධ්‍යයනයක් මෙන්ම පයෙර්ෂණ වල නිරත වූ බවද ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ල කසළ කන්ද අවුරුදු 10ක පමණ කාලයක සිට දැක ඇති බවත්, ජනාකීර්ණ ප්‍රදේශයක මෙවැනි කසල කන්ද තිබීම නුසුදුසු බවත්, මෙම කසල කන්දේ ඇති කසල පළමුව දිරන හා නොදිරන ලෙස කොටස් දෙකකට වෙන් කල යුතු බවත්, දිරාපත් වන කසල වලින් කොම්පෝස්ට් පොහොර සෑදිය හැකි බවත්, දිරිපත් නොවන කසල නැවත කොටස් කර විදුරු ප්ලිස්ටික් වශයෙන් තෝරා ප්‍රතිචක්‍රීකරනය කළ හැකි බවත්, ඉතිරි වන අපද්‍රව්‍ය ඉඩම් ගොඩ කිරීමට යොදා ගත හැකි බවත් ප්‍රකාශ කර සිටි.

ඒසේම කසළ ජීව ක්‍රියාකාරී තත්වයට ලක් කළ හැකි සහ නොහැකි වශයෙන් ද ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය බවත්, ප්‍රතිචක්‍රීකරනය කළ නොහැකි කසල බාදනය වළක්වීමේ කායර්න්ට යෙදිය හැකි බවත්, කාබනික ද්‍රව්‍ය වැනි දේවල් නැවත භාවිතයට ගත හැකි පරිදි විදුරු ප්ලාසටික් වැනි ද්‍රව්‍ය සෑදිය හැකි බවත් ප්‍රකාශ කර සිටි. මීට අමතර ව නාගරික අපද්‍රව්‍ය වල වැඩි පුරම ඇත්තන් 50% පමණ වතුර බවත්, ඒවා කොම්පෝස්ට් කල විට වතුර අඩුවත් බවත්, අධික පීඩනයට කසළ ලක් කිරීමෙන් පසු RDF (Refuse Derail Fuel) සෑදිය හැකි බවත්, මෙම RDF දිග කණුවක් හැඩය ගන්නා අතර ඒවා chain වල යැවූ විට කැලි වලට කැඩෙන බවත්, මේවා දහනය කිරීමෙන් තාපය හා බලය ලබා ගත හැකි බවත්, එවැනි ආයතනයක් එනම් Machines Complex එකත් සෑදීමට වියදම් වන්නේ රුපියල් කෝටි 40ක් පමණ බවත්, චිනය වැනි රටවල මෙන් මෙම ක්‍රමය අනුගමනය කර විදුලිය බලය උත්පාදනය කිරීමේ ප්‍රධාන ව්‍යාපෘති ආරම්භ කිරීමේ හැකියාවක් තිබෙන බවත් වැඩිදුරටත් කියා සිටි.

මේ අනුව තමන්ගේ ප්‍රධාන යෝජනාව වනුයේ දිරන නොදිරන ලෙස කසළ නම් කර දිරන කසළ පොහොර වශයෙන් ද නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට හා RDF වලින් විදුලිය උත්පාදනය කිරීම බව ද ප්‍රකාශ කරමින් ස්වීඩනයේ අධ්‍යයනය කර සකස් කරන ලද කසළ කළමනාකරණ ක්‍රම වේදයන් පිළිබඳ ලියවිල්ලක් X64 වශයෙන් කමිටුවට ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටි.

ඒසේ ම මීතොටමුල්ල කසළ කන්දට පස් දැමීම පිළිබඳ අදහස් දක්වමින් කියා සිටියේ වෙන් නොකරන ලද කසළ ඇති ස්ථානයකට පස් දැමීමෙන් decompose වුනාට එය සාථර්ක ක්‍රියාවලියක් නොවන බවත්, ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය නිසා මීතේන් වායුව නිෂ්පාදනය වන බවත්, මෙම වායුව අනිවායෙර්න් ම පිටවිය යුතු බවත්, නමුත් පස් දැමීම නිසා ඇති වුන පීඩනය හේතු කොට ගෙන මෙම කන්ද පුපුරා යන්න ඇතැයි තමාගේ මතකය බවත් මීතේන් වායුව පිටවීමට ඉඩකඩ තිබුණා නම් මේ වගේ පිපිරීමක් සිදු නොවන බවත් මේ අනුව පස් දැමීම සාථර්ක පියවරක් හැටියට සලකන්නේ නැති බවත් ප්‍රකාශ කර සිටි.

මෙම කසළ කන්ද සම්බන්ධයෙන් තමා යෝජනා කරන්නේ කසළ කන්දට යටවී ඇති අක්කර 20ක ප්‍රමාණයෙන් අක්කර 10ක ප්‍රමාණයන් මුලින් ම වෙන් කරලා එහි එකතු වන කසළ වලින් RDF පිළියෙල කර විදුලිය නිපද වීම තුළින් අවුරුදු 15ත් 20ත් කාලය තුළ කසළ කන්ද ඉවත් කිරීමට හැකි බවත්, ඒසේ ම ඉතා සාථර්ක විසඳුම් හැටියට කියා සිටින්නේ මෙහි

Electricity Generations System ආරම්භ කිරීම බවත් කොටිකාලීන විසඳුම හැටියට යෝජනා කරන්නේ මෙම ස්ථානයට දැනට කුණු නොදමා සිටිම බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටි.

## රවින්ද්‍ර උදයශාන්ත මහතා. ( හිටපු සභාපති කොලොන්නාව නගර සභාව )

කොළොන්නාව නගර සභාපති වශයෙන් 2011.10.10 දින වැඩ බාරගෙන 2016 ජුනි මාසය දක්වා සභාපති තනතුර වැඩකටයුතු කල බවත්, තමන් සභාපති වශයෙන් පත්වන විටත් මීතොටමුල්ල පොතුවිල්කුඹුර නැමැති ස්ථානයට කසල දැමීම සිදු වූ බවත්, කොළඹ මහ නගර සභාව සහ පළාත් පාලන ආයතන කිහිපයක් ද මෙම ස්ථානයට කසල දැමීම සිදු කර ඇති බවත්, සභාපති තනතුරේ වැඩ භාර ගනිද්දි කසල කන්දේ කොම්පෝස්ට් අංගනය ආරම්භ කර තිබුණ නමුත් එය ක්‍රියාත්මක තත්වයේ නොතිබුණ බවත් අවුරුද්දත් පමණ කාලයක් සාර්ථකව ක්‍රියාත්මක කළ බවත්, පසුව කසල කන්දේ කසල ඒ මත කඩා වැටීම නිසා විනාශ වූ බවත් ප්‍රකාශ කරයි.

මීතොටමුල්ලට අක්‍රමවත්ව කසල බැහැර කිරීම පිළිබඳව සභාපතිවරයා වශයෙන් සොයා බැල්මක් සිදු කල නමුත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් අනුව කසළ දැමීම සිදු වූ බවත්, කොළඹ මහ නගර සභාව කසළ බැහැර කිරීම සිදු කර බැවින් කොලොන්නාව නගර සභාව ඒ සම්බන්ධයෙන් රාජකාරි වශයෙන් මැදිහත් වීමක් සිදු නොකළ බවත්, නමුත් ස්වයං රැකියා වල නිරත වූ අයට සභාපති තනතුරුට පත් වීමට පෙර තිබූ සභා සම්මුතියක් අනුව කසළ බැහැර කිරීම සඳහා අවසරය ලබා දුන් බවත් එසේම X 89 දරණ ලිපියේ සඳහන් වාහන සම්බන්ධයෙන් සභාපති වශයෙන් තමාගේ මැදිහත් වීමක් නොමැති බවත් ප්‍රකාශ සිටි.

මෙම කසල දමන ස්ථානය අවස්ථා කිහිපයකදීම නිරීක්ෂණයට ලක්වූ බවත්, එම ස්ථානයට ප්‍රවිෂ්ට වීමට ඇත්තේ එක් ප්‍රවේශ මාගර්යක් පමණක් බවත්, කසළ බැහැර කිරීමේ අරමුණින් එන වාහන එම ස්ථානයේ ඇති බර කිරන යන්ත්‍රයෙන් බර කිරීමක් සිදු කල බවත්, 2011 සහ 2012 කාල වල දී බර කිරීමක් සිදු කලත් ඊට පසු බර කිරීමක් සිදු නොකළ බවත් ප්‍රකාශ කර සිටී.

2011 සභාපති වශයෙන් පත්වූ විගසම 101 වත්තේ සහ දහම්පුර පදිංචි කරුවන්ගේ නිවාස පරික්ෂා කිරීමට ගිය බවත්, එහි දී ගිලා බැසීම් දුටු බවත්, ඒ අනුව කොළඹ මහ නගර සභාව නගරාධිපතිට හා නාගරික කොමසාරිස්ට ඒ බව දැනුම් දී ඒ අය ඉවත් කිරීමට කටයුතු කළ බවත්, පසුව හිටපු ආරක්ෂක ලේකම්ගේ දැනුම දීමක් අනුව පරීක්ෂණයක් කර අවදානම් අය ඉවත් කල බවත්, පසුව ප්‍රාදේශීය ලේකම් කායර්ාලය ලවා ද දහම්පුර ප්‍රදේශයේ අවදානම් නිවාස පිළිබඳ පරික්ෂාවක් කර ඒ අනුව අදාළ ආයතන දැනුවත් කල බවත්, 2012 සිට 2014 දක්වා ගෙවල් 500 ක් පමණ ඒ අනුව ඉවත් කළ බවත්, අවදානම් තත්ත්වයේ සිටි මිනිසුන් දැනුවත් කළ බවත්, ඒ අයට නිවාස සහ වන්දි මුදලක් ලබා දෙන ලෙසට පසුගිය රජයෙන් හා මෙම රජයෙන් ඉල්ලා සිටි බව ද ප්‍රකාශ කර සිටි. එසේම 2017 මාතර්‍ු 28 දින එනම් සිදුවීම සිදුවීමට සති දෙකකට පමණ පෙර දහම්පුර ප්‍රදේශයට ගිය බවත්, එහෙදී ඩෙංගු උණ සැදී ළමයෙකු මිය ගොස් සිටි බවත් එසේ පරික්ෂා කිරීමේ දී සමහර ගෙවල් කඩා වැටී පදිංචි වීමට බැරි තත්වයක් තිබුණ බවත්, ඒ බව පොලිසියට හා නාගරික කොමසාරිස්ට දැනුම් දුන් බවත් ප්‍රකාශ කර සිටී.

මේ අවස්ථාවේදී ඉහත ප්‍රකාශය තහවුරු කිරීමට මෙම අවදානම සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් ප්‍රාදේශීය ලේකම්, නාගරික සංවධර්න අධිකාරිය ඉදිරිපත් කරන ලේඛන X86 සිට X95 දක්වා ලකුණු කර ඉදිරිපත් කරන ලදි.

**මනෝරි ක්‍රිශාන්ති ප්‍රියදර්ශනී මහත්මිය.**

කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට අනුයුක්ත ව ඉඩම් නිලධාරියෙකු වශයෙන් දැනට අවුරුදු 05ක පමණ කාලයක් සේවය කරන බවත්, ඉඩම් නිලධිරිනිය වශයෙන් කොලොන්නාව ප්‍රාදෙශීය ලේකම් කොට්ඨාශයට අයත් රජයේ ඉඩම් වලින් බදු එකතු කරීමත් ක්ෂේත්‍ර රාජකාරිය රාජකාරියක් වශයෙන් පැවති ඇති බව ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ල කසළ අංගනය පිහිටි ඉඩම නිරීක්ෂණය කර නොමැති බවත්, මෙම ඉඩම කලින් රජයේ ඉඩමක් බවත් පසුකලක දී මෙම ඉඩම නාගරික සංවධර්න අධිකාරියට ප්‍රධාන පත්‍රයකින් පවරා තිබෙන බවත්, ඒ අවස්ථාවේ තමන් මෙම ඉඩමට ගොස් ඇති බවත්, එය කසළ නිරීක්ෂණය කිරීම සඳහා නොවන බවත්, සවෙර් ජෙනරාල්ගේ 2002/06/27 දිනැති අංක 85/36 දරණ මූලික පිඹුරේ අංක 1 වශයෙන් විස්තර කර ඇත්තේ මීතොටමුල්ල කසළ අංගනය පිහිටි ඉඩම බවත් ඉඩම පැවරීම සිද්ධ වෙලා තියෙන්නේ 2013 අවුරුද්දේ බවත් 2017.06.12 දිනැති ව ලිපියක් අනුව රජයේ ඉඩම් පනතේ 6 වන වගන්තිය යටතේ වූ දීමනා පත්‍රය අනුව විෂය ගත ඉඩම් කොටස රජයේ නාගරික සංවධර්ණ අධිකාරියට බැහැර වන දිනය නිශ්චිත ව ප්‍රකාශ කිරීමට නොහැකි බව ද ප්‍රකාශ කර සිටි.

නමුත් 85/36 දරණ මූලික පිඹුර අනුව නාගරික සංවධර්න අධිකාරියට යවා ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 18ක් බවත්, එය නිශ්චිතව අදාළ මූලාශ්‍ර ආශ්‍රයෙන් ඉදිරි දිනයක දී ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කර සිටි.

භූමි ප්‍රදේශය දීමනා බලපත්‍රයක් යටතේ නාගරික සංවධර්න අධිකාරියට පවරා ඇති බවත් දීමනා පත්‍රය අනුව හෙක්ටයාර් වලින් 8.347 ප්‍රමාණයන්ද එහ අක්කර වලින් ගත් විට අක්කර 20.62ක ප්‍රමාණයක්ට නාගරික සංවධර්න අධිකාරියට පවරා දී ඇති බව ප්‍රකාශ කර සිටි. එසේ ම මුල්න් ම දීමනා පත්‍රයක් 2013.11.10 දින දී ඇති බවත්, එම දීමනා පත්‍රය 2013.07.03 දින නැවත සංශෝධනය කර ඇති බවත්, 2003.11.10 දිනෙන් දී ඇති දීමනා පත්‍රය අනුව අරමුණ වී ඇතත් තට්ටු නිවාස ක්‍රමයක් ඉදි කිරීමට බවත්, 2013 ජුනි 3වන දින නිකුත් කර ඇති දීමනා පත්‍රය මඟින් තට්ටු නිවාස කියන එක ඉවත් කර නාගරික සංවධර්න යනුවෙන් සංවධර්නය කර ඇති බවත්, තමන් ප්‍රමාණයේ සංශෝධනයක් නැති බවත් පරමාථර්ය පමණක් සංශෝධනය වී ඇති බවත් ප්‍රකාශ කර සිටි.

මෙම සිද්ධිය සිදුවීමෙන් අනතුරුව කඩා වැටුණු කසළ කන්දේ වපසරිය දක්වන සැලසුමක් පිළියෙල නොකළ බවත්, එයට හේතුව ප්‍රධාන පත්‍රයකින් මෙම ඉඩම නාගරින සංවධර්න අධිකාරියට පැවරිම මඟින් ඉඩම් අයිතිය ප්‍රාදේශීය ලේකම් කායර්ාලය සතු නොවන බවත් ප්‍රකාශ කර සිටි.

## ජී. අනුර දීපාල් කුමාරනායක මහතා. (සිවිල් ඉංජිනේරු)

කොළඹ මහ නගර සභාවේ ඉංජිනේරුවරයෙකු වශයෙන් 2016.05.06 දින සිට නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අංශයට අයත් මීතොටමුල්ල කසළ අංගනය භාර ඉංජිනේවර්රයා වශයෙන් අනුයුක්ත ව සේවය කරන බවත්, කාවර්ව මණ්ඩලය පහත සඳහන් අයගෙන් එනම් සිවිල් ඉංජිනේරුවෙකු, යාන්ත්‍රික ඉංජිනේරුවරයෙනු සුපවයිසවර්රු දෙදෙනෙකුගෙන් සහ කම්කරුවන් 13 දෙදෙනෙකුගෙන් සමන්විත වූ බවත් මොවුන් දිවා රාත්‍රී වශයෙන් වැඩ මුර අනුව රාජකාරි කළ බවත්, දිවා කාලයකට කම්කරුවන් 10 දෙනෙකුත් රාත්‍රී කාලයට කම්කරුවන් තුන් දෙනෙකුත් සේවයේ යෙදූන බවත්, තමන්ගේ රාජකාරිය වූයේ කසළ අංගනයට ගෙන ආවාට පසු පස් ඇතිරීම ආදියට උපදෙස් දීම, කන්ද වටා ඇති ඇල පිරිසිදු කිරීම පසු ඇතිරීම නිසා දූවිලි ඇති බවත්, ඒවාට වතුර දැමීමට උපදෙස් දීම අධීක්ෂණය කිරීම ආදි කටයුතු බවත් ප්‍රකාශ කර සිටි.

කසළ අංගනය නිරීක්ෂණ කිරීම සඳහා සමහර සතිවල දිනවල යන දවස් තිබෙන බවත්, නැතිනම් දවසක් හැර දවසක් පරීක්ෂා කිරීමට යන බවත්, තමා නොයන දිනවල යාන්ත්‍රික ඉංජිනේරු ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බවත්, එසේ පරීක්ෂා කිරීමේ දී ඉරි තැලීම් සහ පිපිරීම් නිරීක්ෂණය වූ බවත්, ඒ බව ලිඛිත ව හා වාචික ව බලධාරීන්ට දැනුම් දුන් බවත්, ඒ බව සනාථ කිරීමට ලේඛන ඇති බවත්, අවසාන වශයෙන් වාතර්‍ා කිරීම සිදුකලේ 2017.03.27 දින බවත්, වාතර්‍ා කිරීම් සිදු කර ඇත්තේ නියෝජ්‍ය නාගරික කොමසාරිස් (ඉංජිනේරු) වෙත බවත්, පිටපතක් අධ්‍යක්ෂක ඝණ අපද්‍රව්‍ය අංශයට යොමු කර ඇති බවත් , එම වාතර්‍ාව මඟින් කසළ අංගනයට කුණු දැමීමෙන් වටේට ඇතිවන උඩුකුරු තෙරපුම් බලය නිසා පෙර කී ඉරි තැල්ම ඇති වී ඇති බව මගේ මතය බව මා දක්වා ඇති බවත්, තමන් නිවාස 23 ක් පරීක්ෂා නර තිබෙන බවත් ඉන් නිවාස 14ක් ම ඉවත් කිරීමට කටයුතු කළයුතු බවට දක්වා ඇත්තේ 2017.03.27 දින පරීක්ෂාවේදී බවත්, තමාගේ මෙම නිදෙර්ශයන්ට අනුකූල ව රුපියල් 15000 බැගින් වන්දි ගෙවීමට තීරණය කළ බවත් ප්‍රකාශ කර සිටි.

2017.04.06 වෙනි දින කොළඹ මහ නගර සභාවේ අධ්‍යක්ෂක ඉංජිනේරු තක්සේරුවරු ද පුණ්‍ය කොමසාරිස් කායර්‍ාලයේ නිලධාරීන් සහ පරිසර අධිකාරියේ නිලධාරීන් එකතු වී කේෂත්‍ර චාරිකාවක නිරත වූ බවත්, එහි අවදානම් සහිත නිවාස 193ක් හඳුනාගත් බවත්, එම ගෙවල් අංක කෙරු බවත් ඒ අතරතුර කන්ද කඩා වැටීම සිදුවූ බවත් ප්‍රකාශ කර සිටි.

කසළ අංගනයට පැමිණෙන කුණු අංගනයේ ඇති බර කිරන යන්ත්‍රයක් මගින් බර කිරා අංගනයට යැවීම තමන් රාජකාරි භාර ගැනීමට පෙර සිදු වී තිබූ ක්‍රමය තමුන් තමන් රාජකාරි භාර ගත් අවස්ථාවේ සිට බර කිරන යන්ත්‍රය ක්‍රියා විරහිත ව තිබුණ බවත්, ඒ බව අදාළ බලධාරීන්ට දැන් වුවත් ප්‍රතිඵලයක් නොලැබුණ බවත්, යන්ත්‍රය හදන එක විවිධ හේතු මත කල්ගිය බැවින් අලුත් යන්ත්‍රයකට Quotation එකක් ලබා ගෙන යන අපද්‍රව්‍ය අධ්‍යක්ෂකට යැවූ බවත්, අංගනයට ඇතුළත් වීමට අවසර ලැබුණේ කොළඹ මහ නගර සභාවේ වාහන වලටත්, කොළොන්නාව නගර සභාවට මුදල් ගෙවලා බිල්කරලා එන වාහනත්, ඊට අමතර ව Abans , Care Cleans ආයතන වලට අයත් වාහන පමණක් බවත්, කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවන ලද බිල්පතක් පිටපතක් ගේට්ටුවට ලබා නොදෙන බවත් ප්‍රකාශ කර සිටි.

තමන් අවසාන වරට කසළ කන්ද නිරීක්ෂණය කලේ 2017 අප්‍රේල් 12 දින බවත්, එදින විශේෂ යමක් නොදුටු බවත්, කසළ කන්දේ කිසිම ඉරි තැල්මක් gas පිටවීමක් නොදුටු බවත්, ඒ වන විට කසළ කන්දේ උස මීටර් 30ක් පමණ බවත් ප්‍රතාශ කර සිටි.

**අජිත් සිරිරුවන් විමලේන්ද්‍ර මහතා.**

කොළඹ මහ නගර සභාවේ මීතොටමුල්ල කසළ අංගනයට අනුයුක්ත ව 2016 ජුලි 01 දා සිට කසළ කන්ද කඩා වැටෙන තෙක් ම සේවය කළ බවත්, අංගනයට එන වාහන පරීක්ෂා කර අනුමත වාහන වලින් ගෙන කසළ පමණක් අංගනයට බෑමට අවසර දීමත් කසළ අංගනයේ මෙහෙයුම් කටයුතු සිදු වෙනවාද පරීක්ෂා කිරීමක් අංගනය වටා තිබෙන ඇලවල් පිරිසිදු ව තබා ගැනීමත් තමන්ගේ රාජකාරි බව ප්‍රකාශ කර සිටියි.

කොළඹ මහ නගර සභාවත් අවසර ලත් වාහන ලැයිස්තුවක් දී තිබෙන් බවත්, මහ නගර සභාවේ වාහන වලට අමතර ව කොලොන්නාව නගර සභාවේ අනුමත වාහන වලටත් Abans සහ Care Cleans අනුමත වාහන වලටත් අවසර නැති වෙනත් බාහිර ආයතන වල වාහන වලට ඇතුල් වීමට අවසර නොදුන් බවත්, තමන්ට නිකුත් කර ඇති රාජකාරි විස්තර අනුව රාජකාරි ඉටු කල බවත් ප්‍රකාශ කර සිටි.

කසළ අංගනයට කම්කරුවක් 13 දෙනෙකු යොදවා තිබුණ බවත්, ඉන් කම්කරුවන් 10 දෙනෙකු දහවල් කාලයටත් 03 දෙනෙකු රාත්‍රී කාලය සඳහාත් සේවයේ යොදවා තිබුණ බවත්, අංගනයට ප්‍රවේශ වීමට ඇත්තෙ එක් මාගර්යකින් පමණක් බවත්, ලේඛනයේ අංක සඳහන් නැති වාහන හරවා යවක බවත් එවැනි වාහන පිළිබඳ ව සටහනක් තබා ගන්නෙ නැති බවත්, කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවා ලදුපතක් සහිත එන කසළ වාහන වලට අවසර නැති නගර සභාවේ ම වාහන නොවන බවත්, ඒවා පුද්ගලික වාහන බවත්, කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවා යම් ලදුපතක් සහිත එනවා නම් ඒ අයට අවසර දෙන ලෙස කොළඹ මහ නගර සභාව නියම කර ඇති බවත්, දිනකට Abans සහ Care Cleans එවත් සමඟ වාහන 200ක් පමණ වන බවත්, කොලොන්නාව නගර සභාවෙන් වාහන 20ත් පමණ එන බවත්, කොළඹ මහ නගර සභාවේ වාහන Abans සහ Care Cleans ආයතන වල වාහන සහ කොලොන්නාවේ බලපත්‍ර දුන් වාහන වලට අමතර ව කිසිම වාහනයක් නොපැමිණෙන බවත්, එකම වාහනය දිනකට 2 පාරක් තුන් පාරක් පැමිණෙන බවත්, රාජකාරි ලේඛන කසළ අංගනය බාර ව සිටින ඉංජිනේරුවරයා විසින් අධීක්ෂණයට ලක් කරන බවත් ප්‍රකාශ කර සිටි.

තමන් භාරයේ තිබු ලියකියවිලි අතරින් සොයා ගැනීමට හැකි ලියවිල් කිහිපයක් එනම් කොලොන්නාව නගර සභාව විසින් නිකුත් කරන ලද අංක 3410, 1985 සහ 3415 දරන ලදුපත් පිළිවෙලින් X 131 A,B,C වශයෙන් ද කොලොන්නාව නගර සභාවේ ලේකම් නාගරික කොමසාරිස් කසළ අංගනයට භාරකරුට පිටපත් සහිත ව 2016/07/29 දිනෙන් යවන ලද ලිපියක් X 132 වශයෙන් ද එවැනි ම වු 2016/11/30 දිනේන් යොමු කරන ලද ලිපියක් X 133 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කරන බවත්, අවසර ලබා ගෙන එන වාහන වෙනුවෙන් ලදුපත් අනුව අවසරය මාසයකට පමණ කාලයකට ලැබෙන බවත් ප්‍රකාශ කර සිටි.

**පුල්ලපෙරුමගේ දොන් සෝමරත්න විජේසේකර මහතා.**

තමන් වැල්ලම්පිටිය පොලීසියට අනුයුක්ත සැරයන්වරයෙකු වශයෙන් 2013.05.09 වෙනිදා සිට මීතොටමුල්ල කසළ කන්ද සම්බන්ධ ව රාජකාරි කටයුතු කළ බවත්, 2017.05.09 වෙනිදා සිට වැලිකඩ පොලීසියට ස්ථාන මාරුකර ඇතත් අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් එහි රාජකාරියට වාතර්ා නොකළ බවත්, කසල කන්දේ තමන්ගේ රාජකාරි වුයේ අනවසර වාහන වලට අංගනයට ඇතුල්වීම වැලැක්වීම බවත් ප්‍රකාශ කර සිටි.

අනවසරලත් වාහන වශයෙන් සඳහන් කලේ කොළඹ මහ නගර සභාවේ වාහන Abans, Care Cleans ආයතන වල වාහන සහ ඊට අමතර ව Army, Navy, Air force වැනි අවසර ලත් වාහන බවත්, Abans සහ Care Cleans ආයතන වල වාහන නගර සභාව විසින් ඒවා ඇති list එකට ඇතුල් වී ඇති බැවින් එම වාහනත් අවසරලත් ගණයට ඇතුල් වන බවත් මෙම වාහන වලට අමතර ව කොලොන්නාව නගර සභාවෙන් මුදල් අයකර ගෙන ලදුපතක් නිකුත් කර ඇති වාහන ද නගර සභාවේ අවසරය තිබෙන නිසා ඒවා ද ඇතුල් කරන බවත්, අවසරලත් වාහනයකට දවසකට ඕනෑම වාර සංඛ්‍යාවක් පැමිණිය හැකි බවත් සීමාවක් නොමැති බවත් ප්‍රකාශ කර සිටී.

මීට අමතර ව කාලයක් යද්දී රජයේ ආයතන වලට ද අවසර ලබා දෙන ලෙසට දැනුම් දුන් බවත්, ඊටත් පස්සේ කොලොන්නාව බල සීමාව තුල මෙගා පොලීස් කියලා පාරවල් හදන ආයතන වල වාහන වලටත් අවසර ලබ දුන් බවත්, මෙවැනි ස්වභාවයේ වාහන වලට අමතර ව කිසිම පුද්ගලික වාහනයකට ඇතුල් වීමට අවසර නොදුන් බවත්, නමුත් සිල්වෙස්ටර් මිය සහ සම්පත් මහතා යන අය විසින් විශේෂ අවසරය ලිපියකින් ලබා දුන් වාහන වලට ද අවසරය ලබා දුන් බව ප්‍රකාශ කර සිටී.

අවසරය දෙනු ලබන වාහන වල ගෙන යනු ලබන කසළ කුමන බල ප්‍රදේශයකට අයිති ද කොහෙත් ගෙනෙන කසළ ද යන්න සොයා බැලීමත් සිදු නොකර බවත්, මුදල් ලබාගෙන කසළ බැහැර කිරීමක් සිදු නොවුන බවත්, පැමිණෙන ලොරිවල අංකය සහ පැමිණීම පිටවීම ලේඛනයක ඇතුල් කරන බවත්, එවැනි ලේඛන රාශියක් ඇති බවත්, එදින රාත්‍රී රාජකාරිය කිරීමට තිබෙන බවත්, දිනකට වාහන 250 ක් 300 ක් අතර ප්‍රමාණයක් පැමිණෙන බවත්, කොලොන්නාව නගර සභාවේ බලපත්‍ර දෙන වාහන වලට ඇතුල් වීමට අවසර දෙන ලෙසට පොලීසියෙන් නියෝගයක් නොමැති බවත්, එසේ නියෝගයක් දී ඇත්තේ කොළොඹ නගර සභාවේ අධ්‍යක්ෂ ඉංජිනේරු වරිය බවත්, නමුත් 2017 ජනවාරි 07 දිනයෙන් වැල්ලම්පිටිය පොලිස් ස්ථානාධිපති වරයා ලිපියකින් පුද්ගලික වාහන වලට ඇතුල් වීමට ඉඩ නොදෙන ලෙසට දැනුම් දීමක් කර තිබුණ නමුත් පසුව පෙර කළ ආකාරයටම කටයුතු කරන ලෙසට එනම් පුද්ගලික වාහනයකට කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවා තිබෙනවා නම් ඇතුල් කිරීමට අවසර දෙන ලෙසට දැනුම් දුන් බව ප්‍රකාශ කර සිටී.

කොලොන්නාව නගර සභාවට වාහන වලට අවසර දීම සඳහා ලදු පත් නිකුත් කරන්නේ මාසයකට සැරයක් බවත්, එහි දිනපතා ම එන වාහනයේ අංකය ඇතුලත් කරන බවට නගර සභාවේ අත්සන සහ මුද්‍රාව එහි ඇතුලතු කර ඇති බවත්, අවසර දෙන වාහනයකට කුමන වාර සංඛ්‍යාවක් වුවත් ඇතුලත බැහැර කිරීමට හැකි බවත්, අතීතයේ කුණු අංගනයට දැමිය හැකි ප්‍රමාණය ටොන් 10 ක උපරිමයකට සීමාකර තිබුණ බවත් එක දවසින් ගෙනාවත් මාසයක් ඇතුලත ගෙනාවත් ටොන් 10 කට සීමා වූ බවත්, එසේම අයථා ලෙස කසළ බැහැර කිරීමක් සිදු නොවුන බවත් ප්‍රකාශ කර සිටී.

### ජගත් බණ්ඩාර රත්නායක මහතා.

දැනට ගොතටුව පොලිස්යේ රාජකාරි කරන බවත්, ඊට ප්‍රථම 2014 සැප්තැම්බර් මාසයේ සිට 2017 අප්‍රේල් මාසයේ 14 දින වන තෙක් වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ මීතොටමුල්ල කසළ කන්ද අනුයුක්ත ව රාජකාරි කළ බවත්, තමාගේ රාජකාරිය වුයේ කසළ කන්දේ තිබු දේපළ ආරක්ෂා කිරීම බවත් ප්‍රකාශ කර සිටී.

කසළ බැහැර කිරීමට කොළඹ මහ නගර සභාවේ වලටත් ඊට අමතර ව Abans සහ Care Cleans ආයතන වල වාහන වලටත් කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවා ලදුපත් ඉදිරිපත් කරන ලද වාහන වලටත්අවසර ලබාදුන් බවත්, කොලොන්නාව නගර සභාවෙන් ලබා දුන් ලදුපත පරීක්ෂා කර බලන බවත්, ඒවායේ නගර සභාවේ ලාංඡනය එහි ඇතුළත් ව තිබුණ බවත් මීට අමතර ව ත්‍රිවිධ හමුදාවේ වාහන වලට ද අවසර දුන් බවත්, කොළඹ මහ නගර සභවෙන් සහ කොලොන්නාව නගර සභාවෙන් අවසර ලබාදුන් වාහන වල ලැයිස්තුවක් වැල්ලම්පිටිය පොලිසියේ තිබෙන බවත් ප්‍රකාශ කර සිටි.

කසළ අංගනයට කසළ බැහැර කිරිම සඳහා යම් රථයක් පැමිණෙන විට බර කිරීම සඳහා තරාදියක් තිබී ඇති බවත් එම යන්ත්‍රය තමා සේවයට වාතර්‍ා කළ දිනයේ සිට ම එනම් 2014 දිනයේ සිට ම එය කැඩී තිබුණ බවත්, අලුත් වැඩියාවත් නොකළ බවත්, ඒ අනුව බර කිරීමක් සිදු නොකළ බවත් ප්‍රකාශ කර සිටි.

Abans සහ Care Cleans ආයතන වලට කුණු රැගෙන ඒම සම්බන්ධයෙන් විශේෂිත කොන්දේසි පනවා නොතිබුන බවත්, නමුත් කොලොන්නාව නගර සභාවෙන් අවසර ගන්න වාහන වලට දිනකට අවස්ථා දෙකක් එන්න අවසර ලබා දී තිබුණ බවත්, කිසිදු වාහනයක් වෙනුවෙන් කිසිදු මාසයකට බර සීමාවක් උපරිමයකට යටත් ව එනවා නොතිබුණ බවත් ප්‍රකාශ කර සිටි.

රාජකාරියේ දී යෙදී සිටිද්දී කසළ කන්දේ පාරිසරික වෙනස් වීම් නිරීක්ෂණය නොවූ බවත් වැඩි දුරටත් ප්‍රකාශ කර සිටි.

**රාජ මහේද්‍ර කුමාර රාසයියා මහතා.**

කොළඹ මහ නගර සභාවේ සේවකයෙක් බවත්, 2016 ජුලි 01 සිට 2017 අප්‍රේල් 14 වෙනි දින දක්වා එනම් කන්ද කඩා වැටෙන තෙක් ම මීතොටමුල්ල කසළ කන්දේ වැඩ පරිපාලකවරයෙකු වශයෙන් සේවය කළ බවත් රාජකාරි වශයෙන් කම්කරු පාලනය අංගනයට කසළ බැහැර කල හැකි අනුමත වාහන වල ලැයිස්තුවක් මහ නගර සභාවෙන් ලබා දී ඇති බවත් ලැයිස්තුව පරීක්ෂා කර බලා ලැයිස්තුවේ ඇති වාහන වලට පමණක් අංගනයට ඇතුල් කළ බවත්, එය තමන්ගේ රාජකාරියක් බවත්, 2016/06/02 සිට 2017/04/01 දින දක්වා අංගනයට ඇතුළවුන කසළ රැගෙන ආ වාහන පිළිබඳ ලේඛනය X137 වශයෙන් සළකුණු කර ඉදිරිපත් කරන බවත්, අනුමත් වාහන වශයෙන් Abans සහ Care Cleans, කොලොන්නාව නගර සභාව, කොළඹ මහ නගර සභාව සහ ආරක්ෂක අංශවල වාහන ඇතුලත් වුන බවත්, ඒවා ඉහත ලේඛනයේ කෙටි නම් වලින් හඳුන්වා ඇති බවත් ප්‍රකාශ කර සිටි.

එසේ ම කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවා එන කොලොන්නාව private limited යනුවෙන් හඳුන් වන වාහන දිනකට අවස්ථා තුනක් පැමිණියත් එම වාහන සඳහා බර මත පාලනයක් සිදු නොවුව බවත්,එයට හේතුව වුයේ බර කිරන යන්ත්‍රය ක්‍රියා විරහිත ව තිබීම බවත්, මුදල් ගෙවා ඇති කාලය තුල වාහන තුන් හතර පාරක් පැමිණෙන බවත්, වාහන හිමියන් නගර සභාවට හැර වෙනත් පාශර්වයන්ට ද යම් මුදල් ගෙවීමක් සිදු වෙනවා ද යන්න කීමට තමා නොදන්නා බවත්, කසළ බැහැර කරද්දි කොලොන්නාව නගර සභාවට මුදල් ගෙවා කසළ බැහැර කරන වාහන වලට බැහැර කිරීම සඳහා දෙනු ලබන අවස්ථා සංඛාව කොපමණ ද කියලා උපදෙස් ලබාදී නොතිබුණ බවත්, Abans ආයතනය කොළඹ මහ නගර සභාවේ කොන්ත්‍රාත් ලබාගත් ආයතනයක් බවත්, ඔවුන්ට දිස්ත්‍රික්ක වෙන් කරලා තිබුණ බවත්, ඊට

අමතර ව වාහන වලින් ගෙනෙන කසළ කුමන ප්‍රදේශ වලින් ගෙනෙන කසළ ද කියා කියන්න තමන් නොදන්න බවත් ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ල කසළ අංගනයට කිට්ටුව දිසා අංක 03 බවත්, දිසා අංක 03 කසළ බැහැර කලේ කොළඹ මහ නගර සභාව බවත්, Abans සහ Care Cleans ආයතන දිසා අංක 02 ප්‍රදේශයේ කසළ බැහැර ලීම කළ බවත්, බොරැල්ල බල ප්‍රදේශයේ තුල කොළඹ මහ නගර සභාවට අයිති වාහනයක් පැය තුනක කාලයක් තුල අවස්ථා තුනක දී කසළ බැහැර කිරීම සිදු කර ඇති බව X138 වැනි ලේඛනය පරීක්ෂා කර බලා ප්‍රකාශ කර සිටිමින් එම වාහනය බොරැල්ල දිසා කායර්ාලයට අයිති වාහනයක් බව හඳුනා ගනී.

එසේ ම ප්‍රකාශ කරු Abans සහ Care Cleans ආයතන විසින් කසළ බැහැර කිරීම සඳහා පැමිණෙන වාහන 2017/04/01 දිනට හඳුනා ගැනීමක් සිදු කරමින් Abans සහ Care Cleans ආයතන දෙකෙන් ම කිසියම් වාහනයක් එක ම අංකය යටතේ අවස්ථා තුනක දී ඇතුළු වී නැති බවයි.

### කුෂ්ලානි තරංගා ගමගේ මහත්මිය.

දැනට කැස්බෑව නගර සභාවේ වැඩ බලන ලේකම් හැටියට සේවය කරන බවත්, ඊට ප්‍රථමයෙන් 2009 ජුනි 18 වෙනි දින සිට 2014 /12/03 වන දින දක්වා කොලොන්නාව නගර සභාවේ වැඩ බලන ලේකම් වශයෙන් කටයුතු කළ බවත්, 2009 අප්‍රේල් මාසයේ ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරන නඩු තීන්දුවේ නියෝගය අනුව මීතොටමුල්ල පොතුවිල් කුඹුරට කසළ දැමීම සිදු කලත් එම ස්ථානයට ඒ වන විටත් කොලොන්නාව නගර සභාවේ කසළ ද බැහැර කිරීම සිදු කළ බවත්, එය දීඝර් කාලයක් තිස්සේ කර තිබුණ බවත්, එයට අමතර ව නාරහේන්පිට ආථර්ික මධ්‍යස්ථානයේ කසළත් BMICH ආයතනයේ යම් ප්‍රමාණයක කසළත් බැහැර කිරීමට සිදු වූ බව ප්‍රකාශ කර සිටි.

ඒවගේ ම මීතොටමුල්ලට අයත් අක්කර 17 ක පමණ වපසරියක් සහිත ඉඩමක් තිබුණ බවත්, එයින් අක්කර 02 ප්‍රමායකට පමණක් කසළ බැහැර කිරීමට කොළඹ මහ නගර සභාවට ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයෙන් අවසර ලැබුණු බවත්, කොලොන්නාව නගර සභාව මේ අක්කර 17 ම කසළ බැහැර කිරීමට භාවිතා නොකළ බවත්, 2010 වෂර්යේ දී පරිසර අධිකාරිය පිළිසරු ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් නගර සභාවට ආරම්භ කර භාර දුන් බවත්, ඒ සඳහා නාගරික සංවධර්න අධිකාරිය අක්කර 04ක පමණ ඉඩම් ප්‍රමාණයක් නගර සභාවට ලබා දුන් බවත්, මේ අවස්ථාව වන විට නගර සභාව හැරුණු විට තවත් ආයතන කිහිපයක් කසළ මෙම ස්ථානයට හිටපු සභාපතිවරුන්ගේ අවසරය මත නොමිලේ බැහැර කිරිම සිදු කළ බවත්, කොළඹ මහ නගර සභාව අධික කසළ ප්‍රමාණයක් මෙම ස්ථානයට පසුව ගෙන ආ බැවින් පෙර අයට අමතර ව තවත් 15 දෙනෙකුට අවසරය සභා තීරණයක් මගින් ලබා දුන් බවත්, පසුව මීතොටමුල්ල පාලනය සම්පූණර්යෙන් ම කොළඹ මහ නගර සභාව යටතට ගත්තට පසුව කොළඹ මහ නගර සභාවේ ලියා පදිංචි කිරීමට යැයි කියා එම 15 දෙනාගේ විස්තර ඉල්ලු බවත්, මෙම 15 දෙනාගෙන් ටොන් එකකට රු.500ක් බැගින් මසකට ටොන් 10ක් බැහැර කරන්න රු. 5000ක් අවමයක් සහිත ව 2012 වෂර්යේ සිට අයකර ගෙන තිබෙන බවත්, ප්‍රකාශ කර සිටිමින් එම පාශර්වයන් ඉදිරිපත් කළ ඉල්ලීම් සහ වාහන පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් X138 වශයෙන් කමිටුව ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටි.

කොලොන්නාව නගර සභාව පමණක් මෙම ස්ථානයට කසළ බැහැර කිරීමේ දී ගැටළුවක් ඇති නොවූ බවත්, පසුව දිනකට ටොන් 800ක් පමණ කසළ ප්‍රමාණයක් කොළඹ මහ නගර සභාවෙන් පැමිණිමත් සමඟ කසළ ප්‍රමාණය වැඩි වූ බවත්, අධිකරණ තීන්දුව වුයේ කසල බැහැර කරනවා නම් ඊට උඩින් පස් තට්ටුවක් දැමිය යුතු බවත්, ඒගේම දුගර්න්ධය තිබෙනවා නම් එය පාලනය කළ යුතු බවත්, යන කරුණු නිසා නගර සභාවට මෙය පාලනය කිරීමට හැකියාවක් නොතිබුණ බවත්, ඒ නිසා ම පාලනය මහ නගර සභාව අයත් වූ බවත් ප්‍රකාශ කර සිටි.

අවසරය ලබා දුන් සභා තීරණය X139 වශයෙන් කමිටුව ඉදිරිපත් කරන බවත්, සභා තීරණයක් වාහන විස්තර ඇතුළත් වී නොමැති බවත්, මුදල් පමණක් ඇතුළත් වී ඇති බවත්, එම 15දෙනාට ම කොලොන්නාව නගර සභාව විසින් මුදල් අයකර කසළ බැහැර කිරීමට අවසරය දී ඇති නමුත් ඒ වෙනුවෙන් බලපා පු හේතුවක් තිබේ ද යන්න ලේඛන මඟින් හඳුනා ගැනීමට දැනීමක් නොමැති බවත්, එය 2012/08/27 දින සභාව ගත් තීරණයක් බවත්, සභා තීරණය ( X139) අනුව මුදල් අයකිරිමේ ක්‍රම වේදය වන්නේ ටොන් එකකට රු.500ක් මෙට්‍රක් ටොන් 10කට රු. 5000කට අවමයකට යටත් ව ගෙවා කසළ බැහැර කිරීමට අවසරය දෙන බව කියලා බවත්, ඒ අනුව අය කිරීමට පදනම බැහැර කරන කසළ ප්‍රමාණය බවත්, මෙම මුදල් අය කරනු ලබන්නේ කසළ දැමීමට කලින් බවත්, ඒ බව X131, X132A, X132B සහ X132C යන ලදුපත් වලින් පෙනෙන බවත් ප්‍රකාශ කර සිටි.

ලදුපතට අනුව කසළ බැහැර කිරීම පිළිබඳ ව පරීක්ෂා කිරීමට කොලොන්නාව නගර සභාවෙන් කිසිවෙකු සේවයට යොදවා නොමැති බවත්, එහි පාලනය සම්පූණර්යෙන් ම කලේ කොළඹ මහ නගර සභාව බවත්, නගර සභාවකට පෞද්ගලික පාශර්වයන්ට කසළ බැහැර කරන්න විකල්ප ස්ථානයක් ලබදීමේ වගකීමක් නොමැති බවත්, පෞද්ගලික අංශයෙන් අය කරන ලද මුදලට සරිලන යම් සේවාවක් නොකළ බව ද ප්‍රකාශ කර සිටිමින් තමා 2009/06/18 සිට 2014/12/03 දින දක්වා වැඩ බලන ලේකම් වශයෙන් මීතොටමුල්ල පොතුවිල් කුඹුරා අදාළ ව පවත්වා ගෙන ගිය තොරතුරු ඇතුළත් ලේඛනයක් X140 වශයෙන් පරීක්ෂණ කමිටුවට ඉදිරිපත් කරන බව ද ප්‍රකාශ කර සිටි.

**ඒ. එම් . පියදාස මහතා.**

කොලොන්නාව නගර සභාවේ වැඩ බලන ලේකම් වශයෙන් 2015/12/01 සිට 2017/06/30 දින දක්වා සේවය කළ බවත්, එම කාලය තුල මීතොටමුල්ල කසළ අංගනයට එක පාරක් දෙපාරක් ගොස් තිබෙන බවත්, එසේ ගියේ කසළ අංගනයේ කොලොන්නාව නගර සභවේ පවත්වා ගෙන ගිය කොම්පෝස්ට් අංගනය එය කඩා වැටුනට පසු එහි තිබුණ යන්ත්‍ර කොටස් ඉවත් කිරීමට අවශ්‍ය නිසා ඒවා ද පරීක්ෂා කිරීමට ගිය බවත්, මෙම ස්ථානයට තමාගේ රාජකාරි කලයේ කොලොන්නාව නගර සභාව විසින් එක් රැස් කළ කසළ බැහර කළ බවත්, කාලයක් තිස්සේ ම ස්වයං රැකියාවක් වශයෙන් කසළ එකතු කරන අයට නගර සභාව අවසර දුන් බවත්, එය සිදු කලේ සභා තීරණයක් අනුව බවත්, අදාල සභා තීරණය X139 හි ඇතුළත් වන බව ප්‍රකාශ කර සිටි.

X139 වාතර්ාවේ ඇතුළත් "යසිරු කොන්ත්‍රාත්කරුවෝ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ සහ ලොජිපීන් සමාගම් වලට අවසරය ද ඇත්තේ එම සමාගම් වල කසළ ඉවත් කිරීමට බවත්,

පූවර් ගාමිකයන් අනුගමනය කළ පිලිවෙත තමනුත් අනුගමනය කළ බවත්, 2016 වෂර්යේ මේ මඟින් රුපියල් 1,595,750 මුදලක් ද 2013 වෂර්යේ අප්‍රේල් 13දා තෙක් රුපියල් 613,000ක මුදලක් ද අයකර ගෙන ඇති බවත්, මෙම මුදල් බාහිර පාශර්වයන්ටත් මීතොටමුල්ලට කසළ බැහැර කිරීමට අවසරය ලබාදීම නිසා ලැබුණු මුදල් බවත්, මෙම මුදල් නගර සභාවේ සංවධර්න කටයුතු සඳහා සහ සේවක අවශ්‍යතා සඳහා යොදවා ගෙන ඇති නමුත් කසළ අංගනය සඳහා මුදලක් යෙද වීමට අවශ්‍යතාවයක් නොතිබුණ බවත්, නගර සභාව බාහිර පාහර්වයන් අවසර ලබා දීම සම්බන්ධ ව කොළඹ මහ නගර සභාව දැනුවත් ව සිටි බවත්, එය වළක්වන්නට ක්‍රියා මාගර් නොගත් බවත්, අවසරලත් පුද්ගලයන් 8 දෙනෙකුට පමණ දී ඇති බවත්, මෙම මුදල් අයකලේ කසළ බැහැර කිරීමට කලින් බවත්, ඒ අනුව කසළ ටොන් 1 ට රුපියල් 500 බැගින් අය කළ බවත්, අංගනයට ඇතුල් වෙන ස්ථානයෙදී කසළ කිරලා ඇතුළ කරන බව සඳහන් වෙන නමුත් එවැනි ක්‍රියාවක් සිදු නොවුන බවත් ප්‍රකාශ කරමින් වැඩ බලන ලේකම් හැටියට කටයුතු කළ කලය තුළ සියළු සිදුවීම් අඩංගු වාතර්ාවක් X141 වශයෙන් ඉදිරිපත් වන බව වැඩි දුරටත් ප්‍රකාශ සිටි.

## වී.කේ. ඒ. අනුර මහතා. ( කොළඹ නාගරික කොමසාරිස්)

කොළඹ මහ නගර සභාවට 2011 වසරේ දී පුණ්‍ය කොමසාරිස් වශයෙන් සේවයට පැමිණි බවත්, 2015 මැයි මාසයේ සිට නාගරික කොමසාරිස් වශයෙන් ස්ථිර ලෙස පත් වු බවත්, එදින සිට අද දක්වා ම නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරි කරන බවත් ප්‍රකාශ කර සිටි.

2015 මැයි මාසයේ පමණ වන විට කසළ කන්ද අසල යම් විරෝධතා පැවති නිසා ඒ පිළිබඳ ව සොයා බැලූ බවත්, එහිදී ජනතාවගේ ඉල්ලීම වූයේ කසළ කන්ද ඉවත් කිරීම සහ කසළ මෙම ස්ථානයට නොදැමීම බවත්, මේ අවස්ථාව වන විට කොළඹ කඩුවෙල කෝට්ටේ යන පළාත් පාලන ආයතන වල සහ ත්‍රිවිධ හමුදාවේ ද කසළ මෙම ස්ථානයට බැහැර කළ බවත්, මේ පිළිබඳ ව සභාවට කරුණු ඉදිරිපත් කළ බව ප්‍රකාශ කර සිටි.

ඉන් පසුව කසළ කන්ද ඉවත් කිරීම සඳහා පුවත් පත් දැන්වීම් මඟින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කළ බවත්, මේ අවස්ථාවේ නගර සභාවේ බලය මහ සභාවට අයත් ව තිබූ බැවින් මේ සම්බන්ධයෙන් මුදල් කමිටුව වෙත තමන් හා නාගරික භාණ්ඩාගාරික ද නිදෙර්ශ සහිත වාතර්ාවක් ඉදිරිපත් කළ නමුත් එම යෝජනාව මහ සභාවට ඉදිරිපත් නොවී න්‍යාය පත්‍රයෙන් ඉවත් කළ බවත්, ඉවත් කළ යෝජනාව X101A වශයෙන් සළකුණු කර ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර සිටි.

මේ සම්බන්ධයෙන් තිබුණ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයේ සඳහන් වුයේ කසළ බැහැර කිරීම වෙනත් ස්ථානයකට සිදු කරනවා නම් ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය ලබාගත යුතු වු බැවින් ටෙන්ඩර් වලින් සොයා ගෙන තිබුණ ඉඩමකට කසළ බැහැර කිරීම ශ්‍රේෂ්ඨාධිකරනයෙන් ඉල්ලීමක් කල බවත් එය සිදු කලේ අවශ්‍ය පාරිසරික වාතර්ා ලබා ගැනීමෙන් පසුව බවත්, මෙම කටයුත්ත ආරම්භ කිරීම තාක්ෂණික උපදෙස් අවශ්‍ය වු බැවින් ඒ සඳහා ටෙන්ඩර් කැඳවා මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වරයෙකුගේ උපදේස් ලැබෙන P.M.L. ආයතනයට ටෙන්ඩරය පිරිනැමු බවත්, එම ඉඩම ජා ඇල ඒකල ඔතේ කියන අක්කර 35ක වපසරියක ඇති ඉඩමක් බවත් ප්‍රකාශ කර සීටි.

මේ තෝරා ගත් ඉඩමට යැමට ප්‍රවේශ මාගර්ය ද යුධ හමුදාව ලවා පිළියෙළ කර ගැනීමට කටයුත කළ බවත්, නමුත් ප්‍රවේශ මාගර්ය අවහිර කරමින් නැගුණු ජනතා උද්ඝෝෂණ නිසා

යුධ හමුදාව එම කටයුත්තෙන් ඉවත් වූ අතර පසුව් මේ සම්බන්ධයෙන් විෂය භාර ඇමාති වරයාට හා මේ සඳහා අධිකරණයේ අවසරය ලබා දෙන ලෙසට පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, ඔතේ කැලේ කසළ බැහැර කිරීම සම්බන්ධ ව ජනාධිපති තුමාගේ සහ අගමැති තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පැවැත් වුවත් මහජන විරෝධතාවය නිසා එය සාර්ථක නොවුන බවත්, එම හේතුව නිසා ම මීතොටමුල්ලට කසළ බැහර කිරීම දිගට ම කිරීමට සිදු වුන බව ප්‍රකාශ කර සිටි.

මේ අතරතුර මීතොටමුල්ල ආශ්‍රිත ව ජීවත් වන ජනතාවගේ ගැටළු හා ප්‍රශ්න සොයා බැලීම මහ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් සහ ඝණ අපද්‍රව්‍ය අංශයේ අධ්‍යක්ෂක සහ නිලධාරින් මඟින් සිදු කල බවත් මුලින් ම අපදාවට ලක් වූ නිවාස සඳහා එක් නිවසකට රු.15000ක් බැගින් ලබා දුන් බවත්, වරින් වර ආපදාවට ලක් වූ නිවාසයක් සඳහා මුදලින් රුපියල් දස ලක්ෂයක් ලබා දී නිවාස වලින් ඉවත් වූ පසු රුපියල් පන් ලක්ෂයක් වශයෙන් මුදලින් ද අදියර කිහිපයකදී වන්දි වශයෙන් ලබා දුන් බවත් ප්‍රකාශ කර සිටි.

එසේ ම කසළ කන්ද ආසන්නයේ ම පැවති පන්සල් හේන නමින් හඳුන්වන ලද ජනාවාස තිබුණ බවත්, ආපදාව සිදු වූ දිනයට මාස කිහිපයකට පෙර සිට ම එම ජනාවාසය ආපදාවකට ලක්විය හැකි යැයි වාතර්ා වුන බැවින් නිවාස හිමියන් සමඟ සාකච්ඡා කර තාවකාලික පදනමක් මත ඉවත් වී කුලී නිවාසයකට පදිංචියට යන්නේ නම් හක් මසකට රු.15000ක් බැඟින් රු. 90000 ක මුදලක් එක වර ලබා දීමට තීරණයකට එළඹ ඒ අනුව නිවාස 8කට අයට ගෙවල් කුලී ලබා දුන් බවත් ප්‍රකාශ කර සිටි.

ශ්‍රේෂ්ඨාධිකරනයේ නියෝගයක් අනුව කොළඹ මහ නගර සභාව අවසර ලත් ස්ථානයට කසළ බැහැර ලීම සිදු කළ බවත්, අවසර ලද ස්ථානයට වෙනත් ආයතනයන්ගෙන් කසළ බැහැර කරද්දි ඒ ගැන කටයුතු කළ යුත්තේ අංගනය අයිතිව තිබු කොලොන්නාව නගර සභාව විසින් බවත්, වෙන්ත් ආයතන වලට මුදල් අයකරගෙන කොලොන්නාව නගර සභාව අවසර දී ඇති බවත්, අධිකරන තීන්දුව තුළ පැහැදිලිව ම ඇතුළත් වන්නේ අක්කර 02 ප්‍රමාණයක් මහ නගර සභාවේ කසළ බැහැර ලීම සිදු විය යුතු බව යන්නත් ප්‍රකාශ කර සිටි.

2017 අප්‍රේල් 07 දාතමින් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කර ඇති X 97 දරණ ලේඛන පිළිබඳ ව තමන්ට වාතර්ා වුන බවත්, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් නගර සභාවේ නිලධාරින් ද වාතර්ා කළ බවත්, ඒ අනුව පරීක්ෂා කර බලා ගෙවල් කුලි ලබා දෙන්නම් අයින් වෙන්න කියා නිවැසියන්ට දැනුම් දුන් බවත්, එසේ ම කසළ කන්ද සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් අමාත්‍යංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ බවත්, ඊට අදාල වාතර්ාවක් X 39 B ලේඛනයේ සඳහන් වන බවත්, කසළ කන්ද කළමනාකරණයට අවශ්‍ය උපදෙස් එම වාතර්ාවේ ඇතුළත් වන බවත්, එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් එකඟතාවය සඳහා ලිපියක් යැවු බවත්, කසළ සම්බන්ධයෙන් මධ්‍යගත එක ආයතනයක් තිබිම වැදගත්ය යන්න තමාගේ අදහස බව ප්‍රකාශ කර සිටි.

මේ වන විට කොළඹ නගරය තුළ කසළ බැහැර කිරීම පිළිබඳ ව විධිමත් ක්‍රම වේදයන් සකස් වී ඇති බවත්, ඒ අනුව 2016 නොවැම්බර් 01 දා සිට කසළ වෙන් කර භාර ගැනීම ආරම්භ කළ බවත්, ඒ අනුව නොදිරන කසළ විශාල ප්‍රමාණයක් විකුණා මුදල් ලබාගත් බවත්, දිරන කසළ කොම්පොස්ට් කරන තත්ත්වයට ගෙන ආ බවත්, ඒ අනුව කසළ ටොන් 500ත් පමණ ප්‍රමාණයක් කොම්පෝස්ට් කර ඇති බවත්, තවත් කසළ ටොන් 300ක් පමණ මිශ්‍ර තත්ත්වයේ පවතින බවත්, එම කසළ වලට මතුපිටින් පස් දමා වසන බවත් ප්‍රකාශ කර සිටි.

කසළ කන්ද තිබුණු ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම්වල මහ නගර සභාවේ මැදිහත් වීම තුළින් සෞඛ්‍ය සේවාවන් පැවැත්වූ බවත්, මෙම ස්ථානය අධ්‍යක්ෂක ඉංජිනේරුවරයෙකුගේ අධීක්ෂණය යටතේ තිබුණ බවත් ස්ථානයේ පාලනයට ඉංජිනේරුවරයෙකු සහ කායර්ය මණ්ඩලයක් පත් කර තිබුණ බවත්, නගර සභාවේ යන්ත්‍ර සහ කුලියට ගත් සමාගම් දෙකක යන්ත්‍ර යොදවා කසළ කළමනාකරණය කළ බවත්, එම යන්ත්‍ර වැඩ කරන කාලය පරීක්ෂා කිරීමට නිලධාරීන් යොදවා තිබුණ බවත් අමතර ව අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ නිලධාරීන්ගේ නිරන්තර අධීක්ෂණය තිබුණ බවත් ප්‍රකාශ කර සිටී.

බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය අධිකාරිය මීතොටමුල්ල කසළ බැහැර කරන ස්ථානය සම්බන්ධයෙන් පරීක්ෂා කර වාතර්ාවක් පිළියෙල කළ ඉදිරිපත් කර බව ප්‍රකාශ කර සිටින ප්‍රකාශ කරු එම වාතර්ාව අනුව කටයුතු කිරීම සඳහා එකඟතාවය දැක්වූ බව ප්‍රකාශ කරයි.

## එස්. එම් . මරික්කාර් මහතා. ( කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී)

තමා 2015 අගෝස්තු මාසයේ 17 වෙනිදා සිට කොළඹ දිස්ත්‍රික් පාලර්ිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වන බවත්, ඊට ප්‍රථම බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ බවත්, මීතොටමුල්ල කසළ අංගනයට කොළඹ මහ නගර සභාවෙන් ටොන් 700ක පමණ කුණු ප්‍රමාණයක් බැහැර කලත් තවත් ටොන් 300ක් පමණ අමතර ප්‍රමාණයක් අතර මැදියන් මාගර්යෙන් මෙම ස්ථානයට බැහැර කරන බවත්, දැන ගන්නා ලැබුණු බවත්, එසේ ම කොලොන්නාව නගර සභාවෙන මුදල් අය කරගෙන කසළ ගෙනෙන ක්‍රමයකුත් තිබුණ බවට තොරතුරු ද මහ ජනතාවගෙන් ලැබුණු නිසා මේ පිළිබඳ ව ගරු ජනාධිපති තුමා ගරු අගමැති තුමා සහ කොළඹ නාගරික කොමසාරිස් තුමාට ද මේ බව දන්වා ලිපි යැවූ බවත්, ඉල්ලීම වුනේ මීතොටමුල්ලට කසළ දැමීම නගර කර ඒ සඳහා විකල්ප මාගර්යක් සොයා ගන්න ලෙස බව ප්‍රකාශ කර සිටී.

මේ අනුව පසුව ජා ඇල ඔතේ කැලේ කියන ස්ථානයේ ඉඩමක් මේ සඳහා තෝරා ගත් නමුත් කොළඹ කසළ ජා ඇලට ගෙන යෑමට මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වූ අතර එය ලබා දීම අධිකාරිය දිගින් දිගට ම පැහැර හැරිය බැවින් ජනාධිපති තුමාට මේ බව දැන් වූ බවත්, ඒ අනුව සාකච්ඡා අදාළ නිලධාරීන් සමඟ පැවැත් වූ බවත්, අන්තිමට කොන්දේසි 15ක් යටතේ ජා ඇල කසළ දැමීමට අවසර දුන් බවත්, ප්‍රායෝගික ව එම කායර් කිරීමට හැකි ආකාරයට කරුනු කොන්දේසි වල ඇතුළත් ව නොතිබුණ බවත්, කෙසේ නමුත් මහජන විරෝධතා නිසා මේ ව්‍යාපෘතිය නැවතුන බවත් ප්‍රකාශ කර සිටී.

තත්ත්වය එසේ තිබිය දී කොලොන්නාව ආයතනයේ ජනතාව එකතු කර ගෙන 2017 පෙබරවාරි මාසයේ පමණ උද්ඝෝෂණයක් කළ බවත්, එතනට පළාත් පාලන ඇමතිතුමාගේ නියෝජිතයෙකු පැමිණ ජනාධිපති තුමා සමඟ සාකච්ඡාවක් ලබා දෙන බවට පොරොන්දු වූ නිසා උද්ඝෝෂණය නැවැත්වූ බවත්, පසුව කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් හමු වී ආපදා තත්ත්වය ගැන කියා ආපදාවක් ඇති වීමට පෙර ඉවත් කිරීමට සුදුසු අයත් මෙම ස්ථානයෙන් ඉවත් කරන ලෙසටත් ඉවත් කරන අයට සාධාරණ වන්දියක් ලබා දීමට කටයුතු කරන ලෙසටත් ඉල්ලීමක් කළ බවත් ප්‍රකාශ කර සිටී.

පසුව කොලොන්නාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හැටියට මෙම කසළ ප්‍රශ්නයට සම්බන්ධ වූ බවත්, එහිදී කොලොන්නාව නගර සභාවෙන් මුසදල් අයකරගෙන කසළ දැමීම නවත්වන ලෙසට තීන්දුවක් ගත් බවත්, එම තීරණය ප්‍රාදේශීය ලේකම් මගින්

කොලොන්නාව නගර සභවේ එවකට හිටපු ලේකම් ට දැනුම් දුන නමුත් කොලොන්නාව නගර සභාව ගැන තීරණ ගන්න සම්බන්ධීකරණ කමිටුවට බලයක් නැති බවත්, එය සභාව ගත් තීරණයක් බවත්, එය වෙනස් කළ හැක්කේ නැවත සභාවක් විසින් ගනු ලබන තීරණයකින් පමණක් බවත්, සභාව දන්වා එවූ බවත් ප්‍රකාශ කර සිටි.

මෙය සභාවේ බලයලත් නිලධාරි හැටියට රාජකාරි කරන ලේකම්ට තීරණයක් අරගෙන කරන්න තිබුණ කටයුත්තක් බවත්, නමුත් ලේකම් එසේ නොකළ කසළ ජාවාරම් කරුවන්ට දිගටම මෙම ජවාරම් කරගෙන යෑමට ඉඩදීමට බවත්, පසුව ආණ්ඩුකාරතුමාට පැමිණිකර ලේකම් ට ස්ථාන මාරු කල යැවූ බවත්, වතර්මානයේ අළුත් ලේකම්වරිය පැමිණ සිටින බවත්, ඇයගේ වැඩ පිළිවෙල නිසා දිනකට ටොන් 40 ක් බැහැර කල කොලොන්නාව වමර්ානයේ බැහැර කරන්නේ ටොන් 12ක් පමණක් බවත්, දැනට පවතින ක්‍රමය අනුව අදාළ එකම ආයතනයකටවත් ඍජුව වගකීම නොපැවරෙන නිසා කසළ කළමනාකරණය සඳහා ඍජුව ම වගකියන එකම ආයතනයේ පිහිට විය යුතුය යන්න තමාගේ අදහස් බව ප්‍රකාශ කර සිටි.
මෙම කසළ කන්ද කඩා වැටීමට ප්‍රධාන වශයෙන් කොළඹ මහ නගර සභාවටත් මධ්‍යම පරිසර අධිකාරියත් කොලොන්නාව නගර සභාවත් වගකිව යුතු බවත්, විකල්ප ඉඩමක් සොයා ගැනීමට කොළඹ මහ නගර සභාවට වුවමනාවක් නොතිබුණ බවත්, දෙවනුව ජා ඇල ස්ථානය සොයා ගත්තට පස්සේ ඊට අනුමැතිය නොදිමෙන් මධ්‍යම පරිසර අධිකාරිය ද වගකිව යුතු බවත්, මධ්‍යම පරිසර අධිකාරිය කිසිම අවස්ථාවක මීතොටමුල්ල කසළ කන්ද පරීක්ෂා කිරීමට නොපැමිණ බවත්, සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හැටියට පරිසර අධිකාරිය මේ කන්ද ගැන තමා සමඟ කිසිම අවස්ථාවක විමසා නැති බවත්, මේ අනුව මධ්‍යම පරිසර අධිකාරියට ඇඟිල්ල දික් කරන බවත් ප්‍රකාශ කර සිටි. එසේ හ අවසරයක් නොමැති බාහිර ආයතන සහ පාශර්වයන් ද මෙම ස්ථානයට කසළ ගෙනවිත් දැමීම නිසා කසළ ප්‍රමාණය වැඩි වූ බවත්, ඒ පිළිබඳ ව වැල්ලම්පිටිය පොලීසියේ ස්ථානාධිපති වරයාට දැනුම් දුන් නමුත් ඔහු කිසිම ක්‍රියා මාගර්යක් නොගත් බවත් ප්‍රකාශ කර සිටි.

## ජේ.එම්. උපාලි ඉන්ද්‍රරත්න මහතා.

වෘත්තියෙන් සිවිල් ඉංජිනේරුවරයෙකු වයත් මධ්‍යම පරිසර අධිකාරියේ අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් සේවය කරන බවත්, ඊට පෙර මානව සම්පත් පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් සේවය කළ බවත් ප්‍රකාශ කර සිටී.

මීතොටමුල්ල අංගනයට කසල දැමීම 2009 වසරේ ලබා දුන් අධිකර නියෝගයක් මත අක්කර 02 ක බිම් ප්‍රමාණයක ආරම්භ කල බවත් 2016 වන විට අක්කර 18 කට ආසන්න භූමි ප්‍රමාණයක් පුරා කසළ බැහැර කිරීම සිදු කළ බවත් ප්‍රකාශ කර සිටී. 1980 අංක 47 දරණ පනත අනුව පරිසර අධිකාරියට පැවරී ඇත්තේ නියාමන කටයුතු බවත්, නියාමන ආයතනයක් හැටියට කැළි කසල ගැටළුව සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් පහසුකම් ලබා දීමට ආයතනය බැඳී සිටින බවත්, මීතොටමුල්ලට කසල දැමීම ආරම්භ වූවාට පසුව පිහිටුවා තිබුණ පසු විපරම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් බැහැර කරන බව ආවරණය වූ බව ප්‍රකාශ කර සිටි.

සාමාන්‍යයෙන් කොළඹ නගර සභාව පිළිබඳව අධිකාරිය දැනුවත්ව සිටින්නේ විශේෂඥ දැනුමක් ඇති නිලධාරීන්ගෙන් සමන්විත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව වෙනම අධ්‍යක්ෂක වරයෙකු යටතේ පාලනය වන විශේෂිත ආයතනයක් හැටියට බවත්, කසළ

බැහැර කිරීම සම්බන්ධයෙන් ලෝකයේ පිළිගත් ක්‍රම වේදය වූයේ කිසිවක් කරන්න බැරිවුවත් කසළ වෙන් කිරිම කළ යුතු යන මතයේ බවත්, ඒ අනුව ප්‍රතිචක්‍රීකරණය කළ යුතු කොටස් ප්‍රතිචක්‍රීය කළ යුතුව තිබුණ බවත්, ලෙහෙසියෙන්ම කළ යුතුව තිබුණ දිරාපත් හා නොදිරණ කසළ වෙන්කර කොම්පෝස්ට් පොහොර නිපදවීම සිදු කල යුතුව තිබුණ නමුත් මේ කිසිම කායර්යක් කොළඹ මහ නගර සභාව සිදුනොකළ බවත් ප්‍රකාශ කර සිටී.

අධිකාරිය 2008 වශර්යේදී ජාතික පිළිසරු යනුවෙන් හඳුන්වන ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කළ බවත්, එහි පරමාථර්ය සියළුම පළාත් පාලන ආයතන වලට අවශ්‍ය තාක්ෂණ සහය මූල්‍යාධාර, සහ උපකරණ ලබා දී සෞඛ්‍යාරක්ෂක ලෙස කසළ බැහැර කිරීම ඔවුන්ට යොමු කිරීම බවත්, මහ නගර සභා ආඥා පනත අනුව කසළ කළමණාකරණයේ නෛතික වගකිය පැවරී ඇත්තේ කොළඹ සභාවට බවත්, ඒ අනුව කොළඹ මහ නගර සභාවෙන් අවශ්‍ය උපදෙස් සහය මොනවාදැයි දැනුම් දෙන ලෙසට දැන්වූ විට නගර සභාව පිළිසරු ව්‍යාපෘතියෙන් කිසිඳු පහසුකමක් අවශ්‍ය නොවන බව දන්වා සිටි බවත් ප්‍රකාශ කර සිටී.

කසළ දමන ස්ථානය කොලොන්නාව නගර සභාවට අයිති ඉඩමක් බැවින් අධිකාරිය රු.මිලියන 100 ක් පමණ වියදම් කර ටොන් 50 ක විතර ධාරිතාවයක් දැරීමට හැකි කොම්පෝසට් අංගනයක් රජයේ මුදලින් ආරම්භ කළ බවත්, කොළඹ මහ නගර සභාව සහ කොලොන්නාව නගර සභාව එයින් ප්‍රයෝජනයක් නොගත් බවත් ගොඩනැගිලි මේ වන විට කුණු කන්දට යට වීඇති බවත් ප්‍රකාශ කර සිටී.

මීතොටමුල්ල කුණු කන්ද ක්‍රමයෙන් වැඩි වීම හේතු කොටගෙන විවිධ පාශර්වයන් විසින් කොළඹ මහ නගර සභාවත් මධ්‍යම පරිසර අධිකාරියත් වග උත්තර කරුවන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ SCFR 311/15 නැමැති මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා ඇති බවත්, එම නඩුව පවතිද්දී පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම් කසළ කළමණාකරණයට සම්බන්ධ සියළුම පාශර්වයන් කැඳවා 2017.02.02 දින රැස්වීමක් පැවැත්වූ බවත්, ඊට පසුව 2017.03.07 වෙනි දින ද අමාත්‍යංශයේ ලේකම් සහ ගරු අමාත්‍ය ෆයිසර් මුස්ථාපා මහතාගේ ප්‍රධානත්වයෙන් තවත් රැස්වීමක් පැවැත්වූ බවත්, එහිදී නාගරික සංවධර්න අධිකාරියට අයත් මීතොටමුල්ලට කසළ දැමීම වහාම නවත්වන ලෙසට කොළඹ මහ නගර සභාවට නියමකළ බවත්, ඒ බව සාකච්ඡා සටහන් වල එනම් X145 ලේඛනයේ ඇතුලත්ව තිබෙන බවත් ප්‍රකාශ කර සිටී.

මීතොටමුල්ල කසළ අංගනයට අදාලව කොළඹ මහ නගර සභාව අධිකාරියෙන් පරිසර ආරක්ෂක බලපත්‍රයක් ඉල්ලා නොසිටි බවත්, ජාතික වශයෙන් සලකා අංගනය යහපත්ව පවත්වාගෙන යෑමට අධිකාරිය මැදිහත් වූ නමුත් කොළඹ මහ නගර සභාවත් කොලොන්නාව නගර සභාවත් එයට අනුගත නොවූ බවත්, මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන විට පාරිසරික ඇගයිම් වාථර්ාවක් අවශ්‍ය බවත්, පාරිසරික පනත සහ රෙගුලාසි වලට අනුව එවැනි අවස්ථාවකදී නීතිමය පියවර ගතයුතු වුවත් උසාවි නියෝගයක් තිබෙන බැවින් එයට විරුද්ධව කටයුතු නොකළ බවත් ප්‍රකාශ කර සිටී.

2017 අප්‍රේල් 14 වන දින ආපදාවට ලක් වන්න ආසන්න දිනයකදී මෙම ස්ථානය නිරීක්ෂණය නොකළ බවත්, නමුත් නිලධාරීන් වශයෙන් පුද්ගලිකව ගිය අවස්ථා තිබුණ බවත්, කමිටු රැස්වීම් වලදී අධිකාරියේ තාක්ෂණික මැදිහත් වීම උපරිම වශයෙන් ලබා දුන් බවත්, ඒහිදී ඉදිරිපත් වු කරුණු මත ගත් තිරණ කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක නොකිරීම නිසා මේ ආපදා තත්වය ඇති වුණ බවත්, 2017 මාතර්ු 07 වා පැවැති රැස්වීමේදී කන්ද පරීක්ෂා කර බැලීමට දින නියම කර ගත් බවත්, ඒ අනුව ෆයිසර් මුස්තාපා ඇමති තුමා අප්‍රේල් 26 වෙනි

දින කන්ද පරීක්ෂා කිරීමට දින ලබාදුන් බවත්, නමුත් ඒ අතරතුර මෙම ඛේදවාචකය සිදුවන බවත් ප්‍රකාශකර සිටී.

කොළඹ මහ නගර සභාව ජාතික පාරිසරික නීති පිළිබඳව කිසිම අවධානයක් නොදක්වා එමෙන්ම අධිකාරිය විසින් පෙන්වාදුන් තාක්ෂණික කරුණුද නොසලකා මේ ස්ථානය පවත්වාගෙන යෑමට ක්‍රියා කිරීමෙන් මෙම ආපදා සිදු වූ බවත් ප්‍රකාශ කර සිටී.

## නිෂාන්ත ප්‍රසාද් කුමාර රණවීර මහතා.(නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ව්‍යාපෘති කළමනාකාර)

නාගරික සංවධර්න අධිකාරියට 1997/10/27 දින ක්ෂේත්‍ර සහකාරවරයෙකු වශයෙන් බැඳී 1998 07 වැනි මාසයේ ස්ථිර සේවයට පත් වුන බවත්, දැනට අධ්‍යක්ෂක ව්‍යාපෘති කළමනාකාර වශයෙන් සේවය කරන බවත්, කොලොන්නාව මීතොටමුල්ල පොතුවිල් කුඹුර තියන නාගරික සංවධර්න කටයුත් සඳහා අත්සන් කළ බවත්, එම ඉඩම අක්කර 21ක වපසරියකින් යුතු ඉඩමක් බවත්, නාගරික සංවධර්නය අධිකාරියට පවරා ගන්නා විටත් ඉඩමට කැලි කසළ බැහැර කරමින් තිබුණ බවත්, කසළ දැමීම කොලොන්නාව නගර සභාව, ජයවධර්නපුර කෝට්ටේ නගර සභාව සහ එවකට පැවති කඩුවෙල ප්‍රාදේශීය සභාව සහ කොලොන්නාව නගර සභාව අවසරය ලබා දුන් පෞද්ගලික කසළ බැහැර කරන්නන් විසින් ද සිදු කළ බවත් ප්‍රකාශ කර සිටි.

මෙම ඉඩමේ භුක්තිය අධිකාරියට ලැබෙන්නේ 2002 වෂර්යේ දී බවත්, නමුත් දීමනා පත්‍රයක් හැටියට ලැබුනේ 2004 වෂර්යේ අග භාගයේ දී බවත්, 2009/04/28 දිනෙන් ලැබුණු ශ්‍රේෂ්ඨාධිකරනයේ නියෝගයක් අනුව අක්කර 02ක බිම් ප්‍රමාණයක් කොන්දේසි සහිත ව කොළඹ මහ නගර සභාවට වසර දෙකකට කසළ දැමීමට අවසර දුන් බවත්, එසේ ම සුදුසු ව්‍යාපෘතියක් තෝරාගෙන ස්ථිර කැලි කසළ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලෙසට ද අධිකරනය නියේග කළ බවත්, ඒ අනුව කොළඹ මහ නගර සභාව ටෙන්ඩර් කැඳවා Western Power නැමැති ආයෝජකයෙක් තෝරා ගන්නා බවත්, ඒ සඳහා අක්කර 03 ක ඉඩම ඉල්ලා සිටි බැවින් කුණු දමන්න අවසර දුන් අක්කර 02ක ඉඩමට යාබද අක්කර 3 ½ න ඉඩමක් කොළඹ මහ නගර සභාවට අවුරුදු 30ක කුලී පදනම මත භාරදුන් බවත්, ඒ සඳහා ආයෝජකයාගෙන් මිලියන 32ක මුදලක් ලබා ගත් බවත්, ඉඩම ලබා දුන්නාට ඉඩම සංවධර්නයට ආයෝජකයා ඉදිරිපත් නොවූ බවත්, එයට මහජන උද්ඝෝෂණ හා විරෝධතා සහ වෙනත් හේතු නිසා ව්‍යාපෘතිය 2009 සිට 2012 වෙනකල් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත්, පසුව එම ඉඩමටත් කසළ දැමීම ආරම්භ කළ බවත් ප්‍රකාශ කර සිටි.

මීට අමතර ව පිළිසරු කියලා ව්‍යාපෘතියක් මධ්‍යම පරිසර අධිකාරිය හරහා ක්‍රියාත්මක කළ බවත්, එමඟින් දවසට මෙට්‍රික් ටොන්15ක පමණ කාබනික පොහොර නිෂ්පාදනයට සැලසුම් කර තිබුණ බවත්, එම ව්‍යාපෘතියට වෙන්කර තිබුණ අක්කර 21 ඉඩමෙන් අක්කර 04ක ප්‍රමාණයක් කොලොන්නාව නගර සභාව පිළිසරු ව්‍යාපෘතිය සඳහා ලබා දුන් බවත්, මෙම ව්‍යාපෘතියට රජයේ ආධාර වශයෙන් රුපියල් මිලියන 122ක පමණ මුදලක් කොලොන්නාව නගර සභාවට ලැබුණු බවත් නගර සභාවේ ගොඩනැගිල්ලක් මේ සඳහා පාවිච්චි කල බවත්, නමුත් ව්‍යාපෘතිය අසාථර්ක වූ බවත් ප්‍රකාශ කර සිටි.

2012 වෂර්යේ අග භාගයේ හෝ 2013 වෂර්යේ මුල් භාගයේ කුණු කන්දේ තෙරපුමක් සමඟ ආපසු කන්ද උඩට මතු වු බවත්, අවට තිබුණු ගෙවල් 162ක් පමණ ගිලා බැසීමක් සිදු වී පූණර් හානියට පත් වුණ බවත්, ජීවිත හානි කිසිවකු සිදු නොවූ බවත්, ඒ අවස්ථාවේ ආසන්නයේ සිටි පවුල් 62 ඉවත් කළ බවත්, ඔවුන්ට විකල්ප නිවාස පහසුකම් මාසික කුලී පදනම මත ලබා දුන් බවත්, පසුව නාගරික සංවධර්න අධිකාරිය විසින් ආරම්භ කර තිබුණ නාගරික පුනජර්ීව ව්‍යාපෘතිය යටතේ පෙර කී නිවාස 162 නිවැසියන්ට නිවාස ලබා දුන් බවත්, ඒ සඳහා වැය වුන පිරිවැයෙන් භාගයක් අධිකාරියට කොළඹ නගර සභාව ලබා දෙන බවට පොරොන්දු වු නමුත් මෙතෙක් ඒ මුදල් ලැබුනේ නැති බව ප්‍රකාශ කර සිටි.
2012 වෂර්යේ දී ආපදා තත්ත්වයක් ඇති වුනාට පස්සේ මහ නගර සභාවට අවට සිටින පවුල් ඉවත් කරන ලෙසට ලියුමකින් දැනුම් දුන් බවත්, පසුව 2013 වෂර්යේ දී ද කුණු කන්ද පැත්තේ 101 වත්ත හා හාල්ගහ කුඹුර පැත්තේ ඉන්න පදිංචිකරුවන් ඉවත් කරන ලෙසට දැනුම් දුන් බවත් ප්‍රකාශ කර සිටි.

2015 වෂර්යේ දී අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ආථර්ික කටයුතු පිළිබඳ උපදේශක සභාවෙන් තවත් අවුරුදු දෙකකට කැලි කසළ බැහැර කරන්න මහ නගර සභාවට අවසර ලබා දෙන ලෙසටත් ඒ එක්කම එයට සාපේක්ෂ ව දීඝර් කාලීන ව කසළ කළමනාකරණ ව්‍යාපෘතියකට ටෙන්ඩර් කැඳවීමට නාගරික සංවධර්න අධිකාරියට උපදෙස් ලබා දුන් බවත්, ඒ අනුව ආථර්ික සංවධර්න කමිටුවේ සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අනුව විශ්ව විද්‍යාල ප්‍රවීණයින්, පරිසර අධිකාරිය, විදුලි බල මණ්ඩලය, සුනිත්‍ර බලශක්ති අධිකාරිය යන ආයතන වල නියෝජිතයන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් මණ්ඩලයක් පත් කළ බවත්, ඒ අනුව 2016/02/04 දිනෙන් ව්‍යාපෘති යෝජනා සඳහා ආයෝජකයන්ගෙන් ටෙන්ඩර් කැඳ වු බවත් ඒ අනුව ව්‍යෘපෘති යෝජනා 121ක් ලැබුණු බවත්, ඉන් 09ක්ම විදේශීය ආයෝජකයන් බවත්, අනිත් අය දේශීය අය බවත්, ටෙන්ඩර් කැඳවීමේ දී ටෙන්ඩර් කොන්දේසියක් හැටියට ටෙන්ඩර් ඉදිරිපත් කරන විට ඇමරිකන් ඩොලර් 25000ක තැන්පතුවක් අවශ්‍ය බවට කොන්දේසියක් ඇතුළත් කළ බවත්, පසුව ආයොජකයින් 07 දෙනෙකු තෝරා ගෙන තාක්ෂණික ඇගයීම් මණ්ඩලය හා ව්‍යාපෘති 07 ඇගයීමට ලක්කර කොළඹ කරදියානු අංගනය හදන්න විදුලිය උත්පාදනය කිරීම සඳහා ජමර්න් තාක්ෂණය අනුව පුද්ගලික සමාගමක් තෝරාගත් බවත්, ගම්පහ ප්‍රදේශයේ කසළ සඳහා K.C.H.T. යන ආයතනය තෝරා ගත් බවත්, එය කොරියානු තාක්ෂණය අනුව ක්‍රියාත්මක වන එකක් බවත් ප්‍රකාශ කර සිටි.

කසළ වල තියෙන තෙතමනය 70% මත් වඩා වැඩි නිසා ලබා ගත හැකි විදුලිය ප්‍රමාණය ලබා ගැනීමට කසළ දහනය කරන්න යන පිරිවැය වැඩි බවත්, ඒ නිසා ම විදුලියට ගෙවන මුදල වැඩි කර දෙන ලෙසට ආයෝජකයන්ගෙන් කසළ ටොන් එකකට දහනය කිරීමට ලබාදෙන විදුලි රේට් එකක මිල ගණන් වැඩි කර දෙන ලෙසට ඉල්ලීමක් ලැබුණු බවත්, ඒ අනුව යුනිට් එකකට ගෙවන මුදල රු.36.20 දක්වා වැඩි කිරීමට කැබිනට් අනුමැතිය ලබාගෙන ආයෝජකයින්ට දුන් බවත්, එම ආයෝජකයින් දෙදෙනා එම ව්‍යාපෘතිය ආරම්භ කර පවත්වා ගෙන යන බවත් ප්‍රකාශ කර සිටි.

මීතොටමුල්ල කසළ කන්දේ අවධානම පෙනි ගිය බැවින් 2016/09/06 දින කොළඹ මහ නගර සභාවට කුණු දැමීම නවත්වන ලෙසට ලිපියක් මඟින් දැනුම් දුන් බවත්. 2017 අප්‍රේල් 14 වෙනි දින මීතොටමුල්ල කන්ද කඩා වැටුන බවත්, වැටුනට පස්සේ නාගරික සංවධර්න අධිකාරිය හැටියට අත් කායර්ක් නොවුනත් අවතැන් වු පවුල් 90කාට පමණ නිවාස ලබාදුන් බවත්, ඊට පසුව නාගරික සංවධර්න අමාත්‍යාංශයේ ලේකම්වරයා ගොඩනැගිලි පයේර්ෂණ ආයතනය විශ්ව විද්‍යාලවල ප්‍රවීන්යන් සහභාගිකරවාගෙන කන්ද තවදුරටත් නාය යාම වැළැක්වීමට

අවශ්‍ය පියවර ගත් බවත්, එයට අවශ්‍ය ප්‍රතිපාදන අධිකාරියෙන් ලබාදී කන්ද ස්ථාවර තත්ත්වයට පත්කළ බවත් ප්‍රකාශ කර සිටී.

ඊට අමතර ව ලෝක බැංකුව හරහා කැලි කසළ තිබෙන ප්‍රදේශය එනම් කන්ද වටේ තියෙන අක්කර 12ක පමණ ප්‍රදේශය පරිසර හිතකාමී නාගරික උද්‍යානයක් පිහිටුවීමට පියවර ගෙන තිබෙන බවත් ප්‍රකාශ කර සිටී. කොළඹ මහ නගර සභාවට මෙම ස්ථානයට කසළ දැමීමට අවසර දුන්නේ කසළ ටොන් 700කට පමණක් බවත්, නමුත් එම ප්‍රමාණය ඉක්මවා මෙම ස්ථානයට කසළ දැමීම සිදු වී ඇති බවත් ප්‍රකාශ කර සිටී.

2009 වෂර්යේ ශ්‍රේෂ්ඨාධිකරනයේ නියෝගය අනුව කසළ බැහැර කිරීමට මීතොටමුල්ල ඉඩම කොළඹ මහ නගර සභාවට ප්‍රධානයේ කොන්දේසි සහිත ව බවත්, එම කොන්දේසි X147 ලේඛනයේ ඇතුලත් වී ඇති බවත් ප්‍රකාශ කරමින් ප්‍රකාශය තහවුරු කිරීම සඳහා ලියකියවිලි රාශියක් X148 සිට X162 වශයෙන් සලකුණු කර කමිටුව ඉදිරිපත් කරන බවත් වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී.

ඉහත ප්‍රකාශයන්ට අමතර ව පරීක්ෂණ සභාව වෙත ප්‍රකාශනයක් යටතේ සහ ඉන් පරිබාහිර ව ඉදිරිපත් වූ හා ඉදිරිපත් කරවා ගත් ලේඛන සහ ලිපි ගොනු පිළිබඳ තොරතුරු උපලේඛන “අ” වශයෙන් සඳහන් කර ඉදිරිපත් කර සිටී.

එලෙස ඉදිරිපත් වූ කරුණු විශ්ලේෂණය කරමින් මෙම පරීක්ෂණ සභාය පත් කිරීමට අදාල පරමාථර් යටතේ මත එක් එක් කරුණ සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත සඳහන් කරමි.

## 01. 2017 අප්‍රේල් මස 14 දින මීතොටමුල්ල ප්‍රදේශයේ සිදු වූ කසළ කන්ද කඩා වැටීම පිලිබඳ ආපදාව, එම ස්ථානයේ කසළ එකතු කිරීමෙන් පැන නැගිය හැකි විවිධ හානිකර තත්වයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කිසියම් අදාළ රාජ්‍ය ආයතන/නියෝජිත ආයතන/රාජ්‍ය නිලධාරීන්/ පුද්ගලයින් වෙත පූර්ව දැනුම් දීමක් ලැබී තිබුනේද යන වග.

පරීක්ෂණ සභාව ඉදිරියේ ඉදිරිපත් වූ කරුණු අනුව 2009 වෂර්යේ සිට අදාළ ස්ථානයේ කුණු බැහැර කිරීමෙන් පසු මෙම ස්ථානය 2013 වෂර්ය වන විට මෙම ප්‍රදේශය ප්‍රධාන ආපදා තත්ත්වයට කරුණු යෙදීම ආරම්භ වී ඇත. කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ ප්‍රකාශයෙන් ද තහවුරු වන්නේ ස්ථානයේ ඇති වූ ආපදා තත්ත්වය හේතුවෙන් කසළ බැහර කරන ලද ප්‍රදේශයේ ආසන්න ව පදිංචිය ඇති පිරිසෙන් යම් පිරිසක් සඳහා ස්ථාන ලබා දෙමින් වෙනත් ස්ථානයක පදිංචි කරලිම සඳහා කටයුතු කර ඇති බවයි.

බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශයෙන් තහවුරු වන්නේ කසළ බැහැර කරන ලද ස්ථානය අක්‍රමවත් අවිධිමත් තත්ත්වයක පවත්වාගෙන යාම හේතුකොට ගෙන කසළ බහැර කරන ප්‍රදේශයෙන් මීටර් 200 ක පරිධියෙන් යුතු ප්‍රදේශයක් අධි අවධානම් කළාපයක් වශයෙන් හඳුනා ගත් බවයි. ඒ අනුව ඊට අදාළ ව පිළියෙල කරන ලද වාතර්ාවක් 2017/06/13 දින කොළඹ මහ නගර සභව, නාගරික සංවධර්න අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය ඇතළු ආයනතයන්හි නියෝජිතයින් කැඳවා බස්නාහිරි පළාතේ ප්‍රධාන අමාත්‍ය වරයාගේ ප්‍රධානත්වයෙන් පැහැදිලි කර දීම් සිදු කර අදාළ

වාතර්ාව ඉදිරිපත් කළ බවත් ඔහු ප්‍රකාශ කර සිටි. එසේ ම අදාළ වාතර්ාව පරීක්ෂණ සභාව වෙත X3 එහෙත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි අධ්‍යක්ෂකගෙන් ප්‍රකාශයෙන් වැඩිදුරටත් අනාවරණය කරේ අදාළ වාතර්ා මඟින් පෙන්වා දුන් කරුණු සම්බන්ධයෙන් කොළඹ මහ නගර සභාව කිසිදු ක්‍රියාමාගර්යක් නොගත් බවයි.

2009 වෂර්යේ කසළ බැහැර කිරීමට මෙම ස්ථානයට අවසර ලබා දීම අක්කර 2 භූමි ප්‍රදේශයකට සීමා වුවත් 2017 වෂර්යේ ආපදාව සිදු වන විට එය අක්කර 20කට ආසන්න භූමි ප්‍රදේශයකට ව්‍යාප්ත වී පැවති ව ඇති අතර කුණු බැහැර කිරීම ආරම්භ කරන අවස්ථාවේ දී මෙම ස්ථානයේ නියාමන කායර්ය මධ්‍යම පරිසර අධිකාරියේ වගකීම් යටතට ඇතුලත් වී ඇත. එසේ 2017 අප්‍රේල් මාසයට පූවර්යෙන් එම අධිකාරිය ආසන්න වසර කිහිපයක කාලය තුළ එම ස්ථානය සම්බන්ධයෙන් කවර හෝ නිගමනයක් කර ඇති බවක් මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් ප්‍රකාශයක් ඉදිරිපත් කළ එහි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට තහවුරු කළ නොහැකි විය.

එසේ මෙම ස්ථානයට අදාළ ව විය හැකි ආපදාව පූවර්යෙන් හඳුනා ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මැදිහත් වීමක් සිදු වී නොමැති බව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් පරීක්ෂණ සභාව ඉදිරියේ ප්‍රකාශයක් කරන ලද එහි අතිරේක අධ්‍යක්ෂක විසින් ප්‍රකාශනය පිළි ගන්නට යෙදුනි. එසේ ම ඔහු තවදුරටත් පරීක්ෂණ සභාව ඉදිරියේ පිළිගනු ලැබුවේ ඒ සම්බන්ධයෙන් තම ආයතනයේ වගකීම නිසි අයුරින් ඉටු නොවුණු බවය.

එසේ ම මීට අදාළ ව විසඳිය යුතු වැදගත් කරුණක් වන්නේ මෙම ස්ථානයට ප්‍රධාන වශයෙන් කසළ බැහැර කරන ආයතන වන කොළඹ මහ නගර සභාව, සහ එම ස්ථානය පිහිටි පළාත් පාලන ආයතනයක් වන කොලොන්නාව නගර සභාව ස්ථානය සම්බන්ධයෙන් ආපදා අවදානම හඳුනා ගැනීමේ නිරන්තතර අවධානයකින් හා වුවමනාවකින් ක්‍රියාකර තිබේ ද යන්නයි. එසේ නම් ඒ සඳහා විද්‍යාත්මක පයෙර්ෂණ ක්‍රමවේදයක් යටතේ ක්‍රියා කලේ ද යන කරුණත් මෙහිදී වැදගත් වේ. පරීක්ෂණය යටතේ ලබා ගත් ඉහතින් විශ්ලේෂිත ප්‍රකාශයන් තුළ පැහැදිලි ව තහවුරු වූ කරුණක් වුයේ 2013 වෂර්ය පමණ වන විට මීතොටමුල්ල කසළ බැහැර කරන ස්ථානය තවදුරටත් කසළ බැහැර කිරීම ඒ ආකාරයෙන් සිදු කිරීමට උචිත නොවන තත්ත්වයකට පත් තිබූ බවයි.

ඉන් අනතුරුව 2016/06/13දින බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය කරන ලද අධ්‍යනයනකින් පසු ඉදිරිපත් කර ඇති වාතර්ාව මෙහිලා විශේෂයෙන් සැලකිය යුතු වෙයි. එම අධිකාරියේ අධ්‍යක්ෂක වරයාගේ ස්ථාවරය වුයේ තමන් ඉදිරිපත් කළ වාතර්ාවෙන් පෙන්වා දුන් කරුණු සම්බන්ධ ව කොළඹ මහ නගර සභාව කිසිදු ක්‍රියාමාගර්යක් නොගත් බවයි. කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් සිය ප්‍රකාශය මඟින් ආපදා හට ගන්නා අවස්ථාවන් යටතේ 2013 වෂර්යේ පටන් අසල පදිංචිය ඇති පිරිස් වරින් වර මුදල් ලබා දෙමින් බැහැර කරන්නට කටයුතු කලා යැයි ප්‍රකාශ කළ ද, ඇති වී හැකි ආපදා හඳුනා ගැනීම වළක්වාලීම හෝ බලපෑම අවම කිරීම උදෙසා වෙනත් කිසිදු ක්‍රියාමාගර්යක් ගෙන තිබූ බවට කරුණු අනාවරණය නොවුනි.

තවද කොළඹ මහ නගර සභාවේ අධ්‍යක්ෂක ඉංජිනේරු ( අපද්‍රව්‍ය කළමනාකරණ) විසින් සිය ප්‍රකාශ යටතේ සඳහන් කරනු ලැබුවේ තමන් රාජකාරි භාර ගැනීමෙන් පසුව අවස්ථා දෙකක දී කොළඹ මහ නගර සභාව වෙත ඉදිරිපත් කළ වාතර්ා යටතේ මෙම ස්ථානයේ ඇති විය හැකි සංකීණර් ආපදාවක් පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන්නට යෙදුනු බවයි. ඊට අදාළ ව ඉදිරිපත් කළ වාතර්ා සිය ප්‍රකාශය සමඟ ඇය විසින් ඉදිරිපත් කරන ලදි. ඒ සියල්ල අවසන් වශයෙන්

කළ කසළ බැහැර කිරීම සඳහා විකල්ප ස්ථානයක් නොවීම යන කරුණ මත සියල්ල පාලනය වූ බව ප්‍රාකාශ කර සිටී.

තව ද කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් ස්වකීය ප්‍රකාශය මඟින් තමන් 2017/01/11දින කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් වශයෙන් පත් වීමෙන් පසු "මීතොටමුල්ල කසළ කන්ද" සම්බන්ධයෙන් ඒ වන විටත් අසා තිබූ හෙයින් එය දැන ගැනීම සඳහා නිරීක්ෂණය කළ බව, නිල රාජකාරි වශයෙන් තමන් ඒ ස්ථානයට යන්නට සිදු වූයේ 2017/04/07 දින බවත් ය. එදින තමන්ට අදාළ ප්‍රදේශයේ පොළවෙහි වෙනස් වීම් ඇති බවට ග්‍රාම නිලධාරි විසින් කරන ලද වාතර්‍ා කිරීමට අනුව එම ස්ථානයට ගිය බව ප්‍රකාශ කර සිටියි. ඒ අනුව තමන් ස්ථානයේ පැවති භෞතික වෙනස්වීම් නිරීක්ෂණය කර අවදානම් යැයි හඳුනා ගත් පාශර්වයන් වෙත ලිඛිත දැන්වීමක් මඟින් එම ස්ථානයෙන් ඉවත් වීමට උපදෙස දුන් බව ප්‍රකාශ කර සිටියි. තව ද එසේ දැනුම් දීම් සනාථ කිරීම සඳහා ඊට අදාළ කායර්‍ාලීය පිටපත් X4A සිට X4I දක්වා වශයෙන් සටහන් කර ඉදිරිපත් කරන ලදි.

පරීක්ෂණ සභාව වෙනුවෙන් කරන ලද ප්‍රශ්න කිරීම් යටතේ එවැනි ආපදාවක් නිරීක්ෂණ වේ නම් තවත් එවැනි ලිපියක් යම් පාශර්වයකට භාර දීම ම ප්‍රමාණවත් ද, යන්නත් හඳුනා ගත් ආකාරයට අනන්‍යතාවයක් යටතේ අදාළ ලියවිලි භාරදීම සිදු වුව ද පිළිබඳ ප්‍රශ්න කිරීමේ දී, එයට පරීක්ෂණ සභාවට සෑහීමකට පත් විය හැකි පිළිතුරක් ලබා දීමට අපොහොසත් විය.

එසේ ඊට අදාළ ව කසළ බැහැර කරන ලද ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරි වන දහම්පුර කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් සිය ප්‍රකාශය මඟින් ද ප්‍රකාශ කර සිටියේ ඔවුන්ගෙන් විමසා හඳුනා ගත් පාශර්වයන් වෙත අදාළ දැන්වීම් භාර කළ බවයි.

තව ද මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් ප්‍රකාශයක් ලබාදෙන ලද එහි නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් ප්‍රකාශ කරන ලද්දේ ස්ථානය උපරිම වශයෙන් පාරිසරික නියාමනයන්ගෙන් බැහැරට පවත්වාගෙන ගිය බවත්, පාරිසරික රෙගුලාසීන්ට අනුකූල ව මීතොටමුල්ල කසළ බැහැර කරන ලද ස්ථානයට පරිසර ආරක්ෂණ බලපත්‍රයක් හෝ පාරිසරික ඇගයුම් සහතිකයක් නොමැති බවත්, මෙම අධිකාරිය විසින් ඒ මත එනම් මෙම ස්ථානය සම්බන්ධයෙන් තම අධිකාරියට වාතර්‍ා වී ඇති කරුණු අනුව ස්ථාන පරීක්ෂණයක් සිදු කිරීමට 2017 අප්‍රේල් මස 07 දිනයේ ස්ථාන පරීක්ෂණයක් සිදු කිරීමට නියමිත තිබූ බවත්, ඊට ප්‍රථමයෙන් මෙම ව්‍යසනය සිදු වූ බවත් ය.

ලබා ගත් ප්‍රකාශනයන්, ඉදිරිපත් වූ ලේඛණ සියල්ල ආශ්‍රයෙන් සැලකීමේ දී 2017 අප්‍රේල් 14 දින සිදු වූ ව්‍යසනය එලෙසින් ම එදින සිදු වන බවට නොවුනත් ඊට ආසන්න කාල වකනුව වන විට අදාළ ප්‍රදේශය ප්‍රබල ආපදා තත්ත්වයකට කරුණු යෙදී ඇති බව සලකා ඒ පිළිබඳ ව ක්‍රියාමාගර් ගැනීම අවශ්‍ය තරම් කරුණු පැන නැඟී, ඒ හා සම්බන්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් සිට ඇති බව නිගමනය කරයි. පරීක්ෂණ සභාව වෙත ඉදිරිපත් වූ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය 2016 වෂර්යේ ජනවාරි මස 28 වන විට අදාළ ස්ථාන පිළිබඳ ස්ථාන පරීක්ෂණයක් සිදු කර ඊට අදාළ ව ඉදිරිපත් කර ඇති වාතර්‍ාවේ පහත සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ද ප්‍රමුඛ අවධානම යොමු කල යුතුවේ.

- මේ යටතේ අපද්‍රව්‍ය ප්‍රතිස්ථාපනය කිරීම සහ කෙටි කාලීන මෙහෙය වීම. (සම්බන්ධයෙන් භූමි නිමර්ාණය (landscaping) සැලසුම් කල යුතු ඇත.)

- මේ වන විට කොළඹ මහ නගර සභාව විසින් සිදු කරගෙන යන මීතොටමුල්ල අපද්‍රව්‍ය අංගනයට යාබද අක්කර 03 ක ඉඩමක් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම හා එම බිම් ප්‍රමාණය මෙම සැලසුම් සඳහා ද ඇතුල් කිරීම.

- අවකාශය සහ භූමි සැලසුම් කරණයේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම.

    - බිම් පිරවීම ඉවුරු නිමර්ාණය කිරීම.
    - පිවිසුම් මාගර්ය සහ අභ්‍යන්තර මාගර් පද්ධතිය ස්ථාපනය කිරීම.
    - ගිනි නිවීමේ වැඩ සටහනක් සැලසුම් කිරීම.
    - අප ජලය එකතු කිරීම සහ පිළියම් කිරීම හා වැසි ජලය කළමනාකරණ සඳහා සැලසුම් හා පහසුකම් නිමර්ාණය කිරීම.
    - අපද්‍රව්‍ය සුළඟින් ගසාගෙන යාම වැලැක්වීම සඳහා වැටක් නිමර්ාණය කිරීම.
    - කායර්ාලීය සහ කායර්ාලයට අවශ්‍ය යටිතල පහසුකම් සංවධර්නය කිරීම.
    - අවරෝධක කලාපයක්(Butter Zone) හරිත පටියක් (Green Belt) පිහිටුවීම.
    - photocaping වැනි දේශීය තාක්ෂණික ක්‍රමයක ද භාවිතා කරමින් කසළ කන්ද මගින් සිදු වන පාරිසරික හානිය වැලැක්වීම හා දූෂණය අවම කිරීම.

- ඉංජිනේරු සැලසුම් කටයුත් සිදු කිරීම වෘත්තීය කායර්යක් වන අතර එකී කායර්ය මොරටුව විශ්ව විද්‍යාලය වෙතින් සිදු කර ගැනීම.

- මෙම සැලසුම් සකස් කර ගැනීම ඉතා කෙටිකාලීන ව (මාස 06ක් ඇතුලත) සිදු කිරීම.

එවැනි වාතර්ාවක් ඉදිරිපත් වූ බව පිළිගත් බව ප්‍රකාශ කර සිටින කොළඹ නාගරික කොමසාරිස් ඒ අනුව කටයුතු කිරීම සඳහා එකඟතාවය දැනුම් දුන් බව ප්‍රකාශ කර සිටියි. එහෙත් ඊට අදාළ ව කිසිදු ක්‍රියාමාගර් ක්‍රියාමාගර්යක් නොගත් බව අධිකාරියේ ස්ථවරය වේ. එසේ නම් අපද්‍රව්‍ය අධිකාරි අදාළ වාතර්ාව ඉදිරිපත් කිරීමෙන් පසු ඊට අදාළ පසු විපරම් ක්‍රියාවලියක යෙදුනු බවත් හෝ බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ අධිකාරිය වෙත ලැබී ඇති බලතල හා පළාත් පාලන ආයතන අධීක්ෂණ කිරීම සම්බන්ධයෙන් බස්නාහිරි පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට ඇති බලතල කොළඹ මහ නගර සභාව අත්තනෝමතිකව ක්‍රියා කිරීම සම්බන්ධව කටයුතු කිරීමක් සිදු වී නොමැත.

සිද්ධියට ආසන්න වශයෙන් ආපදා අවදානම වාතර්ා වීම කොලොන්නාව ප්‍රාදේශීය ලේකම්ට 2017 අප්‍රේල් 07 දිනෙන් සිදු කර ඇත. ඊට අදාළ ව ප්‍රාදේශීය ලේකම් විසින් හඳුනාගත් පවුල් අටක් වෙනුවෙන් ඉවත් වීම සඳහා ලිඛිත දැන්වීම් ග්‍රාම නිලධාරි මගින් 2017 අප්‍රේල් 07 දින සවස් කාලයේ දී භාර දීමට ක්‍රියා කර ඇත. කිසියම් පිරිසක් ඊට අනුකූල වූ බව ප්‍රකාශ කල ද එම හඳුනා ගැනීමේ ලියවිලි නිසි ආකාරයෙන් භාර දීම සම්පූණර් වූ බවට කරුණු තහවුරු වීමක් නොමැත.

කොළඹ මහ නගර සභාව අදාළ ස්ථානයෙන් කසළ ඒකරාශි කිරීමෙන් ඇතිවිය හැකි ආපදාව හා හානි කර තත්ත්වය විද්‍යාත්මක හඳුනා ගැනීමක් වෙනුවෙන් කිසිදු ක්‍රියාමාගර්යක් ගෙන නොමැති අතර 2017.04.07 දිනෙන් ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද වාතර්ා කිරීම, අනුව ද ස්වයං පාලනයෙන් පදිංචිකරුවන්ගේ ඉවත් වීම අපේක්ෂා කරමින් සිටිම හා එසේ පිටසන් වන්නේ නම් ඊට අදාළ ව මහ සභාව තීරණය කර ඇති පරිදි මූල්‍ය වටිනාකම ලබා දීම සඳහා ක්‍රියා කිරීම හැර වෙනත් ගත් ක්‍රියාමාගර්යක්
කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් ක්‍රියාත්මක කර නොමැත.

විශේෂයෙන් 2017 අප්‍රේල් මස 07 දින සිට 2017 අප්‍රේල් 14 දින දක්වා කාලය තුල අදාල ස්ථානයට කසළ බැහැර කිරීම මත පොලොවේ භෞතික ස්වරූපයන් වෙනස් වීම් සිදු වෙමින්, ගොඩනැගිලි පුපුරා යමින් පවතින අවස්ථාවක එම බලපෑමට ලක් වී ඇති හා ලක් වෙමින් පවතින පාශර්වයන්ට සිය කැමැත්තෙන් එම පරිශ්‍රයෙන් ඉවත්වීමට අවස්ථාව සලසා දීම හැර (එසේ ඉවත් වීම වෙනුවෙන් නවාතැන් පහසුකම් සලකා ගැනීම සඳහා මූල්‍යමය ප්‍රධානයන් සහිත ව) ඒ සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත් වීමකින් අදාළ පාශර්වයන් කඩිනමින් එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් කිසිවෙකුගේ ක්‍රියාවක් වී නොමැත.

විශේෂයෙන් කොළඹ මහ නගර සභාව ඒ හා සම්බන්ධයෙන් 2017 අප්‍රේල් 07 වන දින වන විට අදාල ස්ථාන අවට පැන නැගී පාරිසරික වෙනස් වීම් සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පයෙර්ෂණ ආයතනය සම්බන්ධ කරගනිමින් ඊට අදාල පරීක්ෂණයක් සිදු කිරීමටත් අවම වශයෙන් ක්‍රියාත්මක වී නොමැත.

තවද කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් අදාළ පාශර්වයන් වෙත ලිඛිතව වාතර්ා කිරිම හැර කාරණයට ක්ෂණිකව ක්‍රියාත්මක වෙමින් ගත යුතු ක්‍රියාමාගර් කිසිවක් ගත් බවට ප්‍රමාණවත් කරුණු නොමැත.

මෙම සියළුම කරුණු සැලකීමේදී එම ස්ථානයේ කසල එකතු කිරීමෙන් පැන නැගිය හැකි හානි කර හා ආපදා තත්වය නිශ්චිතව ම පහත සඳහන් රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනය එහි පරිපාලන ප්‍රධානීන් ඇති විය හැර ආපදා තත්වය පිළිබඳව ක්‍රියාත්මක වීම සඳහා ප්‍රමාණවත් හා සාධාරණ කාලයකට පූවර්යෙන් දැන සිටියා ය යන්න නිගමනය කරමි.

එකී රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන නම්,

- කොළඹ මහ නගර සභාව
- කොළොන්නාව ප්‍රාදේශීය මහ ලේකම් කායර්ාලය
- බස්නාහිර පළාගේ ඝණ අපද්‍රව්‍ය අධිකාරිය

එසේම අදාල කසළ බැහැර කිරිම සමාජ කතිකාවක් දක්වා ව්‍යාප්ත වීමට තරම් ඒවන විට සමාජ උද්ඝෝෂණ හා සිවිල් ක්‍රියාකාරකම් වධර්නය වී තිබූ තත්වයක, නිරන්තරයෙන් මෙම ස්ථානය සම්බන්ධව මාධ්‍ය වතර්ා කිරීම ආදී කටයුතු සිදු වී ඇති බව පරීක්ෂණ සභාවට ඉදිරිපත් වූ සිවිල් සංවිධාන නියෝජිතයනගේ හා සිවිල් පුරවැසියන්ගේ ප්‍රකාශ වලින් තහවුරු වීම.

එවන් තත්වයක මෙම ස්ථානය හා සම්බන්ධයෙන් පැන නැගී ඇති හානිකර තත්වයක් හා ගත හැකි පිළියම් හඳුනාගැනීම සඳහා ක්‍රියාත්මක වීමේ නෛතික වගකීමක් මධ්‍යම පරිසර අධිකාරිය මෙන් ම ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇත. එම ආයතන ද මේ හා සම්බන්ධයෙන් සිය නෛතික වගකීම පැහැර හැර බව ද නිගමනය කරමි.

**02. එසේ ලැබී තිබිණි නම් එය කවුරුන් විසින් කවුරුන් වෙත කරනු ලැබුවේද යන වගත්, එම දැනුම් දීම සම්බන්ධයෙන් අදාල අධිකාරිය/අධිකාරීන් විසින් කවර ක්‍රියා මාර්ග ගන්නා ලද්දේද යන වගත්, මේ වනවිට ඒවායේ ප්‍රගතිය කෙසේද යන වගත්,**

අදාළ ස්ථානයේ ආපදා තත්වයකට කරුණු උද්ගත වෙමින් පවතින බව යම් පාශර්වයන් විසින් අදාළ අදාළ  පාශර්වයන් වෙත දන්වා තිබුණි නම් එය කවුරුන් විසින් කවුරුන් වෙත කරනු ලැබුවේ ද යන වගත් එම දැනුම් දීම සම්බන්ධයෙන් අදාල අධිකාරිය/අධිකාරීන් විසින් කවර ක්‍රියාමාගර් ගන්නේද යන වගත් මේ වන විට ඒවායේ ප්‍රගතිය  කෙසේද යන වග පරීක්ෂණ සභාව විසින් පරික්ෂාවට ලක් කරන ලදී.

පරික්ෂණ සභාව ඉදිරියේ ඉදිරිපත් වූ ලේඛන අනුව හා ඊට අදාල ප්‍රකාශයන්ට අනුව මෙම ස්ථානයේ ආපදා අවදානම පිළිබඳ සටන් හා සිවිල් සංවිධාන විසින් මෙන්ම මාධ්‍ය විසින්ද නිරන්තර ආවජර්නයක් කරන්නට යෙදී ඇත. ඊට අතිරේකව කරුණු හා සම්බන්ධව ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන ඒ හා සම්බන්ධ සිය ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කර ඇති ආකාරය වැදගත් වෙයි.

2016 අප්‍රේල් 15 දින බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමණාකරණය අධිකාරිය විසින් මීතොටමුල්ල කොළඹ මහ නගර සභාව ඇතුළු තවත් ආයතන විසින් කසල බැහැර කරන ලද ස්ථාන හා සම්බන්ධ ව පරීක්ෂණයක් සිදු කර වාතර්ාවක් ඉදිරිපත් කරන්නට යෙදි ඇත. මෙම වාතර්ාව X3 හා X39B ලෙස පරීක්ෂණ සභාව ඉදිරියේ ඉදිරිපත් විය.

අදාල වාර්ථාවට අනුව රූප සටහන් යටතේ අදාල කසල බැහැර කිරීම් සිදු වන ප්‍රමාණය සහ එමඟන් ඇති වන අවදානම් සහගත තත්වයකට කරුණු යෙදී ඇති කලාපය නිෂ්චිතවම දක්වා ඇත. මෙම වාර්ථාව බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය වරයාගේ ප්‍රධානත්වයෙන් හා කොළඹ මහ නගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවධර්න අධිකාරිය හා ආයතනයන්හි නියෝජනයන් සහිතව බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවකදී පැහැදිලි කිරීම් සහිතව ඉදිරිපත් කර ඇත.

එම වාතර්ාව යටතේ අවදානම් තත්වය අවම කර ගැනීම සඳහා ගතයුතු නිදෙර්ශ ගණනාවක් ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත. කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ ප්‍රකාශනයෙන් එය පිළි ගන්නට යෙදී ඇත.

එසේ ම කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් තමන් වෙත වාතර්ා වූ කරුණු මත කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් 2017.04.07 දිනෙන් යුතුව මීතොටමුල්ල කසල බැහැර කරන ලද ප්‍රදේශය ආපදා අවදානමට කරුණු යෙදී ඇති බවට පහත සඳහන් ආයතන වෙතට ලිඛිතව දැනුම් දී ඇත.

- කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්
- ජාතික ගොනැගිලි පයෙර්ෂණ ආයතනය

ඒ අනුව බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් 2016/04/25 දින ඉදිරිපත් කරන වාතර්ාව මඟින් කොළඹ මහ නගර සභාවේ කොමසාරිස් ඇතුළු පරිපාලනයට මීතොටමුල්ල කසළ බැහැර කරන ස්ථානයේ ඇති වී ඇති හානි කර තත්ත්වය පිළිබඳ කරුණු විග්‍රහ කර පෙන්වා ඇත. ඊට අදාළ විසඳුම් යෝජනා කර ඇත. කොලොන්නාව ප්‍රාදේශීය

ලේකම් 2017/04/14 ආසන්න දිනෙක වන විට පැන නැගී ඇති අවධානම් තත්ත්වය 2014/04/07 දිනෙන් යුතු ව දැනුම් දී ඇත. ඉහත සඳහන් අවස්ථා නිශ්චිත ම ඊට වගකිව යුතු පාශර්වයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු අවස්ථා වශයෙන් සැලකිය යුතුය. එහෙත් ඊට අනුකූල ව දැනුම් දීම කරන ලද පාශර්වයන් හෝ දැනුම් දීම ලද පාශර්වය අනුගාමී ව ගත යුතු නිශ්චිත ක්‍රියාමාගර් ගෙන නොමැත. කොළඹ මහ නගර සභාව මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම අනෙකුත් ආයතන සම්බන්ධීකරණයකින් තොර ව සිදු වී ඇති අතර ඒ අනුව යම් පාශර්වයන් එම ස්ථානයෙන් ඉවත් වීමේ දී ඊට අදාළ මූල්‍යමය ප්‍රදානයන් වශයෙන් මුදල් ලබා දීම හැර ඒ සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාමාගර්යක් ගෙන නොමැත. ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් හඳුනා ගත් ආපදා තත්ත්වය මත, අදාළ පාශර්වයන් ලිපියකින් දැනුවත් කර තිබීම පමණක් සාථර්ක පියවරක් ලෙස සැලකිය නොහැක.

එබැවින් පරීක්ෂණ සභාව වෙත කරුණු විමශර්නය සඳහා පවරා ඇති ඉහතින් සඳහන් වූ පරමාථර්යන්ට අදාළ පරීක්ෂණ සභාවේ නිගමන පහත පරිදි වේ.

2017 අප්‍රේල් 25 දිනෙන් බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති වාතර්ාවෙහි සඳහන් නිදෙර්ශ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීමෙන් කොළඹ මහ නගර සභාව එහි පරිපාලනය වගකීම් පැහැර ඇති බව

2017 අප්‍රේල් 25 දින කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද අපදා තත්වය පිළිබඳ දැන්වීමට අනුව එම භූමි ප්‍රදේශය අවම පිරිස් ඉවත් කිරීම සඳහා කිසිම සම්බන්ධීකරණයකින් කටයුතු නොතිබීමක් කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සිය වගකීම පැහැර ඇති බව

කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් ආපදා තත්වයකට කරුණු යෙදී ඇති බවට 2017 අප්‍රේල් 07 දින හඳුනාගත් අවස්ථාවේ ඒ බව කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත හා ජාතික ගොඩනැගිලි පයෙර්ෂණ ආයතනය වෙත ලිඛිත දැනුම් දීම පමණක් සිදු කර ඒ අවස්ථාවේ ප්‍රදේශය භාර ප්‍රධාන පරිපාලන නිලධාරි වශයෙන් ගතයුතු ගත යුතු ක්‍රියාමාගර් මත ආපදාව නිශ්චිත හඳුනා ගැනීමට ක්‍රියාකරමින් විශේෂයෙන් ම ඒ අවට පිරිස් ස්ථිර ව හෝ තාවකාලික ස්ථානයක පදිංචි කරලීම සඳහා කඩිනමින් නොගෙනීමෙන් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් වගකිව යුතු ව ඇති බව

## 03. එසේ ම දැනුම් දීම ලැබී තිබේනම්, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ම අයටත් වීමට හේතු වූ කරුණු මොනවාද යන වග පරිසර සභාවේ නිගමනය ගෙන සඳහන් කරමි.

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය අධ්‍යක්ෂක වරායාගේ ප්‍රකාශන සහ එම අධිකාරියේ සහභාගිත්වයෙන් ප්‍රකාශයෙන් අවධාරණය කර ඇත්තේ කොළඹ මහ නගර සභාවට කටයුතු කිරීමේ දී බස්නාහිර පළාතේ 2007 අංක 01 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියට හා 2008 අංක 01 දරණ බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ රීතීන්ට අනුකූලව කටයුතු නොකළ බවයි. එසේ ම කොළඹ මහ නගර සභාව අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් තනිව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවයකින් ක්‍රියා කර ඇති බවට පරීක්ෂණ සභාව ඉදිරියේ වරින් වර කරුණු ඉදිරිපත් කර ඇත.

කොළඹ මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු එහි නාගරික ඉංජිනේරු දෙපාතර්මේන්තුව යටතේ අධ්‍යක්ෂක ඉංජිනේරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ඊට අනුබද්ධ

ඉංජිනේරුවරුන් යටතේ සිදු කර ඇත. එසේ ම කසළ බැහැර කරන ලද අංගනයට ඉංජිනේරුවරුන් දෙදෙනෙකු අනුයුක්ත කර ඇත.

කොළඹ මහ නගර සභාව විසින් අධිකරණ නියෝගයකට අනුව කසළ බැහැර කිරීම සඳහා අවසර ලබා ඇති ප්‍රදේශයක් වශයෙන් සලකා එම කරුණ මත අදාළ ප්‍රදේශයට කසළ බැහැර කිරීම නිසි ආකාරයෙන් සිදුවන්නේ ද යන්න අධීක්ෂණය කිරීම හා එසේ නොමැති නම් ඊට එරෙහිව පියවර ගැනීම ඊට අදාළ වගකිව යුතු කිසිදු ආයතනයක් ක්‍රියා කර නොමැත. ඒ නිසාම අදාළ ස්ථානය කොළඹ මහ නගර සභාව අදහස් කළ පරිදි එහි පරිපාලනය පවත්වාගෙන ගොස් ඇති අතර, අනිකුත් වගකිව යුතු ආයතන සිය නෛතික වගකීම ලිඛිත ව පෙන්වා දීම වැනි කරුණු වලට සීමා කර ඇත.

මෙම තත්ත්වය නිසා අතිශයින් ම අන්තරාකාරී අවදානම් සහගත තත්වයකට කරුණු යෙදී ඇති අවස්ථාවක ඊට අදාළව ප්‍රාදේශීය ලේකම් සිදු කර ඇති දැන්වීමට අනුව කොළඹ මහ නගර සභාව දන්වා ඇති ප්‍රතිචාරය, ඉවත් වන පිරිස් වලට මුදල් ගෙවා පදිංචි කරලීමයි.

2017/04/07 දිනය පැවති තත්ත්වය යටතේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කර දැන්වීමට අනුව කොළඹ මහ නගර සභාව වහාම ක්‍රියාත්මක වී නම් ප්‍රාදේශීය ලේකම්, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ගොඩනැගිලි පයෙර්ෂණ ආයතනය හා සියළු ම ආරක්ෂක අංශ සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මක වී නම් ඇති වූ ආපදාව අවම කර ගැනීමට හැකියාව තිබූ බව නිගමනය කිරීමට ප්‍රමාණවත් කරුණු ඇති බව නිරීක්ෂණය කරමි.

පරීක්ෂණ සභාව ඉදිරියේ ඉදිරිපත් වූ කරුණු අනුව නිසි ක්‍රියාමාගර් ගැනීම අසමත් වීම නිසා වශයෙන් පහත සඳහන් හේතු ප්‍රධාන වී ඇති බව පරීක්ෂණ සභාවේ නිගමනයයි.

අ.) අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධයෙන් මධ්‍ය පාලනයක් සිදු කිරීම සඳහා නිසි අධිකාරි බලයක් ඇති ආයතනක් ක්‍රියාත්මක නොවීම හේතු කොට ගෙන ඒ අධිකාරි බලය ඇති ආයතන සිය වගකිම සීමා කර ගනිමින් කටයුතු කිරීම.

ආ.) අදාළ රාජ්‍ය නිලධාරින්ගේ වගකීම් විරහිත ව ක්‍රියාත්මක වීම සහ නොසැලකිලිමත් භාවය .

ඇ.) කොළඹ මහ නගර සභාව මීතොටමුල්ල කසළ බැහැර කරලීමේ දී ඊට අදාළ වෙනත් අධිකාරින් වෙතින් පෙන්වා දී ඇති කරුණු නොසලකා ක්‍රියාත්මක වීම.

**04. යම් රාජ්‍ය/නියෝජිත ආයතනයක්, රාජ්‍ය නිලධාරීන්/පුද්ගලයින් මෙවැනි හානිකර හා අවදානම් තත්වයක් පිළිබඳව දැනුවත්ව තිබියදීත්, අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අප්‍රමාදව ක්‍රියා නොකිරීමෙන් සිය රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමට අසමත්ව තිබේද යන වග සහ එසේ නම් ඒ කවර රාජ්‍ය ආයතනයක/නියෝජිත ආයතනයක නිලධාරින්ද /පුද්ගලයින්ද යන වගත්,**

අදාළ ස්ථානය හානිකර තත්ත්වයක් උද්ගත වීම 2013 වෂර්ය වන විටත් ආරම්භ වී ඇත. ඒ අවස්ථාවන් යටතේ ඇතිවන හානිකර තත්ත්වයන් වෙනුවෙන් එය වලක්වාලීම සඳහා ප්‍රතිකමර් විය යුත්තේ අදාළ ස්ථානයට කසළ බැහැර කිරීම පාලනයකට යටත් කිරීම සහ නිසි ක්‍රමෝපායන් යටතේ එය සිදු කිරීමට සැලැස්වීමයි. ඒ සඳහා කොළඹ නගර සභාව කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් විකල්පයන් හඳුනාගැනීම සඳහා ගත් උත්සාහයන් පිළිබඳ පරීක්ෂණ සභාව ඉදිරියේ කරුණු ඉදිරිපත් වුනි.

ඉදිරිපත් වූ කරුණු අනුව කසළ මඟින් විදුලිය ජනනය සඳහා ව්‍යාපෘතියක් (Western Power) හඳුනා ගනිමින් එය ආරම්භ කිරීමට, උත්සාහ ගැනීම, සහ එම ස්ථානයේ ඒක රාශි වී ඇති කසළ පුත්තලම දිස්ත්‍රික්කයේ අරුක්කාල් නැමැති ප්‍රදේශයට රැගෙන යාම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම ආදී උත්සාහයක් යටතේ කොළඹ මහ නගර සභාව ක්‍රියාත්මක වී ඇත.

එසේ වුව ද පරීක්ෂණ සභාවේ පරමාථර් යටතේ යාම ප්‍රධාන අරමුණ 2017 අප්‍රේල් 14 දින හටගත් සිද්ධියට කරුණු යටතේ ඇතිකල බලපෑම අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ යම් රාජ්‍ය/සංස්ථා නිලධාරීන්ගේ රාජකාරි අසමත්භාවයක හේතු වී තිබේ ද යන්න සලකා බැලීමයි.

2017 අප්‍රේල් 14 දිනට ආසන්න වශයෙන් අදාළ ස්ථානයේ ආපදා තත්ත්වයට කරුණු යෙදමින් පවතින බව රාජ්‍ය නිලධාරියෙකු වශයෙන් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම්, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි සහ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති වරයාගෙන් වාතර්ා කිරීම තමන් විසින් කළ ස්ථාන පරීක්ෂණවකින් සෑහීමකට පත් වී ඇත. එසේ සෑහීමකට පත් වන දිනය 2017 අප්‍රේල් මස 07 දින. එදින සිට 2017 අප්‍රේල් මස 14 දක්වා දින 07 ක කාලයක් තුල එම පරිශ්‍රයට අදාළ ව ඇති විය හැකි ආපදාව හඳුනාගැනීම හා තාක්ෂණික ව ගත යුතු පිලියම් තීරණය කිරීම විද්‍යාත්මක ව සිදු කිරීමට හැකියාව පැවතුණි.

එබැවින් 2017 අප්‍රේල් මස 14 වන දිනට ආසන්න වශයෙන් මීතොටමුල්ල කසළ බැහර කරන ලද ස්ථානය අවට හටගත් තත්ත්වය පිළිබඳ ප්‍රදේශය භාර රජයේ ප්‍රධාන පරිපාලන නිලධාරි වන කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් ඒ හා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාගර් ප්‍රමාණවත් නොවන බව පරීක්ෂණ සභාවේ නිගමනයයි.

එසේම කොලොන්නාව ප්‍රාදේශීය ලේකම්ගේ දැනුම් දීමට අනුව හෝ වෙනත් ආකාරයන් යටතේ දැනුවත් වෙමින් කොළඹ මහ නගර සභාව, ඒ වන විට ක්‍රියාත්මක කර තිබූ එම ස්ථානයෙන් ඉවත් වන පදිංචි පවුල් ඒකකයක් සඳහා රුපියල් 1500000ක් ලබා දී, එම ස්ථානයෙන් ඉවත් වීමට අවස්ථාව සලසා දීම දක්වා වැඩ පිළිවෙළ ප්‍රමාණවත් ක්‍රියාමාගර්යක් නොවන බව පරීක්ෂණ සභාවේ නිගමනයයි.

මන් ද ආපදාවක් ඉදිරියේ ඉතිරි වන පිරිසක් ද සිටිමයි. එසේ ආපදාව තුල මිය ගිය අයගේ දේපළ ඉවත් විය යුතු දේපළ වශයෙන් පැවතුනා යන්න හඳුනා ගැනීමක් යන්න සිදු වී නොමැත. 2013 වෂර්යෙන් ආරම්භ වෙමින් අදාල ප්‍රදේශය පොළොවේ පිහිටීම වෙනස් වෙමින්, පවතින නිවාස කඩා වැටෙමින් පවතින තත්ත්වයක ඊට අදාල වන අවදානම් කලාපයක් නිශ්චිතව විද්‍යාත්මක හඳුනා ගැනීමක් කොළඹ මහ නගර සභාවට අදාළ සිද්ධියට පූවර්යෙන් සිදු කිරීමට අසමත් වී ඇත. එය පූවර්යෙන් සිදු කළ යුතු කරුණකි දිගින් දිගට ම ආසන්න කාලයක් තුළ ආපදාවන්ට නිවාස ලක් වෙමින් තිබෙන අවස්ථාවක විය හැකි තත්ත්වයන් හඳුනා ගැනීමට කොළඹ මහ නගර සභාව හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හෝ වෙනත් කවර හෝ අධිකාරියක් උත්සුක වී නොමැත.

මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් ප්‍රකාශයක් ලබා දෙන ලද එහි නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයා ප්‍රකාශ කර සිටියේ තම ආයතනයට ඒ සම්බන්ධයෙන් ඒ වන විටත් වාතර්‍ා වූ කරුණු අනුව එම ස්ථානයට ස්ථාන පරීක්ෂණයක් සිදු කිරීමට 2017 අප්‍රේල් මස 17 දිනය යොදා ගෙන ඇති බවයි.

එසේ ම ආපදා කළමනාකරණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශනයේ ප්‍රකාශිත ව පිළිගන්නේ තම ආයතනය මෙම ස්ථානයේ හටගෙන තිබූ ආපදා තත්ත්වය පිළිබඳ කිසිදු මැදිහත් වීමක් 2017.04.14 දිනට පූවර්යෙන් සිදු කර නොමැති බවයි.

එසේ නම් මෙම සියළු ම තත්ත්වයන් යටතේ වඩාත් තහවුරු වනුයේ වසර හතරකට ආසන්න කාලයක සිට මෙම කසළ බැහැර කරන ලද ස්ථානය අවට පැන නැගෙමින් තිබූ ආපදා තත්ත්වයන් හඳුනා ගැනීම ද ඊට අනුබද්ධ සියළු ම රාජ්‍ය ආයතයන්හි සම්බන්ධීකරණයෙන් සිදු වී නොමැති බවයි.

එවැනි සම්බන්ධිකරණයකින් අදාළ කායර්ය පවත්වා ගෙන යෑම නිසි වගකීමත්, ස්ථානයේ පරිපාලනය පවත්වා යනු ලැබූ කොළඹ මහ නගර සභාවට හා එහි පරිපාලනය පැවරි ඇත. එහෙත් ඊට අනුකූල ව සෑහීමට පත් විය හැකි කිසිදු ක්‍රියාමාගර්යක් කොළඹ මහ නගර සභාව සහ එහි නාගරික කොමසාරිස් ඇතුළු පරිපාලනය ගෙන නොමැති බව පරීක්ෂණ සභාවේ නිගමනයයි.

එසේම කොළඹ මහ නගර සභාව හා එහි පරිපාලනය මේ සම්බන්ධයෙන් එවැනි වූ අත්නොමතික ක්‍රියාමාගර්යක කටයුතු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කර ගත යුතු ක්‍රියාමාගර් සඳහා කටයුතු කිරීමට බස්නාහිර පළාතේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වගකිමත් එම අධිකාරිය සංස්ථාපනය කර ඇති බස්නාහිර පළාතේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රඥප්තිය (2008 අංක 01 දරණ) යටතේ පවතී.

එහෙත් එම පරමාථර්යට අනුකූල ව එම අධිකාරියන්හි ක්‍රියාත්මක වීම මා සම්බන්ධයෙන් ප්‍රමාණවත් යැයි නිගමනය කළ නොහැක.

කොලොන්නාව නගර සභාව මෙම කසළ බැහැර කරන ලද ස්ථානය අයතු ලාභයක් ලබා ගැනීම සඳහා භාවිතා කර ඇත. එහෙත් තම බල ප්‍රදේශයෙහි අවදානම් සහගත වියසනකාරි ලෙස කසළ බැහැර කිරිම සිදු වන ස්ථානය, කොලොන්නාව නගර සභාව සහ එහි යම් ධූරධාරීන් විසින් තවදුරටත් විවිධ බාහිර පාශර්වයන්ට අදාළ ස්ථානයට කසළ බැහැර කිරීමට අවස්ථාව සලසා දෙමින් පවති සක්‍රීය ආදායම් උපයා ගෙන ඇත. එහෙත් තම නගර සභා බල ප්‍රදේශය ඇතුළත මෙවන් ප්‍රදේශයේ ආපදා තත්ත්වය වලක්වාලීම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාගර් උදෙසා කිසිදු සන්නිවේදනයක් ලිඛිත ව පවත්වා ගෙන ගොස් නොමැත. ඒ

වෙනුවට වඩ වඩාත් බාහිර පාශර්වයන් වෙත ද කුණු බැහැර කිරීමේ අවස්ථාව සලසා දීම පමණක් සිදු කර ඇත. ඒබැවින් කොලොන්නාව නගර සභාව තම බල ප්‍රදේශයට අදාළ කසළ බැහැර කරන ලද ප්‍රදේශය වෙනුවෙන් නගර සභා ආඥා පනතේ සිය නෛතික වගකීම බැහැර කර ඇත.

ඒ අනුව පහත සඳහන් රාජ්‍ය නිලධාරීන් 2017/04/14 ආපදා තත්වයන් පිළිබඳ දැනුවත් වූ කරුණු අනුව අවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාගර් ගැනීමට සාථර්ක ව ගැනීමට අසමත් වීමෙන් ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ රාජකාරිය වගකීම් පැහැර හැරීමක් සිදු වී ඇති බව නිගමනය කරමි.

අ.) කොළඹ නගර සභාවේ නාගරික කොමසාරිස් වි. කේ. ඒ අනුර මහතා
ආ.) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් සුගත් සිසිර කුමාර මහතා.

එසේ ඒ හා සම්බන්ධයෙන් සමස්ථයක් වශයෙන් පහත සඳහන් රාජ්‍ය/ ව්‍යවස්ථාපිත ආයතන මීතොටමුල්ල කසළ බැහැර කරන ලද ස්ථානය පවත්වා ගෙන යෑමේ දී නිසි නියාමනයකට ලක් නොකිරීමෙන් එක්ව වෙන් වෙන් ව සිය ව්‍යවස්ථාපිත ආයතන පැහැර ඇති බව නිගමනය කරමි.

අ.) කොළඹ මහ නගර සභාව
ආ.) කොලොන්නාව නගර සභාව
ඇ.) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
ඈ.) බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය
ඉ.) මධ්‍යම පරිසර අධිකාරිය

**05. යම් බාහිර දැනුම්දීම් වලින් තොරව වුවද, දීර්ඝ කාලයක් තිස්සේ එක් ස්ථානයක කසළ ගොඩගැසීම තුළින් මෙවැනි අන්දමේ ජන ජීවිතයට හානි කර තත්වයක් පැන නැගීමේ හැකියාවක් ඇති බවට ශ්‍රී ලංකාවේ අදාල විෂය සම්බන්ධ රාජ්‍ය ආයතන හා වෙනත් වගකිව යුතු අධිකාරීන් දැනුවත් වී සිටිය යුතු බවට නිගමනයකට එළඹීම යුක්ති සහගත හා සාධාරණද යන වගත්,**

අදාළ ස්ථානයට කොළඹ මහ නගර සභාව කසළ බැහැර කරලීම සඳහා 2009 වෂර්යේ දී පමණ ආරම්භ කර ඇත. ඊට පෙර කොලොන්නාව නගර සභාව විසින් මෙම ස්ථානයට කසළ බැහැර කිරීමක් සිදු කර ඇත. නාගරික සංවධර්න අධිකාරියට අයත් භූමි ප්‍රදේශයක් වශයෙන් එම අධිකාරිය අක්කර 18 කා ආසන්න භූමි ප්‍රමාණයක් මේ සඳහා ලබා දී ඇත.

දිනකට කොළඹ මහ නගර සභාව විසින් පමණක් මෙම ස්ථානයට ටොන් අටසිය පනහකට ආසන්න කසළ ප්‍රමාණයක් බැහැර කර ඇත. එසේ ම අනියම් අයුරින් විවිධ පරිබාහිර ආයතන හා ආරක්ෂක අංශ විසින් ද, කොලොන්නාව නගර සභාව විසින් ද මෙම ස්ථානයට කසළ බැහැර කරලීම් සිදු කර ඇත. අදාළ ස්ථානය කළමනාකරණ කටයුතු කොළඹ මහ නගර සභාව පවත්වාගෙන ගොස් ඇති අතර ඒ සඳහා ඉංජිනේරුවරුන් දෙදෙනකු යටතේ නිරීක්ෂකවරුන් දෙදෙනෙක් සහ කම්කරු කායර් මණ්ඩලයක් ක්‍රියාත්මක වී ඇත. මෙම සියළු

ම කරුණු අධීක්ෂණය කොළඹ මහ නගර සභාවේ අධ්‍යක්ෂ ඉංජිනේරු (අපද්‍රව්‍ය කළමනාකරණ) යටතේ සිදු කර ඇත.

2009 වෂර්යේ අක්කර දෙකක භූමි ප්‍රමාණයක් වෙනුවෙන් කසළ බැහැර කිරීම සිදු වුවද 2017 වෂර්ය වන විට එය අක්කර 18 ප්‍රමාණයකට පැතිර ගොස් ඇති අතර උසින් අඩි 150කට ප්‍රමාණයකට ආසන්න වශයෙන් පැවති ඇත.

2013 වෂර්යේ පටන් මෙම ස්ථානයේ ආපදා තත්වයන් හටගෙන ඇති අතර, ඒ නිසා සිවිල් සංවිධාන විසින් කසළ බැහැර කරලීමට එරෙහිව උද්ඝෝෂණ ද ආරම්භ කර ඇත.

වරින් වර සිදු වන කසළ කන්ද කඩා වැටීම, නිවාස විනාශ වීම සෞඛ්‍ය වශයෙන් සිදු වන හානි කර තත්වයන් 2013 වෂර්යේ පටන් වධර්නය වී ඇත, එවැනි අවස්ථාවන් යටතේ එසේ ම හානියට පත් වූ පාශර්වයන්ට විකල්ප ලබා දීමට කොළඹ මහ නගර සභාව කටයුතු කර ඇති අතර ඒ සඳහා කොළඹ මහ නගර සභා අරමුදලින් විශාල පිරිවැයක් ද දරා ඇත. එසේ වන්දි ගෙවීම හා නිවාස ලබා දීම වෙනුවෙන් දරා ඇති පිරිවැයේ වටිනාකම රුපියල් 606,814,020.70 ක ආසන්න වෙයි.

2013 වෂර්යේ නිශ්චිත ව ම ආරම්භ වන ආපදාවක් දිගින් දිගට ම වධර්නය වීමත් සිදුවීමේදී එය උපරිමයකට ලඟා වන බව එහි පරිපාලනය විසින් වටහා ගත යුතු ව ඇත. එසේ ම මෙම කසළ බැහැර කරලීම නිසි හා යෝග්‍ය තත්වයක නොවන බව වටහා දීමට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයෙක්ගේ ප්‍රධානත්වයෙන් පාශර්වයන් කැඳවා සාකච්ඡාවක් පවත්වා බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමාකරණ අධිකාරිය විසින් හඳුනාගත් අඩුපාඩු හා පිළියම් කොළඹ මහ නගර සභාව වෙත 2017 ජුනි 13 දිනැති වාතර්ාව මඟින් ලබා දී ඇත.

එසේ ම සිවිල් සංවිධානයන්හි පාරිසරික සංවිධානයන්හි විරෝධතා මෙන් ම ප්‍රදේශයේ දේශපාලයන අධිකාරි විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව යටතේ ඉදිරිපත් වී කර ඇති කරුණු සියල්ල මෙහිලා සැලකිය යුතු ව ඇත. 2017 අප්‍රේල් 14 දින ආසන්න වන විට අමාත්‍ය මණ්ඩලය විසින් ද මෙම ස්ථානයට කසළ බැහැර කිරීම නතර කල යුතු බවට නිරීක්ෂණයක් ගන්නට යෙදී ඇත්තේ ද එම ස්ථානය හානි කර තත්ත්වයක පත් ව ඇත්තේ ය යන කරුණු මතය.

මෙලෙස දිගින් දිගට ම සිදු වන ආපදාවක් යටතේ වියහැකි උපරිම තත්ත්වය හඳුනා ගැනීමේ වගකීමලත් ආයතන ඒ සම්බන්ධ කිසියම් සාධාරණ වූ යුක්ති සහගත වූත් ක්‍රියාමාගර් ගත් බවට කරුණු නොමැත.

එබැවින් අදාළ ස්ථානයට දිගින් දිගිට ම කසළ එක් රැස් කිරීමෙන් එය අවට පදිංචි අයවලුන්ට මෙන් ම සමාජයට හානි කර තත්ත්වයකට කරුණු යෙදෙන බවට 2013 වෂර්ය වන විට සාධක මතුව ඇත. ඊට පූවර්යෙන් කෙසේ වෙතත් 2013 වෂර්යේ සිට ඉදිරි කාල සීමාවන් තුළ විශේෂයෙන් කොළඹ වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරයකට ආසන්නයේ, ඒ හා සම්බන්ධිත සියළු ම රාජ්‍ය ආයතනයන්ට ඉතා ආසන්න ප්‍රදේශයක සිදුවන එම හානි කර තත්ත්වය ඊට අදාළ විෂය හා සම්බන්ධ රාජ්‍ය ආයතන නොදැන ක්‍රියාත්මක වූවාය යන්න කිසිසේත් සැළකිය නොහැක.

කිසියම් පාශර්වයන් ඊට අදාළ ව ලිඛිතව වාතර්ා නොකලා වුවද සිය ව්‍යවස්ථාපිත වගකීම යටතේ අදාළ ආයතන ඊට මැදිහත් ව සිය වගකීම ඉටු කළ යුතුය. විශේෂයෙන් මෙම ස්ථානයට කසළ බැහැර කරලීමේ කටයුතු හේතුවෙන් පරිසරයට ඇති කරන බලපෑම හඳුනා ගැනීම මධ්‍යම පරිසර අධිකාරියේ නෛතික වගකීමකි. එසේ ම ආපදා තත්ත්වයකට කරුණු

යෙදෙන අවස්ථාවක එය උපරිම වශයෙන් හඳුනා ගැනීම ප්‍රතිකමර් යෙදීම හා යෝජනා ඉදිරිපත් කිරීම ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නෛතික වගකීමකි.

